# නිර්මාංශ ත්‍රස්තය



බුද්ධිමතුන්ට විසඳා ගැනීම පිණිසයි.

පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

# නිර්මාංශ ප්‍රශ්නය

## (බුද්ධිමතුන්ට විසඳා ගැනීම පිණිසයි)

පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ

**අන්තර්ජාල සංස්කරණය**
ශ්‍රී බුද්ධ වර්ෂ 2552/ ව්‍යවහාරික වර්ෂ 2009
(www.mahamevna.org)

**අන්තර්ජාල සංස්කරණය සැකසුම:**
**මහමෙව්නාව භාවනා අසපුව,**
යටිගල්ඔලුව, වඩුවාව, පොල්ගහවෙල.

## නිර්මාංශ ප්‍රශ්නය

පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ

ප්‍රථම මුද්‍රණය : ශ්‍රී බු.ව. 2552 ක් වූ වෙසක් මස

© සියලුම හිමිකම් ඇවිරිණි.

ISBN : 978-955-5515-67-2

පරිගණක අකුරු සැකසුම
පිටකවර නිර්මාණය : මහමෙව්නාව භාවනා අසපුව
වඩුවාව, පොල්ගහවෙල.
දුර/ෆැක්ස් : 037 2244602
*info@mahamevna.org,*

ප්‍රකාශනය : දයාවංශ ජයකොඩි සහ සමාගම,
අංක 111 සහ 112,
පූජ්‍ය එස්. මහින්ද හිමි මාවත,
මරදාන, කොළඹ 10.
දුර/ෆැක්ස් : 011 2695773, 2696653

# නිර්මාංශ ප්‍රශ්නය

## (බුද්ධිමතුන්ට විසඳා ගැනීම පිණිසයි)

පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ

www.mahamevna.org info@mahamevna.org

"දසබලසේලප්පභවා නිබ්බානමහාසමුද්දපරියන්තා
අට්ඨංග මග්ගසලිලා ජිනවචනනදී චිරං වහතූති"

දසබලයන් වහන්සේ නමැති ශෛලමය පර්වතයෙන් පැන නැගී
අමා මහා නිවන නම් වූ මහා සාගරය අවසන් කොට ඇති
ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් වූ සිහිල් දිය දහරින් හෙබි
උතුම් ශ්‍රී මුඛ බුද්ධ වචන ගංගාව
(ලෝ සතුන්ගේ සසර දුක නිවාලමින්)
බොහෝ කල් ගලාබස්නා සේක්වා!

*(සළායතන සංයුත්තය - උද්දාන ගාථා)*

නිගමනයකට පැමිණීමට පෙර
අවසානය දක්වා කියවන්න.

# පිදුම

නිර්මාංශ වීම විමුක්ති මාර්ගයේ අනිවාර්යය අංගයක් යයි අදහා ගෙන එයම දැඩි ලෙස වැළඳගෙන සිටි නිගණ්ඨයන්ගෙන් පිරුණු භාරතීය සමාජයෙන් එල්ල වූ සියලු නින්දා අපහාස අභියස ඉතාමත් අභීතව තම ශ්‍රාවක ජනතාව ධර්මය තුළින් නගා සිටුවීමේ කාර්ය භාරය අතිශයින්ම සාර්ථක ලෙස සම්පූර්ණ කොට වදාළ මාගේ ශාස්තෘ වූ ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පා කමල් අභියස මෙය වනපස මලක් වේවා!

# පෙරවදන

**හැම දෙනාට ම තෙරුවන් සරණයි!**

වර්තමානයේ බෞද්ධ යැයි කියා ගන්නා මේ සමාජයෙහි බොහෝ ගිහි පැවිදි පින්වතුන් ගේ සාමාන්‍ය ස්වභාවය නම් ඕනෑම දෙයක් පිළිබඳව නො විමසා අවිචාරවත්ව නිගමනයන්ට බැසගැනීම යි. එසේ බැසගත් අවිද්‍යා සහගත මතවල පැටලී අනුන්ට ගැරහීමෙන් ඔවුහු අමුතු ම අස්වාභාවික තෘප්තියක් ලබති.

එනිසාම බොහෝ දෙනෙකුට නිදහස් චින්තනයක් නැත. මධ්‍යස්ථව කරුණු විමසා බැලීමක් ද නැත. එසේ විමසා බැලීමේ හැකියාවක් ද නැත. බොහෝ දූනමුතුකමින් යුතු යැයි සිතාගෙන සිටිනා ඔවුන් තුළ තිබෙන්නේ නො දැනීම ම බව ඔවුන්ට නො පෙනෙන්නේ අවිද්‍යාව නිසා ම ය. සුළු කරුණකිනුත් විවිධ අදහස් වැළඳ ගෙන එහි ම තරව වැදී සිටිමින් තම මතවාද හුවාදැක්වීම ඔවුන් තුළ දක්නට ලැබෙන සාමාන්‍ය ලක්ෂණය යි.

එම ලක්ෂණය ගැලපෙන්නේ බෞද්ධයන්ට නොවේ. අන්‍යාගමිකයන්ට යි. විචාරාත්මක අධ්‍යයනයකින් තොරව හුදු විශ්වාසය ම ඒකායන මාර්ගය කරගත් අන්‍යාගමිකයින් කොපමණ දෘෂ්ටිගතව සිටිට ද ඔවුනට ඒ බව යාන්තමින් වත් නො වැටහීම පිළිබඳ ඔවුහු නො දනිති.

එහෙත් බෞද්ධ අප එසේ නො විය යුතුය. ඕනෑම විවාදාත්මක කරුණක් පිළිබඳව එකඑල්ලේ නිගමන වලට බැස ගෙන දෘෂ්ටිගත වීම වෙනුවට මධ්‍යස්ථව විචාරාත්මකව අධ්‍යයනය කොට නිගමනයන්ට පැමිණීමේ හැකියාව බෞද්ධ අපට තිබිය යුතු නො වේද?

මෙම ග්‍රන්ථයෙහි ද සාකච්ඡා වන්නේ එබඳු විවාදාත්මක කරුණකි. බොහෝ කලක් මුලුල්ලෙහි බෞද්ධ ජනතාව මෙම ප්‍රශ්නය හේතු කොට ගෙන විවිධාකාර මතභේද ඇති කර ගෙන ඔවුනොවුන් හට අවලාද නගමින් පිල් බෙදී සිටිති.

මහායානය නම් වූ අධර්මයෙහි පවා මෙම කරුණ පිළිබඳව සූත්‍ර රචනා කරමින් පක්ෂග්‍රාහී විවරණ දී තිබේ. විශේෂයෙන් ම මෑත කාලීන ලාංකික සමාජය මෙම මතය ගැන විවිධ දේ පවසන්නට පටන් ගෙන තිබෙන්නේ කරුණු කාරණා මධ්‍යස්ථව විමසා බැලීමෙන් තොරව කල්පනා කිරීම නිසා ය. මෙම විවාදාත්මක කරුණ වනාහී අන් කිසිවක් නොවේ. **"බෞද්ධයන් අනුභව කළ යුත්තේ නිර්මාංශ ආහාර පමණි. එසේ නො වුන හොත් ඔවුන්ගේ සිල් බිඳී යන්නේ ය. ඔවුන් හට බෞද්ධ යැයි කිව නො හැක්කේ ය"** යන්න යි.

ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපේක්ෂාවෙන් සිටින කෙනෙක් මෙම කරුණෙහි ඇත්ත නැත්ත ගැන පහදා දීමට බිය වේ. එසේ බිය වන්නේ ඉතාමත් ම පටු ආකල්පයන්ට පැමිණ සිටින නිර්මාංශභක්ෂික ඇතැම් ගිහි පැවිදි පිරිස් වචන නැමැති අඩියටි අමෝරා ගෙන ඒ නිදහස් මතධාරීයාට පහර පිට පහර දීමට දයානුකම්පා විරහිතව සැදී පැහැදී සිටීම යි. ඔවුන් සමාජය ඉදිරියේ පෙනී

සිටින්නේ කරුණා මෛත්‍රියෙන් පිරුණු සළුපිළි පොරවා ගත් මහා ධර්මදූතයින් පරිද්දෙනි. නිර්මාංශ වීම සීලයක් ලෙස ම හුවා දක්වමින් අනුන්ට ගැරහීමේ දී ඔවුන් තුළ ලැජ්ජා බිය මාත්‍රයක් වත් නැත. එය මෙම සමාජයේ දක්නට ලැබෙන සාමාන්‍ය ලක්ෂණයකි. එනිසා ම සත්‍යය මතු කොට කතා කිරීමට බොහෝ දෙනෙක් බිය වෙති.

එහෙත් මවිසින් සියලු දෙනා ගේ යහපත පිණිස ඉතා ම මධ්‍යස්ථව මෙකරුණ ගැන සාකච්ඡා කරන ලදී. බුද්ධිමත් කෙනෙකුට මෙය කියවා බලා සාධාරණ නිගමනයනට පැමිණිය හැකි ය. හුදෙක් තර්කය ම අවිය කොට නො ගෙන ධර්මය තුළින් විමසා බලන හැටි ඉගෙන ගත හැකි ය.

ඇතැම් සැදැහැවතුන් තුළ ධර්මය කෙරෙහි චිත්තප්‍රසාදය ඇති වන අවස්ථා තිබේ. එවිට ඔවුහු ප්‍රායෝගිකව ධර්මයෙහි හැසිරෙන්නට කැමැති වෙති. එයට අදාල යමක් සොයන්නට පටන් ගනිති. එකල්හි ඔවුන්ට එක සැණින් ම මතක් වන්නේ "ඔව්!.... මා නිර්මාංශ ආහාර අනුභව කරන කෙනෙක් වීමෙන් මේ ධර්ම මාර්ගය පටන් ගන්නවා!" යන අදහස යි. එය වනාහි ඔවුන් තුළ ඇතිවන ඉතාමත් මානුෂික වූත් සාධාරණ වූත් ආකල්පයකි. නමුත් බොහෝ විට සිදුවන්නේ එපමණකින් ම ඔවුන් සෑහීමකට පත්වීම යි. ඉන් පසු නිර්මාංශ ආහාර අනුභවය මිස ධර්මය පිළිබඳව ගැඹුරින් හැදෑරීමක් ඔවුන් තුළ දක්නට නො ලැබේ.

මෙය සානුකම්පික තත්වයක් නො වේද? සියලු ම බුදුරජාණන් වහන්සේලා විසින් එක ම අයුරින් දේශනා කොට වදාරණු ලබන පිවිතුරු ශ්‍රී සද්ධර්මය තරමක් දුරට හෝ අර්ථ වශයෙන් අවබෝධ කර ගන්නට ලැබේ නම් එය කෙනෙකුට ලැබෙන කොතරම් භාග්‍යයක් ද?

බුදුරජාණන් වහන්සේ නමක් විසින් මනුෂ්‍ය වර්ගයා හට දායාද කරනු ලබන්නේ උන්වහන්සේ ගේ අසිරිමත් ප්‍රඥා නිධානය වන චතුරාර්ය සත්‍යය ධර්මය යි. ගුරූපදේශ නොමැතිව අවබෝධ කරගනු ලබන එම ධර්මය වනාහී සත්වයා පෘථග්ජනභාවයෙන් එතෙර කරවයි. සතර අපායෙන් මුදවයි. සසර ගමන කෙටි කරවයි. දෙව් මිනිස් සුගතියෙහි උපත ලබාදෙයි. අමා මහ නිවනට පමුණුවයි.

මේ සා පරම සුන්දර වූ ධර්මයක් අභියස ආහාර අනුභවය පිළිබඳව මතිමතාන්තර සමූහයක් හුවාදක්වමින් එය බෞද්ධ සමාජයේ මූලික අර්බුදයක් බවට පත් කර ගැනීම මොනතරම් අවාසනාවක් ද? බොළඳ ප්‍රශ්න අභියස චතුරාර්ය සත්‍යය ධර්මය හැල්ලුවට පත් වීම බුදු සසුනේ දියුණුව කැමැති කෙනෙක් තුළ මහත් සංවේගයක් ඇතිකරවයි.

මතවාදවල සිරවී එයින් ම ගෞරවය අපේක්ෂා කරන හිස් මිනිසුන් ගෙන් ඕනෑම නින්දා අපහාසයක් අසන්නට ලැබුනොත් හිත හදාගෙන එය ඉවසා ගැනීමේ අදහසින් ම ය මේ කටයුත්තට මා අත ගැසුවේ.

ධර්මය දකින්නට තිබෙන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය ප්‍රගුණ කිරීමෙන් මිස වෙන ක්‍රමයකින් නො වන බව ධර්මය දන්නා සියලු දෙනා දනිති. එය සක්සුදක් සේ පැහැදිළි කරුණකි. එවන් පැහැදිලි මගක් බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා දී තිබිය දී වෙන මතිමතාන්තර තුළින් ඒ මාර්ගය විකෘති වීමට ඉඩ දී බලා සිටීම ශාසනකාමී බෞද්ධයන් ගේ යුතුකමක් නොවේ.

මා මේ පොත ලියන්නේ මාංශභක්ෂකයින් බිහිකිරීමට

නොවේ. නිර්මාංශී උදවියට ගැරහීමට ද නොවේ. නිර්මාංශී වීම හෝ නො වීම තුළ වාද විවාද හටගැනීම වළක්වාලීම පිණිස ය. ආර්ය අෂ්ටාංගික මාර්ගය දියුණු කරගැනීමට අනුබල දීම පිණිස ය. සමඟිය ඇතිවීම පිණිස ය. වාද විවාද නො කරමින් හැබෑම කරුණා මෛත්‍රියෙන් යුතුව ගෞතම ශාසනයෙහි පිළිවෙත් පිරීම පිණිස ය. එනිසා මේ පොත කියවීමෙන් නිර්මාංශ ආහාර පිළිබඳව කෙනෙකු ගේ අවබෝධය නිවැරදි වේ නම් පොත ලිවීමේ උත්සාහයට එය ම සෑහේ.

මේ සඳහා මා හට නිරන්තරයෙන් උපකාරීව සිටින අප කල්‍යාණ මිත්‍ර දයාවංශ ජයකොඩි මහතාත්, එම කාර්ය මණ්ඩලයත් ලබා දෙන සහයෝගය වෙනුවෙන් මම පින් පවරමි. සියලු දෙනා හට ම මේ ගෞතම බුදුසසුනේ චතුරාර්ය සත්‍යය ධර්මය තම තම නැණ පමණින් පසක් කර ගැනීමේ භාග්‍යය උදා වේවා !

**කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි**

මෙයට,
ගෞතම බුදු සසුන තුළ මෙත් සිතින්,
**පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ**
ශ්‍රී බුද්ධ වර්ෂ 2551 ක් වූ බක් මස 22 දා

**මහමෙව්නාව භාවනා අසපුව**
වඩුවාව, යටිගල්ඔළුව,
පොල්ගහවෙල.
දුර/ෆැක්ස් : 037 2244602
ඊ මේල් : *info@mahamevna.org*

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !**

1. ප්‍රශ්නය :

**ඔබ වහන්සේ ද සම්පූර්ණයෙන් ම මස් මාංශ අනුභවයෙන් වැළකී නිර්මාංශව ශුද්ධ ශාඛාහාරීව සිටි අවදියක් තිබුණ බව අප අසා තිබේ. එය සත්‍යයක් ද?**

1. පිළිතුර :

එසේ ය. එය සත්‍යයකි. එකල මා නිර්මාංශීව ශුද්ධ ශාඛාහාරීව සිටියා පමණක් නොවේ, ඒ ගැන මහත් ගර්වයකින් යුතුව පුන පුනා වර්ණනා කළ කෙනෙක්මි. එමෙන් ම අන් අයව ද නිර්මාංශ ආහාර භක්ෂණය පිණිස පොරොන්දු කරවා ගත් කෙනෙක්මි. එමෙන් ම මස් මාළු අනුභව කරන අය දුටුවිට එය මම නො රිස්සූ කෙනෙක්මි. එය බලවත් ලෙස පිළිකුලට ලක් කළෙමි. මස් මාංශ අනුභව කරන අය මා දුටුවේ මහා නො දියුණු පිරිසක් හැටියට ය. එනිසා ම මම නිර්මාංශී ආහාර අනුභවය කිරීම පිළිබඳව මහත් සේ උදම් අනමින් සිටියෙමි.

2. ප්‍රශ්නය :

**ඉතින් එබඳු උදාරතර වැඩපිළිවෙලක් දැන් ඔබ වහන්සේ අනුගමනය නො කරන්නේ මක් නිසා ද?**

2. පිළිතුර

පින්වත, නිර්මාංශ ආහාරයේ යෙදීම ජීවිතයකට අතිශයින් ම අදාල උත්තම වූ වැඩ පිළිවෙලක් වශයෙන්

එකල මා දුටුවේ මගේ ම අඩුපාඩුවක් නිසා ය. එනම් බුදුරජාණන් වහන්සේ වදාළ චතුරාර්ය සත්‍යය ප්‍රකාශිත ශ්‍රී සද්ධර්මය හරියට ම කුමක් දැයි නිවැරදි ලෙස තේරුම් ගෙන නො සිටි නිසා ය.

එනිසා ම පිරිසිදු ජීවිතය පිළිබඳ මාගේ ප්‍රායෝගික සංකේතය වූයේ නිර්මාංශ ආහාර අනුභවය යි. සමහර අවස්ථාවල දී එය මට අභරණයක් විය. ඇතැම් අවස්ථාවල දී එය මට තියුණු ආයුධයක් විය. මහත් අභිමානයකින් යුතුව නිර්මාංශ ආහාර අනුභවය ගැන අගය කරමින් තමා උසස් කොට අනුන් හෙලා දකිමින් ගර්හා කළ අවස්ථා ද නො තිබුණා නොවේ. එය එකල මා හට ධර්ම ඥානය නො තිබීමෙන් සිදු වූ දෝෂයකි.

3. ප්‍රශ්නය :

**අහෝ! ඒ කියන්නේ දැන් ඔබ වහන්සේ වක්‍රාකාරව හෝ ප්‍රාණඝාතයට සම්බන්ධව සිටිනා බව නොවේ ද?**

3. පිළිතුර :

අන්න!... ඔබ කලබල වුනා නේද? එකල මා ශ්‍රී සද්ධර්මය නො දැන සිටි කාලයේ දරා ගත් මතයේ තමා දැන් ඔබ සිටින්නේ. ප්‍රාණඝාතය පිළිබඳව ශ්‍රී සද්ධර්මයෙහි තිබෙන අර්ථ කිසිවක් ඔබ නො දන්නා හැඩ යි.

4. ප්‍රශ්නය :

**ප්‍රාණඝාතය පිළිබඳව ශ්‍රී සද්ධර්මයෙහි තිබෙන අර්ථය කුමක් ද?**

4. පිළිතුර :

පින්වත, බුදුරජාණන් වහන්සේ තරම් සීලය පිළිබඳව

දන්නා කෙනෙක් ලොව වෙන නැති බව අප තේරුම් ගෙන සිටීම වැදගත් ය. උන්වහන්සේ දන්නේ සීලය පිළිබඳව පමණක් නොවේ. සමාධිය පිළිබඳව ද දන්නා සේක. ප්‍රඥාව පිළිබඳව ද දන්නා සේක. විමුක්තිය පිළිබඳව ද දන්නා සේක. විමුක්ති ඤාණ දර්ශනය පිළිබඳව ද දන්නා සේක.

ප්‍රාණඝාතය යනු කුමක්දැයි බුදුරජාණන් වහන්සේ විසින් අර්ථ විස්තර කොට වදාරණ ලද්දේ මේ අයුරිනි.

"**(ඉධ මාණව, ඒකච්චෝ ඉත්ථී වා පුරිසෝ වා පාණාතිපාතී හෝති, ලුද්දෝ, ලෝහිතපාණී, හතපහතේ, නිවිට්ඨෝ, අදයාපන්නෝ සබ්බපාණභූතේසු)** පින්වත් මාණවකය, මෙහිලා ස්ත්‍රියක් වේවා, පුරුෂයෙක් වේවා, සතුන් මැරීමෙහි යුක්ත වෙයි. රෞද්‍ර වෙයි. ලේ වැකුණු අත් ඇත්තේ වෙයි. සතුන් වැනසීමෙහි යෙදුණේ වෙයි. සත්ව ඝාතනයට පැමිණියේ වෙයි. සියළු ප්‍රාණභූතයින් කෙරෙහි දයාරහිත වූයේ වෙයි."

බුදුරජාණන් වහන්සේ මෙහිලා 'ස්ත්‍රියක් වේවා, පුරුෂයෙක් වේවා මස් මාංශ අනුභවයෙන් යුක්ත වූයේ වෙයි' කියා ප්‍රාණඝාතය නො තෝරන සේක.

5. ප්‍රශ්නය :

**අහෝ! මෙය මට නො තේරේ. එසේ නම් ප්‍රාණඝාතයෙන් වැළකීමේ ශික්ෂා පදය බුදුරජාණන් වහන්සේ විග්‍රහ කොට තිබෙන්නේ කෙසේද?**

5. පිළිතුර :

පින්වත, ඔබ ත් මා ත් සරණ ගිය ඒ භාග්‍යවත්

අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් මෙම ප්‍රාණඝාතයෙන් වැළකීමේ ශික්ෂා පදය අර්ථ වශයෙන් විග්‍රහ කොට පෙන්වා වදාරන ලද්දේ මේ ආකාරයෙන් ය.

"පින්වත් මහාරාජ, භික්ෂුවක් ශීලයකින් සමන්විත වන්නේ කෙසේ ද?

**(ඉධ මහාරාජ, භික්ඛු පාණාතිපාතං පහාය, පාණාතිපාතා පටිවිරතෝ හෝති. නිහිත දණ්ඩෝ නිහිත සත්ථෝ ලජ්ජී දයාපන්නෝ සබ්බපාණභූත හිතානුකම්පී විහරති. ඉදම්පිස්ස හෝති සීලස්මිං.)** පින්වත් මහාරාජ, මෙකරුණෙහි ලා භික්ෂුව ප්‍රාණීන් නැසීම අතහැර දමා, ප්‍රාණීන් නැසීමෙන් වැළකී සිටින්නේ වෙයි. (ප්‍රාණීන් නැසීම පිණිස ගන්නා) දඬු මුගුරු බැහැර දමුවේ වෙයි, (ප්‍රාණීන් නැසීම පිණිස ගන්නා) අවි ආයුධ බැහැර දමුවේ වෙයි. (ප්‍රාණීන් නැසීමට) ලැජ්ජා ඇත්තේ වෙයි. ප්‍රාණීන් කෙරෙහි දයාවෙන් යුක්ත වූයේ වෙයි. සියළු ප්‍රාණභූතයින් කෙරෙහි හිතානුකම්පාවෙන් යුතුව වාසය කරන්නේ වෙයි. මෙය ද භික්ෂුව ගේ එක්තරා සිල්වත් බවකි."

*(දීඝ නිකාය - සාමඤ්ඤඵල සූත්‍රය)*

6. ප්‍රශ්නය :

**බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රාණඝාතයෙන් වැළකීම පිළිබඳව ඔය ආකාරයෙන් පැහැදිලිව අර්ථ විග්‍රහ කොට තිබිය දී ඔබ වහන්සේ පවසන්නේ කෙනෙකු මස් මාළු අනුභව කළ පමණින් ප්‍රාණඝාතයට හසු නො වන බව ද?**

6. පිළිතුර :

පින්වත, කලබල නොවී නුවණින් තේරුම් ගන්න.

ඉවසීමෙන් යුතුව කල්පනා කරන්න. දැන් ඔබ ඉගෙන ගත්තේ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රාණඝාතයෙන් වැළකී සිටීමේ ශික්ෂා පදය අර්ථ වශයෙන් විග්‍රහ කොට වදාළ ආකාරය යි. ඉතින් එහි තිබෙනවා ද "භික්ෂුව, මස් මාලු අනුභවයෙන් වැළකී සිටින්නේ වෙයි" කියා?

7. ප්‍රශ්නය :

**අහෝ! ඔබ වහන්සේ ගේ ඔය ප්‍රකාශයෙන් කියවෙන්නේ මහා කාරුණිකයාණන් වහන්සේ මස් මාළු වැළඳීම අනුමත කර තිබෙන බව ද?**

7. පිළිතුර :

පින්වත, බුදුරජාණන් වහන්සේ මස් වර්ග කිහිපයක් නම් නො වැළඳිය යුතු යැයි තහනම් කොට වදාළ අවස්ථා විනය පිටකයෙහි සඳහන් වෙනවා. ඒ ගැන ඔබ දන්නවා ද? අනික එකල ඇතැම් මස් වර්ග වැළඳීම තහනම් කොට තිබීමෙන් පෙනෙන්නේ එකල රහතන් වහන්සේලා පවා මස් මාළු වළඳා තිබෙන බව නො වේ ද?

8. ප්‍රශ්නය :

**මම ඒ ගැන කිසිත් නො දනිමි. බුදුරජාණන් වහන්සේ විසින් නො වැළඳිය යුතු බවට යම් මසක් තහනම් කරන ලද්දේ නම් ඒ කවර මසක් ද?**

8. පිළිතුර :

මේ ගැන විස්තර වශයෙන් සඳහන් වන්නේ **මහාවග්ග** පාලි නම් විනය ග්‍රන්ථයෙහි **භේසජ්ජක්ඛන්ධක** යේ ය. එයින් කරුණු කීපයක් දැන් උපුටා දක්වමි.

- එක් දුර්භික්ෂ කාලයක මිනිස්සු ඇතුන් ගේ මස්

අනුභව කළහ. භික්ෂූන් වහන්සේලා එම ගමට පිඬු පිණිස වැඩිය කල්හි උන්වහන්සේලාට පිසින ලද ඇත් මස් දුන්නාහුය. භික්ෂූහු ඇතුන් ගේ මස් වැළඳූහ. එවිට සද්ධර්මය නො දත් මිනිසුන් නින්දා අපහාස කරන්නට පටන් ගත්හ. "කෙසේ නම් මේ ශාක්‍ය පුත්‍රීය වූ ශ්‍රමණයෝ ඇතුන් ගේ මස් වළඳත් ද? හස්තියා වනාහී රාජකීය සත්වයෙක් නෙව. ඉදින් රජතුමා මෙකරුණ දන්නේ නම් භික්ෂූන් වහන්සේලා ගැන නො සතුටු වන්නේ ය" කියා ය. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැල කළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"පින්වත් මහණෙනි, හස්ති මාංශ නො වැළඳිය යුතුය. යමෙක් ඇත් මස් වළඳන්නේ නම් ඔහුට 'දුක්කට ආපත්තිය' සිදු වේ." (දුක්කට ආපත්තිය යනු නො කළ යුතු දෙයක් කිරීමේ වරදට හසු වීම යි. එය යළි නො කරන බවට දේශනා කිරීමෙන් සංවර විය යුතු ඇවැතකි.)

- එක් දුර්භික්ෂ කාලයක මිනිස්සු අශ්වයන් ගේ මස් අනුභව කළහ. භික්ෂූන් වහන්සේලා එම ගමට පිඬු පිණිස වැඩිය කල්හි උන්වහන්සේලාට පිසින ලද අශ්ව මස් දුන්නාහු ය. භික්ෂූහු අශ්වයන් ගේ මස් වැළඳූහ. එවිට සද්ධර්මය නො දත් මිනිස්සු නින්දා අපහාස කරන්නට පටන් ගත්හ. "කෙසේ නම් මේ ශාක්‍ය පුත්‍රීය වූ ශ්‍රමණයෝ අශ්වයන් ගේ මස් වළඳත් ද? අශ්වයා වනාහී රාජකීය සත්වයෙක් නෙව. ඉදින් රජතුමා මෙකරුණ දන්නේ නම් භික්ෂූන් වහන්සේලා ගැන නො සතුටු වන්නේ ය" කියා ය. භාග්‍යවතුන්

වහන්සේට මෙකරුණ සැල කළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"පින්වත් මහණෙනි, අශ්ව මාංශ නො වැළඳිය යුතුය. යමෙක් අශ්ව මස් වළඳන්නේ නම් ඔහුට 'දුක්කට ආපත්තිය' සිදු වේ."

- එක් දුර්භික්ෂ කාලයක මිනිස්සු බල්ලන් ගේ මස් අනුභව කළහ. භික්ෂූන් වහන්සේලා එම ගමට පිඬු පිණිස වැඩිය කල්හි උන්වහන්සේලාට පිසින ලද බලු මස් දුන්නාහු ය. භික්ෂූහු බලු මස් වැළඳූහ. එවිට සද්ධර්මය නො දත් මිනිස්සු නින්දා අපහාස කරන්නට පටන් ගත්හ. "කෙසේ නම් මේ ශාක්‍ය පුත්‍රීය වූ ශ්‍රමණයෝ බලු මස් වළඳත් ද? බල්ලා වනාහී හිරිකිත සත්වයෙකි. පිළිකුල් ය" කියා ය. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැල කළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

  "පින්වත් මහණෙනි, බලු මස් නො වැළඳිය යුතුය. යමෙක් බලු මස් වළඳන්නේ නම් ඔහුට 'දුක්කට ආපත්තිය' සිදු වේ."

- එක් දුර්භික්ෂ කාලයක මිනිස්සු සර්ප මාංශ අනුභව කළහ. භික්ෂූන් වහන්සේලා එම ගමට පිඬු පිණිස වැඩිය කල්හි උන්වහන්සේලාට පිසින ලද සර්ප මස් දුන්නාහු ය. භික්ෂූහු සර්ප මස් වැළඳූහ. එවිට සද්ධර්මය නො දත් මිනිස්සු නින්දා අපහාස කරන්නට පටන් ගත්හ. "කෙසේ නම් මේ ශාක්‍ය පුත්‍රීය වූ ශ්‍රමණයෝ සර්ප මස් වළඳත් ද? සර්පයා වනාහී හිරිකිත සත්වයෙකි. පිළිකුල් ය" කියා ය.

භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැල කළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"පින්වත් මහණෙනි, සර්ප මස් නො වැළඳිය යුතුය. යමෙක් සර්ප මස් වළඳන්නේ නම් ඔහුට 'දුක්කට ආපත්තිය' සිදු වේ" එකල්හි සුඵස්ස නම් නාග රාජයෙක් පැමිණ භාග්‍යවතුන් වහන්සේට වන්දනා කොට මෙසේ පවසා සිටියේ ය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ශ්‍රද්ධා රහිත වූ නො පැහැදීමෙන් යුතු වූ නාගයෝ සිටිති. ඔවුහු සුළු කරුණකිනුත් භික්ෂූන්ව පීඩාවට පත්කරන්නාහු ය. ස්වාමීනි, ආර්යන් වහන්සේලා සර්ප මාංශ නො වළඳන්නාහු නම් මැනවි."

එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ සුඵස්ස නා රජුට ඉතා යහපත් ලෙස ධර්ම කතාවන් වදාරා ඔහුව සතුටු කළාහු ය. එකරුණ මුල් කරගෙන භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. "පින්වත් මහණෙනි, සර්ප මාංශ නො වැළඳිය යුතුය. යමෙක් සර්ප මස් වළඳන්නේ නම් ඔහුට 'දුක්කට ආපත්තිය' සිදු වේ."

*(මහාවග්ග පාළි - භේසජ්ජක්ඛන්ධකය)*

9. ප්‍රශ්නය :

**බුදුරජාණන් වහන්සේ තහනම් කොට වදාළේ ඔය සතුන් ගේ මස් පමණක් ද?**

9. පිළිතුර :

නැත පින්වත. තව තහනම් මස් වර්ග කිහිපයක් තිබෙනවා. මහාවග්ග පාළියේ සඳහන් වන මේ සිදුවීම

ගැනත් දැනගන්න.

- එක් කාලයක වැදි ජනතාව සිංහයෙකු දඩයම් කොට සිංහ මාංශ අනුභව කළහ. භික්ෂූන් වහන්සේලා පිඬු සිඟා වැඩිය කල්හි උන්වහන්සේලාට පිසින ලද සිංහ මස් දුන්නාහුය. භික්ෂූහු සිංහ මස් වැළඳූහ.

  සිංහ මස් වැළඳූ භික්ෂූන් වහන්සේලා වනාන්තරයෙහි වාසය කරති. එවිට මස් ගඳට ඉවකළ සිංහයෝ පැමිණ එම භික්ෂූන් මරා දැමූහ. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළකළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. "පින්වත් මහණෙනි, සිංහ මාංශ නො වැළඳිය යුතු ය. යමෙක් සිංහ මාංශ වළඳත් නම් ඔහුට 'දුක්කට ආපත්තිය' සිදු වේ."

- එක් කාලයක වැදි ජනතාව දිවියෙකු දඩයම් කොට දිවි මස් අනුභව කළහ. භික්ෂූන් වහන්සේලා පිඬු සිඟා වැඩිය කල්හි උන්වහන්සේලාට පිසින ලද දිවි මස් දුන්නාහුය. භික්ෂූහු දිවි මස් වැළඳූහ.

  දිවි මස් වැළඳූ භික්ෂූන් වහන්සේලා වනාන්තරයෙහි වාසය කරති. එවිට මස් ගඳට ඉවකළ දිවියෝ පැමිණ එම භික්ෂූන් මරා දැමූහ. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළකළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. "පින්වත් මහණෙනි, දිවි මාංශ නො වැළඳිය යුතු ය. යමෙක් දිවි මාංශ වළඳත් නම් ඔහුට 'දුක්කට ආපත්තිය' සිදුවේ."

- එක් කාලයක වැදි ජනතාව වලසෙකු දඩයම් කොට වලස් මාංශ අනුභව කළහ. භික්ෂූන් වහන්සේලා පිඬු සිඟා වැඩිය කල්හි උන්වහන්සේලාට පිසින ලද වලස් මස් දුන්නාහු ය. භික්ෂූහු වලස් මස් වැළඳූහ.

වලස් මස් වැළඳූ භික්ෂූන් වහන්සේලා වනාන්තරයෙහි වාසය කරති. එවිට මස් ගඳට ඉව කළ වලස්සු පැමිණ එම භික්ෂූන් මරා දැමූහ. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළකළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. "පින්වත් මහණෙනි, වලස් මාංශ නො වැළඳිය යුතු ය. යමෙක් වලස් මාංශ වළඳත් නම් ඔහුට 'දුක්කට ආපත්තිය' සිදුවේ."

- එක් කාලයක වැදි ජනතාව කරබානා වලසෙකු දඩයම් කොට කරබානා වලස් මාංශ අනුභව කළහ. භික්ෂූන් වහන්සේලා පිඬු සිඟා වැඩිය කල්හි උන්වහන්සේලාට පිසින ලද කරබානා වලස් මස් දුන්නාහු ය. භික්ෂූහු කරබානා වලස් මස් වැළඳූහ.

  කරබානා වලස් මස් වැළඳූ භික්ෂූන් වහන්සේලා වනාන්තරයෙහි වාසය කරති. එවිට මස් ගඳට ඉවකළ කරබානා වලස්සු පැමිණ එම භික්ෂූන් මරා දැමූහ. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළකළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. "පින්වත් මහණෙනි, කරබානා වලස් මස් නො වැළඳිය යුතු ය. යමෙක් කරබානා වලස් මස් වළඳත් නම් ඔහුට 'දුක්කට ආපත්තිය' සිදු වේ."

10. ප්‍රශ්නය :

**අහෝ ! මෙතරම් බැරෑරුම් වූත්, කණගාටුදායක වූත් සිදුවීම් වලින් ඉතා ම පැහැදලිව පෙනෙන්නේ සියලු මස් මාංශ වැළඳීම තහනම් කළ යුතු බව නො වේ ද?**

10. පිළිතුර :

පින්වත, ඔය දේවල් වලට ත් වඩා ඉතාමත් ම බරපතල සිදුවීමකින් පසුව පවා උන්වහන්සේ සියලු ම මස් මාංශ අනුභවය තහනම් කළ බවක් නො පෙනේ. ඒ බරපතල සිදුවීම නම් එක්තරා භික්ෂුවක් මිනී මස් වැළඳීම යි !

11. ප්‍රශ්නය :

**මොනවා! එතරම් භයානක දේ ත් සිදු වී තිබේ ද?**

11. පිළිතුර :

එසේය පින්වත, ඒ ගැන මහාවග්ග පාළියේ භේසජ්ජක්ඛන්ධකයේ සඳහන් ව තිබෙන්නේ මෙසේ ය. "එකල ඇතැම් භික්ෂූන් හට ශරීරයෙහි දොස් කිපීමෙන් ගිලන් බවට පත් වූ අවස්ථා ඇති විය. එවිට භාග්‍යවතුන් වහන්සේ 'පින්වත් මහණෙනි, බඩ විරේකයක් පානය කිරීම අනුමත කරමි' යි වදාළ සේක. විරේක බෙහෙත් ගත් පසු පෙරා ගත් කැඳ වතුරක අවශ්‍යතාවය ඇති විය. එවිට භාග්‍යවතුන් වහන්සේ 'පින්වත් මහණෙනි, පෙරා ගත් කැඳ වතුර අනුමත කරමි' යි වදාළ සේක.

ඇතැම් විට දුරුමිරිස් නො යෙදූ මුං ඇට තැම්බූ වතුරක අවශ්‍යතාව ඇති විය. එවිට භාග්‍යවතුන් වහන්සේ 'පින්වත් මහණෙනි, දුරු මිරිස් නො යෙදූ මුං ඇට තැම්බූ වතුර අනුමත කරමි' යි වදාළ සේක.

ඇතැම් විට මස් ව්‍යඤ්ජනයක අවශ්‍යතාවය ඇති විය. එවිට භාග්‍යවතුන් වහන්සේ 'පින්වත් මහණෙනි, මස් ව්‍යඤ්ජන ද අනුමත කරමි' යි වදාළ සේක. (මේ ආකාරයට විරේක බෙහෙත් වැළඳූ අවස්ථාවන්හි දී මස් රසයෙන්

ප්‍රයෝජන ඇතියහුට ඒවා ධාර්මිකව ලබා ගැනීමේ අවසරය භික්ෂූන්ට ඇති බව එකල භික්ෂූන් වහන්සේලා කවුරුත් පාහේ දැනසිටින්නට ඇති.)

අපගේ කථාවට අදාළ භික්ෂූන් වහන්සේ ද විරේක බෙහෙතක් වළඳා සිටියහ. උන්වහන්සේට ද මස් ව්‍යඤ්ජනයක අවශ්‍යතාව ඇති වී තිබිණ.

එකල බරණැස නගරයේ සෝවාන් ඵලයට පත් වූ සුප්පියා නමින් ඉතාමත් සැදැහැවත් එක්තරා උපාසිකාවක් සිටියා ය. සුප්පිය නම් වූ ඇගේ ස්වාමියා ද සෝවාන් ඵලයට පත් උපාසකයෙකි. මේ දෙදෙනා නිරතුරුව ම භිකෂූන් වහන්සේට ගිලන් උපස්ථාන පිණිස වෙහෙරට යති. එක් දිනක් වෙහෙරට ගිය සුප්පියා උපාසිකාව කුටියක් පාසා ගියා ය.

"ස්වාමීනි, ගිලන් වී සිටින්නේ කවර ස්වාමීන් වහන්සේලා ද? ගෙනැවිත් දිය යුත්තේ කවර දෙයක් ද?" යි භික්ෂූන්ගෙන් විමසා සිටියා ය. එවිට විරේක බෙහෙත් වළඳා මස් ව්‍යඤ්ජනයක අවශ්‍යතාව තිබූ භික්ෂුව සුප්පියා උපාසිකාවට මෙසේ කීවේ ය.

"පින්වත් නැගණියනි, මවිසින් විරේක බෙහෙතක් වළඳන ලදී. මා හට මස් ව්‍යඤ්ජනයක් ලැබුනොත් ප්‍රයෝජනවත් ය."

එවිට සුප්පියා උපාසිකාව "ආර්යන් වහන්ස, මැනවි. එය ඔබ වහන්සේට ගෙනෙනු ලැබෙන්නේ ය" යි පවසා තම නිවසට ගොස් සේවකයෙකු කඩපිලට පිටත් කොට යැව්වා ය. "සගය, යන්න. විකිණීමට තිබෙන මසක් සොයා ගන්න." "එසේය ආර්යාවෙනි" පිළිතුරු දුන් ඒ පුරුෂයා

මුළු බරණැස් නුවර ම ඇවිද විකිණීමට තිබෙන මසක් නුදුටුවේ ය. එවිට හේ යළි සුප්පියා උපාසිකාව වෙත පැමිණියේ ය. "ආර්යාවෙනි, කඩපිළෙහි විකිණීමට මස් නැත. අද වනාහී සතුන් නො මරන මාඝාත දිනය යි!"

එවිට සුප්පියා උපාසිකාව මෙසේ සිතන්නට වූවා ය. "ඒ ගිලන් වූ ස්වාමීන් වහන්සේට මස් ව්‍යඤ්ජනය නො ලැබුනෝතින් උන්වහන්සේ ගේ අසනීපය වැඩි වෙන්නට පුළුවනි. ඇතැම් විට ඒ රෝගයෙන් ම අපවත් වෙන්නට ත් පුළුවනි. ඇරත් මා යමක් දෙන බවට පොරොන්දු වී එය නො යවන්නෙම් නම් මා හට එය නුසුදුසු ය."

ඉක්බිති ඕ තොමෝ මස් කපන පිහිය ගෙන තමා ගේ කලව කපා දාසියට දුන්නා ය. "කෙල්ලේ, මේ මස දුරුමිරිස් දමා සකස් කොට පිසින්න. අසවල් වෙහෙරේ සිටින අසවල් ස්වාමීන් වහන්සේට පිළිගන්වන්න. යමෙක් මා ගැන විමසත් නම්, මා හට අසනීප බව පවසන්න" යි කලවය රෙද්දකින් ඔතාගෙන කාමරයට වැදී ඇඳෙහි වැද හොත්තා ය.

එවේලෙහි සුප්පිය උපාසක තෙමේ නිවසට පැමිණුනේ ය. "සුප්පියා උපාසිකාව කොහි සිටින්නී ද" යි දාසියගෙන් විචාළේ ය. එවිට දාසිය "ආර්ය පුත්‍රය, ඕ තොමෝ නිදන ගෙහි වැදහොත්තා ය" යි පිළිතුරු දුන්නා ය. සුප්පිය තෙමේ වහා එහි ගොස් නිදන ඇය දැක කුමක් නිසා නිදන්නී දැයි ඇසූ කල්හි තමාට අසනීප බව පවසා ඕ සියලු විස්තර සැල කළා ය.

එකල්හි සුප්පිය උපාසක තෙමේ "භවත්නි, මෙය නම් ඒකාන්තයෙන් ම ආශ්චර්යවත් දෙයකි! භවත්නි, මෙය

නම් ඒකාන්තයෙන් ම අද්භූත දෙයකි! අප ගේ මේ සුප්පියා උපාසිකා තොමෝ පරිපූර්ණ වූ ශ්‍රද්ධා ඇත්තී වේ. බුද්ධ ශාසනය කෙරෙහි පර්පූර්ණ වූ ශ්‍රද්ධා ඇත්තී වේ. තමන් ගේ මස පවා මෙසේ දන් දෙන ලද නම් මැයට නො දිය හැකි වෙන කිසිවක් වේද!" යි බලවත් සතුටට පත් වීය. ඔද වැඩුනු සිත් ඇති වීය. (සුප්පිය උපාසක හට මෙම මානසිකත්වය ඇතිවූයේ ඔහු සෝතාපන්නව සිටි නිසා ය. පෘතග්ජන කෙනෙකු හට මෙවැනි ප්‍රශ්නයකට මුහුණ දීමට සිදු වූයේ නම් අපායගාමී බොහෝ අකුසල් රැස් කරගැනීමට එය ම ප්‍රමාණවත් කරුණක් වනු නිසැක ය.)

සුප්පිය උපාසක තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹීය. එළැඹ භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට එකත්පස්ව සිටියේ ය. මෙසේ ද පවසා සිටියේ ය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, හෙට දානය පිණිස භික්ෂූන් වහන්සේලා සමඟ මාගේ නිවසට වඩින සේක්වා!"යි. භාග්‍යවතුන් වහන්සේ එම ආරාධනය පිළිගත් සේක.

පසු දින මනාකොට ප්‍රණීත අයුරින් දානය පිළියෙල කොට භාග්‍යවතුන් වහන්සේට කල් දන් වූ විට භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමඟ එහි වැඩම කළ සේක. එහි වැඩම කොට "සුප්පියා තොමෝ කොහි සිටින්නී ද" යි අසා වදාළ සේක. එවිට උපාසක තෙමේ "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඕ තොමෝ ගිලන් වූවා ය" යි පැවසුවේ ය.

"එසේ වී නම් ඇය මෙහි පැමිණේවා!" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ කල්හි "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඇයට පැමිණීමට නො හැකි ය"යි පවසා සිටියේ ය.

"එසේ වී නම් ඇය මෙහි පැමිණේවා !" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ කල්හි "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඇයට පැමිණිය නො හැකි ය"යි පවසා සිටියේ ය.

"එසේ වී නම් ඇයව ඔසවාගෙන රැගෙන එන්න"යි වදාළ සේක.

එවිට සුප්පිය උපාසක තෙමේ ඇය වෙත ගොස් ඇයව ඔසවාගෙන භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට පැමිණියේ ය. සුප්පියා උපාසිකාව භාග්‍යවතුන් වහන්සේව දකිනවා ත් සමඟ ම ඇගේ ඒ මහා තුවාලය සැණෙකින් මසින් වැසී ගොස් කැළැල් මැකී ගොස් සම්පූර්ණයෙන් ම සුවපත් භාවයට පත් වීය.

එවිට සුප්පිය උපාසක ත්, සුප්පියා උපාසිකාව ත් "භවත්නි, ඒකාන්තයෙන් ම ආශ්චර්ය යි! භවත්නි, ඒකාන්තයෙන් ම අද්භූත යි! අප ගේ භාග්‍යවතුන් වහන්සේව දකිනවා ත් සමඟ ම මේසා මහත් වූ තුවාලය සැණෙකින් මසින් වැසී ගොස්, කැළැල් මැකී ගොස් සම්පූර්ණයෙන් ම සුවපත් වූයේ ය"යි අතිශයින් ම තුටු පහටු වී භාග්‍යවතුන් වහන්සේට දන් පිළිගැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ මධුර වූ ධර්ම කතාවෙන් ඔවුන් දෙදෙනා ම සතුටු කොට වෙහෙරට වැඩම කොට මෙකරුණ අරභයා භික්ෂු සංඝයා රැස් කර වූ සේක.

"පින්වත් මහණෙනි, සුප්පියා උපාසිකාවගෙන් මස් ඉල්ලුවේ කවර භික්ෂුව ද?" යි අසා වදාළ සේක. එකල්හි ඒ මස් වැළඳූ භික්ෂුව ඉදිරිපත් වූයේ ය. "ස්වාමීනි, සුප්පියා උපාසිකාව ගෙන් මස් ඉල්ලන ලද්දේ මා විසිනි"

"පින්වත් භික්ෂුව, ඔබට ඒ මස ලැබුනේ ද?"

"එසේ ය ස්වාමීනි, මා හට ඒ මස ලැබුනේ ය."

"පින්වත් භික්ෂුව, ඔබ වැළඳුවේ ද ඒ මස?"

"එසේ ය භාග්‍යවතුන් වහන්ස, මවිසින් ඒ මස වළඳන ලදී."

"පින්වත් භික්ෂුව, ඒ කවර මසක් ද යි ඔබ විසින් විමසන ලද්දේ ද?"

"නැත භාග්‍යවතුන් වහන්ස, මම නො විමසූවෙමි."

එවිට භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ආකාරයෙන් එහි දොස් දක්වා මෙසේ වදාළ සේක.

"හිස් පුරුෂය, ඔබ විසින් විමසනු නො ලැබ කෙසේ නම් ඒ මස වැළඳුවේ ද? හිස් පුරුෂය, ඔබ වළඳා තිබෙන්නේ මනුෂ්‍ය මාංශයකි! හිස් පුරුෂය, මෙය වනාහී නො පැහැදුනවුන් ගේ පැහැදීම පිණිස හේතු නොවේ. පැහැදුනවුන් ගේ වඩා පැහැදීම පිණිස ද හේතු නොවේ" යි නන් අයුරින් කරුණු දක්වා ධර්ම කතාව කොට මෙසේ වදාළ සේක.

"පින්වත් මහණෙනි, බලවත් ලෙස ශ්‍රද්ධාව පිහිටුවා ගත්, බලවත් ප්‍රසාදය ඇති උදවිය සිටිති. ඔවුන් විසින් තමන් ගේ මස් පවා පුදන ලද්දේ වේ.

පින්වත් මහණෙනි, මිනී මස් නො වැළඳිය යුතුය. යමෙක් මිනී මස් වළඳන්නේ නම් එයින් ඔහුට 'ථුල්ලච්චය ආපත්තිය' සිදු වේ. (ථුල්ලච්චය ආපත්තිය යනු ඔහු අතින් බලවත් වරදක් සිදු වුන බව යි. එය සංඝයාට ආරෝචනය කොට නැවත නො කරන බවට පොරොන්දු වී සංවර විය

යුතු ඇවැතකි.)

පින්වත් මහණෙනි, නො විමසා මස් නො වැළඳිය යුතුය. යමෙක් නො විමසා මස් වළඳන්නේ නම් ඔහුට 'දුක්කට ආපත්තිය' සිදු වේ."

*(මහාවග්ග පාළි - භේසජ්ජක්ඛන්ධය)*

12. ප්‍රශ්නය :

**අහෝ! මේ තරම් භයානක වූ ත්, බරපතල වූ ත් දේ සිදු වී තිබිය දී පවා බුදුරජාණන් වහන්සේ මස් මාංශ අනුභවය තහනම් නො කළේ මක් නිසා ද?**

12. පිළිතුර :

පින්වත, සැබැවින් ම මෙය මහත් බරපතල වූ ත්, කණගාටුදායක වූ ත් කරුණක් බව සැබෑ ය. එහෙත් මෙපමණ බැරෑරුම් කරුණක් අභියස දී පවා අප ගේ භාග්‍යවතුන් වහන්සේ මස් මාළු අනුභවය තහනම් කළ බවක් නො පෙනේ. ඉතින් උන්වහන්සේ එය තහනම් කිරීමට හේතුවක් අපේක්ෂාවෙන් සිටි සේක් නම්, මෙයට ත් වඩා හොඳ හේතුවක් කොයින් ද? මෙවැනි බරපතල අවස්ථාවක දී පවා උන්වහන්සේ තීරණ ගන්නා ආකාරය ගැන අප ද නුවණින් සලකා බැලීම වටී.

එපමණක් ද නොවේ. මෙකී සිද්ධියට අදාළ ඒ සුප්පියා උපාසිකාව පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ දැරුවේ මේ අදහසයි. එනම් 'මෙම බුද්ධ ශාසනයෙහි ගිලනුන්ට උපස්ථාන කරන්නවුන් අතුරින් සුප්පියා උපාසිකාව අග්‍ර වන්නී ය' යනුවෙනි. මෙය ඇය ලද අග තනතුර යි.

*(අංගුත්තර නිකාය - 1 නිපාතය)*

එමෙන් ම එක්තරා භික්ෂුවකට අමනුෂ්‍ය දෝෂයක්

ඇති විය. එවිට ඒ භික්ෂුවට තම ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලා පවා උපස්ථාන කරද්දී ත් එම අමනුෂ්‍ය උපද්‍රවය සුව කළ නො හැකි විය. දිනක් ඒ භික්ෂුව (අමනුෂ්‍ය ආවේශයෙන්) ඌරන් මරණ තැනකට ගියේ ය. ගොස් අමු ඌරු මස් කෑවේ ය. අමු ලේ ද බීවේ ය. එවිට ඒ අමනුෂ්‍ය දෝෂය දුරු විය. ඒ භික්ෂුව සුවපත් විය. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"පින්වත් මහණෙනි, අමනුෂ්‍ය දෝෂයක දී එම ආතුරයා හට අමු මස් කෑමට සිදුවුවහොත්, අමු ලේ බීමට සිදුවුවහොත් එය අනුමත කරමි" වශයෙනි.

*(මහාවග්ග පාළි - භේසජ්ජක්ඛන්ධය)*

දැන් කෙනෙකුට පැහැදිලිව ම එක දෙයක් තේරුම් ගත හැකි ය. එනම් බුදුරජාණන් වහන්සේ මාංශ වර්ග දහයක් වැළඳීම තහනම් කොට ඇති බවයි. එනම්;

1. මිනී මස්
2. අලි මස්
3. අශ්ව මස්
4. බලු මස්
5. සර්ප මස්
6. සිංහ මස්
7. ව්‍යාඝ්‍ර මස්
8. දිවි මස්
9. වලස් මස්
10. කරබානා වලස් මස්

යන මේ වර්ග දහය යි.

13. ප්‍රශ්නය :

**අනේ! ඔබ වහන්සේ නම් බලවත් ලෙස මුලාවට පත් වී ඇති හැඩ යි. අප ගේ බුදුරජාණන් වහන්සේ මහා කාරුණික වන සේක. එබඳු වූ මහා කාරුණිකයන් වහන්සේ නමකගෙන් ඔය ආකාරයට මාංශ භක්ෂණයට අනුබලයක් ලැබේ යැයි කෙසේ නම් විශ්වාස කරන්නට ද?**

13. පිළිතුර :

පින්වත, අප ගේ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ සමන්විත වූයේ මහා කරුණාවෙන් පමණක් නොවේ. මහා ප්‍රඥාවෙන් ද සමන්විත වන සේක. එනිසා උන්වහන්සේ ගේ කරුණාව නිගණ්ඨ නාතපුත්ත ගේ "පරම අවිහිංසාව" යැයි කියා ගන්නා ලද ප්‍රායෝගිකව ගලපා ගත නො හැකි හුදෙක් වාද විවාද කරගන්නා දෘෂ්ඨියක් සේ නො වූයේ ය.

නාතපුත්‍ර නිගණ්ඨ තෙමේ පරම නිර්මාංශී කෙනෙකි. හේ මුඛයේ ජීවත් වන සතුන් හට හිංසාවක් වෙති යි කියා දත් නො මැද්දේ ය. ඇඟ පත නො සේදුවේ ය. අද පවා නිගණ්ඨ ශ්‍රාවකයන් ගේ නිරුවත් ශරීරය පිරිමි බැතිමතුන් විසින් තෙත මාත්තු කරන ලද රෙදි කැබලි වලින් පිරිසිදු කරන අයුරු මවිසින් දැක තිබේ. නිගණ්ඨයෝ යන යන තැන මොණර පිල් කලඹක් රැගෙන යති. එසේ කරන්නේ කවර හෝ තැනක වාඩිවෙන්නට පළමු එතැන පිස දැමීම සඳහා ය. ඒ ඇසට නො පෙනෙන තරමේ කුඩා ප්‍රාණීන් හට ද හිංසාවක් නො වනු පිණිස ය.

එහෙත් මේ සා පරම අවිහිංසාවාදී යැයි කියා ගන්නා නාතපුත්‍ර නිගණ්ඨ තෙමේ භාග්‍යවතුන් වහන්සේට ඇති පදමට ඊර්ෂ්‍යා කළේ ය. භාග්‍යවතුන් වහන්සේට නින්දා

අපහාස කිරීමේ අභිලාෂයෙන් තම ශ්‍රාවකයන් වාද විවාද පිණිස උසි ගැන්වී ය. ඔහු ගේ හොඳ ම ගිහි ශ්‍රාවකයා වශයෙන් සිටි උපාලි නම් ගෘහපතියා බෞද්ධ ශ්‍රාවකයෙකු බවට පත් වූ බව අසා තම කටින් උණු ලේ පිට වුණේ ය.

එහෙත් බුදුරජාණන් වහන්සේ ගේ අවිහිංසාව සතුන් හට පමණක් සීමා නොවී ය. උන්වහන්සේ අහිංසාව ප්‍රායෝගිකව ගලපා ගත හැකි දෙයකි. උන්වහන්සේ තම ශ්‍රාවකයින් හට උගන්වා වදාළේ අනුන් හට ද්වේෂ කිරීම, ඊර්ෂ්‍යා කිරීම, වෛර බැඳීම, බද්ධ වෛර ඇති කර ගැනීම, පළිගැනීම, එකට එක කිරීම, දුෂ්ඨකම් කිරීම, නින්දා අපහාස කිරීම කිසිසේත් ම නො කළ යුතු බව යි.

සාමාන්‍ය ජීවිතයේ දී අහිංසක ජීවිතයක් ගත කිරීම පිණිස තම ශ්‍රාවකයින් හට පෙරා ගත් ජලය පානය කරන්න යැයි උපදෙස් දුන් සේක. කුටියක් පිරිසිදු කිරීමේ දී බිත්ති වල දැල් බැඳ සිටින මකුළුවන් හට කරදරයක් නො වීම පිණිස එම මකුළු දැල් කැඩිය යුත්තේ උඩ සිට පහළට බව පෙන්වා දුන් සේක. ඒ අයුරින් මකුළු දැල් කැඩූ විට මකුළුවන් හට වෙනත් තැනකට යා හැකි ය.

එකල තිබුණේ විදුලි බල උත්පාදනයෙන් ආලෝකය ලබා ගැනීම නොවේ. තෙල් පහන් දල්වා අඳුර දුරු කිරීම යි. එවන් අවස්ථාවන් හීදී ආලෝකය සොයා පැමිණෙන පළගැටියන් වැනි කුඩා සතුන් පහන් දැල්ලේ වැදී විනාශයට පත් වන විට උන්වහන්සේ තුළ මහත් දයානුකම්පාවක් පැන නැංගේ ය.

ඔබට වැරදී තිබෙන්නේ ප්‍රාණඝාතය ත්, මස් මාලු අනුභවය ත් එක ම අර්ථයෙන් පිළිගැනීම යි !

14. ප්‍රශ්නය :

**නැත. අපට වැරදීමක් නැත. මස් මාළු අනුභව කිරීම නිසා නො වේද අසරණ සතුන් මරණයට පත් වන්නේ? ඉතින් ඒ මස් මාළු අනුභව කරන උදවිය සෘජුව හෝ වක්‍රව හෝ ප්‍රාණඝාතයට හවුල් වෙන බව මම දැඩිව පවසමි.**

14. පිළිතුර :

පින්වත, ඒ අයුරින් දැඩිවීමක් සඳහා ඉක්මන් නො වුව මැනව. ඔබේ තර්කය තුළ සත්‍යයක් තිබෙන ආකාරයක් බැලූ බැල්මට කෙනෙකුට පෙනී යන්නට බැරි නැත.

දේවදත්තයන් පවා සංඝභේදය කොට ආනන්තරීය පාප කර්මය සිදුකර ගනිමින් අන් අය තුළ ද පවු රැස් කරවා අපාගත වූයේ ඔවැනි අදහස් ඇති ඔබ වැනි උදවිය රවටා ගැනීමෙන් ය.

තමන් කෙරෙහි බලවත් ව පැහැදීම ඇති කර ගත් තමන් හට බුදුරජාණන් වහන්සේට මෙන් වැඳුම් පිදුම් කරන්නා වූ ගිහි පැවිදි ශ්‍රාවක පිරිසක් සකස් කර ගැනීමේ උමතු ආශාවෙන් දෙව්දත් පෙළෙන්නට විය. දේවදත්තයා ඒ සඳහා කදිම උගුලක් ඇටෙව්වේ ය. එනම් අඥාන මිනිසුන් ගේ චිත්තප්‍රසාදය උස්ව පැන නගින ආකාරයේ ප්‍රතිපත්ති පහක් සැලසුම් කිරීම යි. එනම්;

1. භික්ෂූන් වහන්සේලා දිවි තිබෙන තුරාවට ආරණ්‍යයෙහි ම වාසය කළ යුත්තාහ. යමෙක් ගමට පැමිණෙත් නම් එවිට ඔහු කෙරෙහි වරද ස්පර්ශ වන්නේ ය.

2. භික්ෂූන් වහන්සේලා දිවි තිබෙන තුරාවට පිඬු සිඟා යැපීමෙන් ම ජීවත් විය යුත්තාහ. යමෙක්

ආරාධනාවෙන් ලත් දන් පිළිගනිත් නම් එවිට ඔහු කෙරෙහි වරද ස්පර්ශ වන්නේ ය.

3. භික්ෂූන් වහන්සේලා දිවි තිබෙන තුරාවට මස් මාළු නො වැළඳිය යුත්තාහ. යමෙක් මස් මාළු වළඳත් නම් එවිට ඔහු කෙරෙහි වරද ස්පර්ශ වන්නේ ය.

4. භික්ෂූන් වහන්සේලා දිවි තිබෙන තුරාවට පාංශුකූලික වස්ත්‍රයෙන් ම සිවුරු දැරිය යුත්තාහ. යමෙක් ගෘහපති චීවර පිළිගනිත් නම් එවිට ඔහු කෙරෙහි වරද ස්පර්ශ වන්නේ ය.

5. භික්ෂූන් වහන්සේලා දිවි තිබෙන තුරාවට රුක් මුල් හි වාසස්ථානය කොට සිටිය යුත්තාහ. යම් කෙනෙක් පියස්සක් ඇති තැනකට පැමිණෙත් නම් එවිට ඔහු කෙරෙහි වරද ස්පර්ශ වන්නේ ය.

මේ ප්‍රතිපත්ති පහ සකස් කර ගත් දේවදත්තයා තම මිත්‍ර වූ කෝකාලික නම් චීවරධාරියාට මෙසේ පැවසීය. "එම්බා ආයුෂ්මත, මේ ප්‍රතිපත්ති පහ ශ්‍රමණ ගෞතමයන් අනුමත නො කරන්නේ ම ය. එවිට අපි මේ ප්‍රතිපත්ති පහ ජනතාවට ඉදිරිපත් කරමු. ජනතාව අප ගේ පැත්තට පහදවා ගනිමු."

එවිට කෝකාලික තෙමේ මෙසේ පැවසීය. "එම්බා ආයුෂ්මත, මේ ප්‍රතිපත්ති පහ ඉදිරිපත් කිරීමෙන් ශ්‍රමණ ගෞතමයන් ගේ ශ්‍රාවක පිරිස භේද බින්න කළ හැකි වන්නේ ය. යස යි! එවිට ශ්‍රමණ ගෞතමයන් ගේ ධර්ම චක්‍රය බිඳලන්නට හැකි වන්නේ ය. එම්බා ආයුෂ්මත, මේ මනුෂ්‍යයෝ දුෂ්කරව ගත කරන ජීවිත කෙරෙහි වහා පහදින සුළු ස්වභාවයෙන් යුක්තහ."

ඉක්බිති දේවදත්තයා තමා හට පක්ෂග්‍රාහී විශාල පිරිසක් සකස් කොට ගෙන ඔවුන් ද පිරිවරා ගෙන බුදුරජාණන් වහන්සේ වෙත ගොස් මෙසේ සැළකොට සිටියේ ය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ නොයෙක් ආකාරයෙන් අල්පේච්ඡතාවයෙහි ගුණය ත්, ලද දෙයින් සතුටු වීමෙහි ගුණය ත්, කෙලෙස් බැහැර කිරීමෙහි ගුණය ත්, කෙලෙස් කම්පා කිරීමේ ගුණය ත්, ප්‍රසාදය ඇති වීම ත්, කීකරුකම ත්, වීර්යයත් පුන පුනා වර්ණනා කරන සේක.

එහෙයින් ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මවිසින් දැන් ඉදිරිපත් කරනු ලබන්නා වූ මෙම පංච ප්‍රතිපත්තිය ඒකාන්තයෙන් ම අල්පේච්ඡතාවය පිණිස ත්, ලද දෙයින් සතුටු වීම පිණිස ත්, කෙලෙස් බැහැර කිරීම පිණිස ත්, කෙලෙස් කම්පා කිරීම පිණිස ත්, ප්‍රසාදය ඇති කිරීම පිණිස ත්, කීකරුකම පිණිස ත්, වීර්යය පිණිස ත් පවතින්නේ ම ය."

එකල්හි සියල්ල දන්නා වූ ත්, දක්නා වූ ත්, භාග්‍යවතුන් වහන්සේ මෙම ප්‍රතිපත්ති පහ අනුමත නො කළ සේක. එවිට දේවදත්තයා පොහෝ දින භික්ෂු සංඝයා රැස් වූ වේලෙහි මෙකරුණ ප්‍රකාශයට පත් කළේය.

"එම්බා ආයුෂ්මතුන් වහන්ස, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙම උත්තම වූ පංච ප්‍රතිපත්තිය අනුමත නො කරති. එහෙත් අපි වනාහී මේ උදාර වූ ප්‍රතිපත්ති පහ තුළ මනා කොට පිහිටා මේවා සමාදන්ව වසමු. මේ උතුම් ප්‍රතිපත්තිය යම් කෙනෙකුට ප්‍රිය මනාප වෙයි නම්, ඔවුහු

අප ගේ පක්ෂයට පැමිණෙත්වා!"

එදා ඒ සඟ පිරිස අතර බුදුරජාණන් වහන්සේ වදාළ ධර්ම විනය පිළිබඳ පැහැදිලි ලෙස තේරුම් නො ගත් නවක භික්ෂූහු පන්සිය නමක් සිටියහ. ඔවුහු මේ ආකර්ශනීය ප්‍රතිපත්ති පහ කෙරෙහි ඇවටී ගියහ. දේවදත්තයන් කෙරෙහි මහත් පැහැදීමක් ඇති කර ගත්හ. "මෙය වනාහී ධර්මය යි. මෙය වනාහී විනය යි. මෙය ශාස්තෘ ශාසනය"යි වරදවා වටහා ගත් ඒ පන්සියයක් වූ භික්ෂු පිරිස බුදුරජාණන් වහන්සේව අත්හැර දේවදත්තයන් ගේ පක්ෂයට බැඳී ගියහ.

ඉක්බිති දේවදත්තයා මෙසේ ආනන්තරික පාපකර්මය වූ සංඝසාමග්‍රිය වනසා සංඝ භේදය කොට ඒ භික්ෂු පිරිස රැගෙන ගයා ශීර්ෂය බලා පිටත් වූයේ ය.

එවිට මහා කාරුණික භාග්‍යවතුන් වහන්සේ මැදිහත් වී සැරියුත්, මුගලන් රහතන් වහන්සේලා දෙනම එහි පිටත් කොට යවා ඒ පන්සියයක් භික්ෂු පිරිස දේවදත්තයා ගේ ග්‍රහණය හේතු කොට මිත්‍යා දෘෂ්ටියකට පත් වෙන්නට පෙර බේරා ගත් සේක.

*(චුල්ලවග්ගපාළි - සංඝභේදක්ඛන්ධකය)*

15. ප්‍රශ්නය :

ඔබ වහන්සේ අප ගේ ප්‍රශ්නය මගහරින හැඩ යි. අප ඇසූ ප්‍රශ්නයේ සාධාරණත්වයක් නො තිබේ ද? එනම් අප මස් මාංශ අනුභව කරන නිසා නොවේ ද අසරණ සතුන් මරණයට පත් වන්නේ? එවිට ඒ මස් මාංශ අනුභව කරන උදවිය කෙලින් ම ප්‍රාණඝාතයට හවුල් වෙනවා නොවේ ද?

15. පිළිතුර :

පින්වත, ප්‍රශ්න වලින් මඟහැර යාමේ කිසිදු අවශ්‍යතාවයක් මට නැත. ඔබට මතක ඇති මා ප්‍රකාශ කළා 'බැලූ බැල්මට එම ප්‍රශ්නය ඉදිරිපත් වන්නේ කිසියම් සත්‍යයක් තිබේ ය' යන ස්වරූපයෙන් බව.

හොඳයි, අපි මොහොතකට ප්‍රාණඝාතයට අදාළ සිදුවීම් ගැන බුදුරජාණන් වහන්සේ කටයුතු කර ඇති ආකාරය විමසා බලමු.

ඇතැම් විට උපසම්පදා භික්ෂුවක ගේ ඒ උපසම්පදාව අහෝසි වී සසුනෙන් බැහැර වී යන ආකාරය ගැන හෙවත් පාරාජිකාවට පත්වන ආකාරය ගැන ඔබ අසා ඇති. යම් සාමණේර භික්ෂුවක් පිරිසිදු ලෙස උපසම්පදාව ආරක්ෂා කර ගෙන සිටින භික්ෂූන් වහන්සේලා පස් නමක් ඉදිරියෙහි උපසම්පදාව ලබයි. එතැන් සිට ඔහු අයත් වන්නේ සංඝ යන පොදු නාමයට යි. ඒ සංඝ සමාජයේ පූර්ණ අයිතිවාසිකම රැඳී පවතින්නේ සසුනෙන් පැරදී යන පාරාජිකා හතරකට පත් නොවී සිටින තාක් පමණි. සතර පාරාජිකා යනු කුමක්ද?

1. අඩු ගණනේ තිරිසන් ගත ස්ත්‍රියක සමඟ හෝ මෙවුන්දම් සේවනය කිරීම ප්‍රථම පාරාජිකාව යි.

2. සොරකම් කිරීම දෙවන පාරාජිකාව යි.

3. මනුෂ්‍ය ඝාතනයකට හවුල් වීම තුන්වෙනි පාරාජිකාව යි.

4. තමා තුළ නැති ධ්‍යාන මාර්ගඵල ආදී උතුරු මිනිස් දම් ඇති බවට හුවා දැක්වීම සතර වෙනි පාරාජිකාව යි.

මෙයින් තුන් වන පාරාජිකාව නම් දැන දැන මනුෂ්‍ය ඝාතනයකට හවුල් වීම යි. එම පාරාජිකාවට අදාළ ශික්ෂා පදය මෙසේ ය. "පින්වත් මහණෙනි, යම් භික්ෂුවක් දැන දැන මනුෂ්‍ය ජීවිතයක් ප්‍රාණයෙන් තොර කරයි ද, කෙනෙකුට දිවි නසා ගැනීමට උපකාරී වන ආකාරයෙන් ඔහු වෙත අවි ආයුධ ලබා දෙන්නේ වේ ද, මරණය ගැන වර්ණනා කොට දිවි නසා ගැනීම පිණිස කෙනෙකුව පොළඹවන්නේ වේ ද, එනම්; 'එම්බා පුරුෂය, තොපට මේ ලාමක වූ දුක්ඛිත ජීවිතයෙන් ඇති ඵලය කිම? තොප ගේ ජීවත්වීමට වඩා මරණය මොනතරම් උතුම් ද?' කියා ය.

මේ ආකාරයෙන් ඒ තැනැත්තා ගේ ජීවිතය නැති කරන අදහසින්, ජීවිතය නැති කරන කල්පනාවෙන් නොයෙක් අයුරින් මරණය ගැන වර්ණනා කොට දිවි නසා ගැනීමට පොළඹවන්නේ වේ ද, ඒ හේතු කොට ගෙන අදාළ තැනැත්තා මරණයට පත් වන්නේ වේ ද, එසැණින් ම එම භික්ෂුව ගේ පැවිදි බව අහෝසි වේ. පාරාජිකාවට පත් වූයේ වෙයි. පිරිසිදු සංඝයා සමඟ එක්ව වාසය කිරීමට නුසුදුසු වූයේ වෙයි."

*(පාරාජිකා පාළි - මනුස්සවිග්ගහ පාරාජිකාව)*

මේ ආකාරයට මනුෂ්‍ය ඝාතන අකුසල කර්මයකට හසුවිය හැකි අවස්ථා තිස් තුනක් පාරාජිකා පාළියෙහි දක්වා තිබේ. කවර අවස්ථාවක දී නමුත් භික්ෂුව ගේ ස්වල්ප වූ හෝ උදව්වකින් කිසියම් මනුෂ්‍යයෙකු මරණයට පත් වන්නේ නම් ඒ මොහොතෙහි ම එයට මග පෙන්වූ භික්ෂුව පාරාජිකාවට පත් වෙයි. පැවිදි ජීවිතය අහෝසි වෙයි. කොතරම් සූක්ෂම ලෙස ප්‍රාණඝාතය සිදුවන්නේ

දැයි පහත ඇති කරුණුවලින් බුද්ධිමත් කෙනෙකුට වටහා ගත හැකිය.

එනම්, 'නිමිත්ත කම්ම' නමින් එම පාරාජිකාවට අදාළ නය මාතෘකාවක් පාරාජිකා පාළියෙහි දක්වා තිබේ.

"භික්ෂුවක් පුද්ගලයෙකු ගේ මරණය උදෙසා, නිමිති හඟවයි. ඒ මෙසේ ය. 'මම ඇස හෝ කසන්නෙමි. ඇහි බැම හෝ උඩට නගන්නෙමි. හිස හෝ උඩට ඔසවා ලන්නෙමි. එවිට ඒ නිමිති දුන්වූ විට ඔහු ගේ දිවි තොර කරව.'

ඉතින් ඒ අයුරින් භික්ෂුව තව කෙනෙකුට නිමිත්තක් හැඟවූ විට එපමණකින් ම ඔහුට දුක්කට ආපත්තිය සිදු වේ. ඒ නිමිත්ත හඳුනාගත් තැනැත්තා කතා කරගත් පරිදි අනෙකා ගේ දිවි තොර කළේ නම්, පාරාජිකාවට පත් වේ.

එහෙත් ඒ නිමිත්ත හැඟවීමට පෙර දිවි තොර කළේ නම් අර භික්ෂුව පාරාජිකාවට පත් නොවේ. එම නිමිත්ත හඟවා කලක් ගත වූ පසු දිවි තොර කළේ නම් පාරාජිකාවට පත් නො වේ.

එක්තරා අවස්ථාවක දී භික්ෂුවක් දන් වළඳන විට උගුරෙහි මස් කැබැල්ලක් සිර වී ගියේ ය. එවිට වෙනත් භික්ෂුවක් ඒ සිරවුණු මස් කැබැල්ල එළියට ඒම පිණිස එම භික්ෂුව ගේ බෙල්ලට පහරක් ගැසුවේ ය. එවිට ලේ මුසුව ඒ මස් කැබැල්ල බිම වැටුනේ ය. නමුත් එයින් ම ඒ භික්ෂුව අපවත් විය. බෙල්ලට පහර ගැසූ භික්ෂුව බලවත්ව කම්පා විය. බුදුරජාණන් වහන්සේට මෙකරුණ සැළ කළේ ය. එවිට බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

"පින්වත් භික්ෂුව, එවේලෙහි ඔබ තුළ තිබුණේ කවර චේතනාවක් ද?"

"ස්වාමීනි, ඒ භික්ෂුව මරණයට පත් කිරීමේ අදහසක් මා තුළ නො තිබුණි."

"පින්වත් භික්ෂුව, මරණයට පත් කිරීමේ අදහසක් නැති කෙනාට ඇවැතක් නැත."

තවත් වරක එක්තරා භික්ෂුවක් ගිලන් ව සිටියේ ය. එවිට ඒ භික්ෂුව ගේ මරණය කැමති වූ වෙනත් භික්ෂු පිරිසක් අර භික්ෂුව වතුරෙන් නැහැවූහ. වතුර නෑම හේතු කොට ගෙන ඒ ගිලන් භික්ෂුව මරණට පත් වූයේ ය. වතුර නැහැවූ භික්ෂු පිරිස කුකුස් කරන්නට වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙකරුණ සැළකළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගෙන් විමසා වදාළ සේක.

"පින්වත් මහණෙනි, එවේලෙහි ඔබ තුළ තිබුණේ කවර චේතනාවක් ද?"

"ස්වාමීනි, ඒ භික්ෂුව අපවත් වන්නේ නම් නම් මැනව යන අදහස අප තුළ පැවතුණි."

"එම්බා මහණෙනි, ඔබ සියලු දෙනා ම පාරාජිකාවට පත් වී සිටිති."

තවත් වරක් එක්තරා භික්ෂුවක් දැඩි ලෙස ගිලන්ව රෝගාතුරව සිටියේ ය. වෙනත් භික්ෂූන් වහන්සේලා පිරිසක් ඒ භික්ෂුව කරා ගොස් කාරුණික අදහසින් මරණයෙහි ගුණ වර්ණනා කරන්නට විය. ඒ හේතුවෙන් ඒ භික්ෂුව මරණයට පත් විය. එවිට මරණය වර්ණනා කළ භික්ෂූන්ට විපිළිසර ඇති විය. 'කිම? අපි පාරාජිකාවට පත් නො වූවමෝ ද?' භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළ කළහ.

එවිට එකරුණ විමසූ භාග්‍යවතුන් වහන්සේ "එම්බා මහණෙනි, ඔබ සියලු දෙනා ම පාරාජිකාවට පත් වී සිටිති" යි වදාළ සේක.

16. ප්‍රශ්නය :

**මෙපමණ කරුණු කාරණා ඉදිරිපත් කිරීමෙන් ඔබ වහන්සේ ඔය උත්සාහ කරන්නේ අපව නො මඟ යැවීමට නේද?**

16. පිළිතුර :

පින්වත, එසේ නො සිතුව මැනව. ඔබව නො මඟ යැවීමෙන් මට ඇති ඵලය කිම? මට අවශ්‍ය වී තිබෙන්නේ ඔබට සත්‍යය පහදා දීම පමණි. සත්‍යය තේරුම් ගත් විට ඔබට ම මෙම ගැටළුව නිරාකරණය කරගත හැකි වනු ඇත.

පින්වත, මා ඉහතින් ඉදිරිපත් කළ කරුණු අනුව ඔබට එක දෙයක් පැහැදිලිව ම දක්නට ලැබෙනු ඇත. එනම් කෙනෙකු ගේ පණ නැසීම පිණිස යොමු කරන ලද චේතනාවෙන් යුතුව කටයුතු කිරීමෙන් ය ප්‍රාණඝාත අකුසලය සිද්ධ වන්නේ.

භාග්‍යවතුන් වහන්සේ මනුෂ්‍ය ඝාතනවල දී පවා 'චේතනාව' පිළිබඳව විමසා වදාළේ චේතනාත්මක මෙහෙයවීමකින් එම ප්‍රාණඝාතය සිදුවූයේ ද යන්න පිළිබඳව ස්ථිරව තහවුරු කරගැනීම පිණිස ය. චේතනාත්මකව වධක අදහස නොමැති කල්හි යම් ක්‍රියාවක් තුළින් කෙනෙක් මිය ගිය ද, අදාළ තැනැත්තාට ඇවැතක් වත් සිදු වී නැත.

17. ප්‍රශ්නය :

**එසේ නම් මස් මාංශ අනුභව කරන උදවිය ප්‍රාණඝාතයට හවුල් නො වන්නේ ද?**

17. පිළිතුර :

පින්වත, මස් මංශ අනුභව කරන උදවිය ප්‍රාණඝාතයට කෙලින් ම හවුල් වන අවස්ථා තිබේ.

එනම්, කෙනෙක් දඩයමේ යයි. හේ සතෙකු දඩයම් කරයි. හේ පැමිණ ඒ මස පිස අනුභව කරයි. ඒ තැනැත්තා සෘජුව ම ප්‍රාණඝාතයට සම්බන්ධ වූ කෙනෙකි. සැබැවින් ම ඔහු ප්‍රාණඝාතයට හවුල් වූයේ මස් අනුභව කිරීම නිසා නොවේ. චේතනාත්මක ව වධක අදහසින් එම සතාව ඝාතනය කිරීම නිසා ය. ඔහු තුළ වධක චේතනාව හට ගැනීමෙන් පසුව එහි ප්‍රතිඵලයක් වශයෙන් ය අර සතාව මරණයට පත් කරනු ලැබූයේ. යම් හෙයකින් ඔහු එම සතා ගේ මස් අනුභව නො කළ ද, ඔහුට ප්‍රාණඝාත අකුසලයෙන් මිදීමක් නැත.

18. ප්‍රශ්නය :

**මස් මාංශ මිළට ගැනීමේ දී ප්‍රාණඝාතයට හවුල් නො වන්නේ ද?**

18. පිළිතුර :

මස් මාංශ මිලට ගැනීමේ දී ප්‍රාණඝාතයට හවුල් වන අවස්ථා තිබේ.

එනම්, කෙනෙක් මස් ගැනීම පිණිස කඩපිලට යයි. එහෙත් එහි විකිණීමට මස් නැත. එහි සිටින්නේ පණ ඇති සතුන් ය. මොහු කළ යුතු වන්නේ තමාට අවශ්‍ය සතාව

පෙන්වා දීම යි. එවිට එම සතාව මරා මස් ලබා දෙයි.

ඉතින් මස් ගැනීමට එහි ගිය තැනැත්තා මස් පිණිස සතෙකු මැරීම පිණිස වචනයෙන් අණ කරයි ද, එය ද පවකි. ඇඟිල්ල දිගු කොට පෙන්වයි ද, එය ද පවකි. මුදල් ගෙවයි ද, එය ද පවකි. තමා හට සතෙකු මරා මස් දෙන්න යැයි හඟවයි ද, එය ද පවකි. ඒ හේතුවෙන් ඒ සතා මරණයට පත්වෙයි ද, එය ද පවකි.

ඒ අනුව එම ඇඟවීම කවර අයුරකින් හෝ කළ පසු ඒ සතාව මරණයට පත් කරයි ද, සතුන් මරණ තැනැත්තා ඒ අවශ්‍ය සතාව මරා මස් දෙයි ද, එවිට මස් මාංශ මිලට ගැනීමට ගිය අර තැනැත්තා සෘජුව ම ප්‍රාණඝාතයට හවුල් වෙයි. එයට හේතුව කුමක් ද? ඔහු ගේ චේතනාත්මක මග පෙන්වීමකින් පසුව ය අර සතාව මරණයට ලද්දේ. ඔහු ප්‍රාණඝාතයට අනුබල දෙන කෙනෙකි. ඔහු ප්‍රාණඝාතය අනුමත කරන කෙනෙකි. ඔහු බොහෝ පව් රැස් කරගන්නා කෙනෙකි.

19. ප්‍රශ්නය :

**"හැයි! .... කරවල, මාළු, සාඩින් ආදී දේ සහ මැරීමෙන් පසු වෙළඳපොළට එන මස් වර්ග මිළට ගැනීමෙන් වක්‍රාකාරයෙන් හෝ ප්‍රාණඝාතයට හවුල් නො වන්නේ ද?**

19. පිළිතුර :

පින්වත, වක්‍රාකාර යන වචනයේ තේරුම යම් කිසි ඉඟියක් කිරීම යි. එම ඉඟිය කිරීමෙන් පසු එම ඉඟියට අදාළ සතා මරණයට පත් වන්නේ නම්, එතැන දී වක්‍රාකාරව ප්‍රාණඝාතයට හවුල් වීමක් වන්නේ ම ය.

එහෙත් මීට කලින් පවසා ඇති කරුණු ඔබ මනාව කියවූයේ නම් ඔබ ගේ ඔය ප්‍රශ්නයට පහසුවෙන් ම පිළිතුරු සපයා ගත හැකිය.

ප්‍රාණඝාතය පිණිස ඇති චේතනාත්මක ක්‍රියාවේ අනුබලය ගැන අපි කතා කළෙමු. එහි අතීතයෙහි සිදු වූ දෙයකට බලපාන ආකාරයෙන් කර්ම රැස් වීමක් ගැන කතා නො කරයි.

අපි මේ ගැන විමසා බලමු. යමෙක් ඔබ ගේ නම පවසමින් යම් සතෙකු මැරුවේ යැයි සිතමු. මව්සින් මේ සතා මරණු ලබන්නේ අසවල් පුද්ගලයා උදෙසා ය. අසවල් පුද්ගලයා ගේ මෙහෙයවීම මත ය කියා. නමුත් ඔබ ඒ ගැන ඔහුට කිසිදු වක්‍රාකාරයකින් හෝ 'අර සතාව මරන්න' කියා ඉඟියක් හෝ කළේ නැත්නම් අනුබලයක් දී නැති නම්, ඒ සතා ගේ මරණය ගැන ඔබ කිසිවක් නො දන්නේ නම්, එවිට අර තැනැත්තා ඔබේ නම ප්‍රකාශ කළ පමණින් එම පාප කර්මයට ඔබ හවුල්කරුවෙකු වන්නේ ද? එහිදී ඔබට සිදු වී ඇති වරද කුමක් ද? කිසිදු වරදක් සිදු වී නැත.

සමහර විට ඒ සතාව ඔබේ නමින් මරණ වේලෙහි ඔබ වෙනත් සතෙකුට උපකාර කරමින් සිටින අවස්ථාවක් විය හැකි ය.

ඇතැම් විට ඔබ ආහාර පිණිස යම් යම් දේ මිල දී ගැනීම උදෙසා කඩ පිලට යයි. එවිට ඔබට විකිණීම පිණිස තබා ඇති මස් හෝ මාළු හමුවේ. එවිට එහි ජීවත්වන සතෙක් ඔබට දකින්නට නැත. තිබෙන්නේ අනිත් එළවළු, පළතුරු මෙන් ම පාවිච්චියට නො ගත හොත් කුණු වී

යන මස් කැබලි ය. ඔබ ඒවා මිළ දී ගන්නා මොහොත වන විට එම සතා ගේ ප්‍රාණය එහි නැත. එය ඉකුත් වී බොහෝ වේලාවක් ගත වන්නට පුළුවනි. එසේ තිබිය දී එම මස් මිල දී ගැනීමෙන් ඔබ ප්‍රාණඝාතයට අනුබල දෙන්නේ කෙසේ ද?

ඔබ චේතනාත්මකව යම් කිසි ඉඟියක් කිරීමෙන් පසුව යම් සතෙකු මරණයට පත්වන්නේ නම්, එහිදී ස්ථිර වශයෙන් ම ප්‍රාණඝාතය පිණිස ඔබ ගේ මැදිහත් වීමක් සිදු වී තිබේ.

සතෙකු ගේ මස වෙළඳපොළට එන විට එහි ප්‍රාණියෙක් නැත. එහි තිබෙන්නේ කුණු වී යන ප්‍රාණ රහිත මස් පමණි. එසේ ඇති කල්හි ඔබ සිත් පිත් නැති කුණු වී යන කරවල හෝ මාළු හෝ උම්බලකඩ හෝ මස් හෝ මිළ දී ගත් විට අතීතයේ සිදු වී අවසන් ව ගිය කර්මකට හවුල්කරුවෙක් වන්නේ යැයි යමෙක් පවසයි නම්, එහි තේරුම චේතනාත්මක ක්‍රියාව පිළිබඳ ඔහුට අල්ප මාත්‍ර වූ හෝ අවබෝධයක් නැති බව යි.

එහෙත් උත්සව, ප්‍රිය සම්භාෂණ ආදිය උදෙසා මස් පිණිස ඇණවුම් භාර දීමෙන් පසු ඒ හේතුවෙන් සතුන් මැරෙත් නම් එම ඇණවුම භාර දුන් පුද්ගලයාට හා එය අනුමත කළ උදවියට ප්‍රාණඝාත අකුසලය සිදු වෙයි.

20. ප්‍රශ්නය :

**එහෙත් මස් මාංශ අනුභවය හේතුවෙන් ඔහුට නො දැනුවත් ව හෝ ප්‍රාණඝාත අකුසලයක් සිදුවිය නො හැක්කේ ද?**

20. පිළිතුර :

පින්වත, යමෙක් නො දැන ප්‍රාණඝාතයක් සිදුවෙයි නම් ඔහු ගේ චේතනාව එයට සම්බන්ධව නැත. චේතනාව ම කර්මය වන බවත්, චේතනාව පහළ කොට කයින්, වචනයෙන්, මනසික් කර්ම රැස් කරන බවත් බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා වදාළ සදාකාලික සත්‍යය පිළිබඳ ඔබ තුළ යම්තමින් හෝ විශ්වාසයක් නැති ද?

පින්වත, අපගේ බුදුරජාණන් වහන්සේ වදාළ මේ දෙසුම ගැන බලන්න.

එක් කලක භාග්‍යවතුන් වහන්සේ නාලන්දාව සමීපයෙහි පාවාරික අඹ වනයෙහි වැඩ විසූ සේක. එකල නිගණ්ඨ නාතපුත්‍ර ගේ ශ්‍රාවකයෙකු වූ අසිබන්ධකපුත්ත ගාමණී නම් තැනැත්තෙක් භාග්‍යවතුන් වහන්සේ ව බැහැදකීමට පැමිණියේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඔහුගෙන් මෙකරුණ විමසූ සේක.

"පින්වත් ගාමණී, නිගණ්ඨ නාතපුත්තයන් තම ශ්‍රාවකයන් හට දහම් දෙසන්නේ කොයි ආකාරයෙන් ද?"

"ස්වාමීනි, නිගණ්ඨ නාතපුත්‍ර තෙමේ ශ්‍රාවකයින් හට දහම් දෙසන්නේ මේ ආකාරයෙනි. 'යම් කෙනෙක් ප්‍රාණඝාත කරත් ද, ඒ සියලු දෙනා ම අපාගත වන්නාහු ය. නිරයට ම යන්නාහු ය. යම් කෙනෙක් නො දුන් දෙය ගනිත් ද, ඒ සියලු දෙනා ම අපාගත වන්නාහු ය. නිරයට ම යන්නාහු ය. යම් කෙනෙක් වැරදි කාම සේවනයේ යෙදෙත් නම් ඒ සියලු දෙනා ම අපාගත වන්නාහු ය. නිරයට ම යන්නාහු ය. යම් කෙනෙක් බොරු බස් පවසත් නම්, ඒ සියලු දෙනා ම අපාගත වන්නාහු ය. නිරයට ම

යන්නාහු ය.

යම් කෙනෙක් යම් යම් දෙයක් බහුල බහුල වශයෙන් කරත් නම්, ඒ ඒ දෙයින් ඔහු අපායට පමුණුවනු ලැබේ.'

ස්වාමීනි, නිගණ්ඨ නාතපුත්‍ර තෙමේ තම ශ්‍රාවකයින් හට දහම් දෙසන්නේ ඔය ආකාරයට යි."

"පින්වත් ගාමණී, 'යම් කෙනෙක් යම් යම් දෙයක් බහුල බහුල වශයෙන් කරත් නම්, ඒ ඒ දෙයින් ඔහුව අපායට පමුණුවනු ලැබේ ය' යනුවෙන් නිගණ්ඨ නාතපුත්‍රයන් පවසන ඔය ප්‍රකාශය සත්‍යය නම් කිසිම කෙනෙක් අපායට නො යන්නේ ය. නිරයට නො යන්නේ ය.

ගාමණී, ඔබ මේ ගැන කුමක් සිතන්නෙහි ද? යම් කෙනෙක් ප්‍රාණීන් ඝාතනය කරයි නම්, දිවා රාත්‍රී දෙකෙහි ගත වෙන කාලය ගැන බලන විට, වැඩිපුර කාලයක් ඔහු ගත කොට තිබෙන්නේ ප්‍රාණඝාතය කිරීමෙන් ද, නො එසේ නම් ප්‍රාණඝාතය නො කිරීමෙන් ද?"

"ස්වාමීනි, යම් පුරුෂයෙන් ප්‍රාණඝාතය කරයි නම්, රෑ දවල් දෙකෙහි ගතවෙන කාලය ගැන බලන විට ඔහු ප්‍රාණඝාතයට හවුල් වන්නේ ටික වේලාවකට ය. නමුත් ඔහු ප්‍රාණඝාතය නො කරන කාලය ම යි වැඩි."

"එසේ නම් පින්වත් ගාමණී, යම් කෙනෙක් යම් යම් දෙයක් බහුල වශයෙන් කරත් නම්, ඒ ඒ දෙයින් ඔහු අපායට පමුණුවනු ලබන්නේ ය යන නිගණ්ඨ නාතපුත්ත ගේ ප්‍රකාශයට අනුව කිසි කෙනෙක් අපායට නො යන්නේ ය. නිරයට නො යන්නේ ය.....

එහෙත් පින්වත් ගාමණී, ඔවැනි ආකාරයෙන් දහම්

දෙසන්නා වූ ශාස්තෲවරයෙකු කෙරෙහි යම් කෙනෙක් පැහැදී සිටින විට ඔහු එම අදහස විශ්වාස කරයි. එවිට ඔහු මෙසේ සිතයි. 'මගේ ශාස්තෲන් වහන්සේ මේ අයුරින් පවසන මේ අදහසින් යුක්තව සිටින කෙනෙකි. එනම්; යම් කිසිවෙක් ප්‍රාණඝාත කරත් නම්, ඒ සියල්ලෝ ම අපායට යන්නාහු ය. නිරයට යන්නාහු ය. අහෝ! මවිසින් ද ප්‍රාණඝාතය කරන ලද අවස්ථා තිබේ. එසේ නම් එකරුණ හේතුවෙන් අහෝ! මා ද අපායට යන්නේ ය. නිරයට යන්නේ ය....' යන අදහස ඇති කරගනී.

එවිට පින්වත් ගාමණී, ඒ තැනැත්තා එම වචනය අත් නො හැර සිටියොත්, එම සිත අත් නො හැර සිටියොත්, එම දෘෂ්ටිය අත් නො හැර සිටියොත් ඔසවා ගෙන එන ලද බරක් බිම තබන්නාක් මෙන් ඔහු නිරයෙහි උපදින්නේ ය.

එහෙත් පින්වත් ගාමණී, අරහත් වූ, සම්මාසම්බුද්ධ වූ, විජ්ජාචරණ සම්පන්න වූ, සුගත වූ, ලෝකවිදූ වූ, අනුත්තර පුරිසධම්මසාරථී වූ, සත්ථා දේවමනුස්සානං වූ, බුද්ධ වූ, භගවත් වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි පහළ වන සේක. උන්වහන්සේ නොයෙක් ආකාරයෙන් ප්‍රාණඝාතය හෙළා දකියි. විශේෂයෙන් හෙළා දකියි. ප්‍රාණඝාතයෙන් වළකින්න යයි පවසා සිටිති.... සොරකමින් වළකින්න යයි පවසා සිටිති.... වැරදි කාම සේවනයෙන් වළකින්න යයි පවසා සිටිති.... බොරු කීමෙන් වළකින්න යයි පවසා සිටිති....

එවිට පින්වත් ගාමණී, යම් කෙනෙක් එම ශාස්තෲවරයා කෙරෙහි යම් පැහැදීමකින් යුතුව සිටින්නේ නම් ඒ තැනැත්තා මේ අයුරින් නුවණින් සලකයි.

"භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ආකාරයෙන් ප්‍රාණඝාතය හෙලා දකින සේක. විශේෂයෙන් හෙලා දකින සේක. ප්‍රාණඝාතයෙන් වළකින්න යයි පවසා සිටින සේක. එහෙත් මවිසින් ප්‍රාණඝාතය කරන ලද අවස්ථා තිබේ. මවිසින් යම් ප්‍රාණඝාතයක් කරන ලද්දේ ද ඒ තාක් ම දේ යහපත් නොවේ. හොඳ දෙයක් නම් නොවේ. මවිසින් එකරුණ හේතු කොට ගෙන විපිළිසර වන්නේ නම්, අකමැති වන්නේ නම්, මවිසින් අනාගතයේහි දී එවැනි පාප කර්ම නො කරන ලද්දේ වන්නේ ය."

හේ මේ අයුරින් නුවණින් සළකා ප්‍රාණඝාතය අත්හරී. අනාගතයෙහි ද ප්‍රාණඝාතයෙන් වැළකී සිටී. මේ අයුරින් එම පාප කර්මයේ ප්‍රහාණය සිදු වේ. මේ අයුරින් එම පාපකර්මය ඉක්ම යන්නේ වේ....

පින්වත් ගාමණී, මෙසේ ඒ තැනැත්තා ප්‍රාණඝාතයෙන් වළකී. සොරකමින් වළකී. වැරදි කාම සේවනයෙන් වළකී. බොරු කීමෙන් වළකී, කේළාම් කීමෙන් වළකී. එරුස වචන කීමෙන් ද වළකී. හිස් වචන කීමෙන් ද වළකී. අනුන් සතු දේ කෙරෙහි ලෝභ කිරීමෙන් ද වළකී. අනුන් ගේ දෙයට ආශා කිරීමෙන් තොරව වාසය කරයි. නපුරු සිතිවිලි බැහැර කොට ව්‍යාපාද රහිතව වාසය කරයි. මිත්‍යා දෘෂ්ටිය බැහැර කොට සම්මා දිට්ඨියෙන් යුතුව වාසය කරයි.

මෙසේ පින්වත් ගාමණී, ආර්ය ශ්‍රාවකයා අනුන් ගේ දෙයට ආශා කිරීමෙන් තොරව, ද්වේශ කිරීමෙන් තොරව, මුලා වීමෙන් තොරව, මනා සිහි නුවණින් යුක්තව, මෛත්‍රී සහගත චේතනාවන් සෑම දිශාවකට ම පතුරුවා වාසය කරයි. සියලු සතුන් වෙත මෙත් සිත පැතිරුණ සමාහිත සිතින් යුතුව අප්‍රමාණ ලෙස, අවෛරී ලෙස, තරහ සිතින්

තොරව, මෙත් සිත පතුරුවා හරී.

පින්වත් ගාමණී, එය වනාහී බලවත් පුරුෂයෙකු හක් ගෙඩියක් ගෙන ඉතා පහසුවෙන් සතර දිශාවට හරවා පිඹින්නාක් වැනි දෙයකි.”

*(සංයුත්ත නිකාය - සංඛධම සූත්‍රය)*

21. ප්‍රශ්නය :

**මස් මාංශ අනුභව කරන උදවිය ප්‍රාණඝාතයට හවුල්ව සිටින බව මම යළි යළිත් තරයේ කියා සිටිමි. එනිසා ඔබ වහන්සේ ගේ ඔය ප්‍රකාශයන් ගැන මම එකඟ නො වෙමි. ඒ ගැන ඔබ වහන්සේ කියන්නේ කුමක් ද?**

20. පිළිතුර :

පින්වත, ‘මස් මාංශ අනුභව කරන උදවිය ප්‍රාණඝාතයට ඍජුව හෝ වක්‍රව හෝ සම්බන්ධ වන්නේ ය’ යන ප්‍රකාශය ඔබ විසින් තරයේ පවසනු ලබයි. එවිට ඉතා බැරෑරුම් අයුරින් චෝදනා මුඛයෙන් ඔබ එය පවසන විට ඇතැම් කෙනෙක් ඒ ගැන පහදිනු ඇත. එය විශ්වාස කරනු ඇත. ඔබ කෙරෙහි පහදින පිරිස ඔබ ගේ ඒ ප්‍රකාශය අදහා ගනු ඇත. එවිට ඔහු මේ ආකාර වූ දෘෂ්ටියකට පැමිණෙනු ඇත.

“අසවල් කෙනා මේ අයුරින් කරුණු පවසයි. එනම්; ‘මස් මාංශ අනුභව කරන පුද්ගලයා ප්‍රාණඝාත අකුසලයට සම්බන්ධ වන්නේ ම ය. ඔහු සීලයෙන් දුරු වන්නේ ම ය. ඔහු දුසිල් පුද්ගලයෙක් ම ය’ යනුවෙනි.

අහෝ! මවිසින් ද නොයෙක් අවස්ථාවන් හි දී ආහාර පිණිස කරවල, මාළු, මස් ආදිය මිලට ගන්නා ලද්දේ ය.

පිස අනුභව කරන ලද්දේ ය. අනුන් විසින් පිසින ලද දෙය ද අනුභව කරන ලද්දේ ය.

අහෝ! එසේ වී නම්, මම ද බොහෝ කලක් මුළුල්ලෙහි ප්‍රාණඝාතයට සම්බන්ධ වී සිටි කෙනෙක්මි. සීලයෙන් තොරව සිටි කෙනෙක්මි. දුසිල් කෙනෙක්මි" යන චේතනාව ඔහු තුළ ඇති වේ. එම දෘෂ්ටිය ඔහු තුළ පිහිටයි. එම සිත ඔහු තුළ පිහිටයි.

ඉදින් ඒ තැනැත්තා ඒ වචනය අත් නොහැර සිටියොත්, එම සිත අත් නොහැර සිටියොත්, එම දෘෂ්ටිය අත් නො හැර සිටියොත් සැබැවින් ම ඔහුට මරණින් මතු අපායෙහි උපදින්නට එය හේතුවක් වනු ඇත. මක් නිසාද යත්, දෘෂ්ටිය වරදවා ගත් නිසා ය.

22. ප්‍රශ්නය :

**ඔබ වහන්සේ පවසන්නේ බුදුරජාණන් වහන්සේ පවා මස් මාළු වැළඳූ බව ද?**

22. පිළිතුර :

පින්වත, මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා ගැනීම පිණිස දැන් අපි මජ්ඣිම නිකායට අයත් 'ජීවක සූත්‍රය' ටිකෙන් ටික ඉගෙන ගනිමු.

මේ සූත්‍ර දෙසුමට අදාල නගරය වන්නේ රජගහ නුවර යි. නිගණ්ඨ නාතපුත්ත ගේ ශ්‍රාවකයන් බහුලව සිටින්නේ ද රජගහ නුවර ම ය. වර්තමානයේ පවා මෙම ප්‍රදේශයෙහි නිගණ්ඨ ශ්‍රාවකයෝ බොහෝ සිටිති. එකල ඔවුන් ගේ එක ම අභිප්‍රාය වූයේ බුදුරජාණන් වහන්සේ පිළිබඳව උස්ව පැතිරී ගිය මහා කීර්ති ඝෝෂාව මකා දැමීම

යි.

ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ වැඩසිටියේ ජීවක වෛද්‍යවරයා ගේ අඹ උයනෙහි ය. සද්ධර්මය හඳුනා නො ගත් අන්‍යාගමික ජනතාව තුළ බුදුරජාණන් වහන්සේ පිළිබඳව ඒ දිනවල පැතිර ගොස් තිබුනේ ඉතාමත් නින්දනීය කතාවකි. එම කතාව ජීවක වෛද්‍යතුමාට ද අසන්නට ලැබුණේ ය.

හෙතෙම දිනක් බුදුරජාණන් වහන්සේ බැහැදකින්නට ගියේ ය. උන්වහන්සේ බැහැදැක වන්දනා කොට එකත්පස්ව හිඳ මෙසේ පැවසීය.

"ස්වාමීනි, මා හට එක්තරා කාරණාවක් අසන්නට ලැබුණි. එනම් 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වෙනුවෙන් සතුන් මරති. එකරුණ දැන දැන ම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තමන් උදෙසා පිළියෙල කරන ලද මස් වළඳති කියා' ය.

ස්වාමීනි, ඔවුන් ඒ ආකාරයෙන් පවසන්නේ භාග්‍යවතුන් වහන්සේට අදාළ සත්‍ය වූ දෙයක් ද? නැතහොත් ඔවුන් විසින් කරනු ලබන්නේ භාග්‍යවතුන් වහන්සේට කරුණු රහිතව අභූතයෙන් නගන්නා වූ චෝදනාවක් ද? එසේත් නැත්නම් ධර්මානුකූලව විමසා බලා පවසන කාරණාවක් ද? කරුණු සහිතව පෙන්වා දී බැහැර කළ නො හැකි කාරණාවක් ද?"

ජීවක විසින් අසල ලද මෙම ප්‍රශ්නයෙන් එක දෙයක් පැහැදිලිව පෙනේ. එනම් උන්වහන්සේ මස් මාංශ වළඳන කෙනෙක් බව යි. නිර්මාංශ ආහාර වළඳන කෙනෙකු ඒ ආකාරයෙන් චෝදනා ලබයි ද? අද පවා එළවලු ආහාර පමණක් ගන්නා උදවිය කොතෙකුත් සිටිති. ඔවුන් හට

කිසිවෙක් හෝ ඔය ආකාරයෙන් චෝදනා කරත් ද? අඩු ගණනේ කරවල කෑල්ලක් හෝ අනුභව කරන උදවියට නො වේද මෙවැනි චෝදනා ලැබෙන්නේ ?

සායිබාබා අදහන බැතිමතුන් බොහෝ දෙනෙක් නිර්මාංශ ආහාරයෙන් යැපෙත්. නමුත් පුට්ටපර්තිහි ප්‍රශාන්ති නිලයම් නම් වූ එතුමා වසන මාලිගයෙහි එතුමා වාඩිවෙන ආසනය යට අතුරා තිබෙන්නේ ව්‍යාඝ්‍රයෙකු ගේ සම්පූර්ණ හිස සහිත වූ ඉතාමත් වටිනාකමක් ඇති ව්‍යාඝ්‍ර සමකි. එහෙත් කිසිදු නිර්මාංශ ආහාර භක්තිකයෙක් ඒ හේතුවෙන් එතුමා ප්‍රාණඝාතයට වක්‍රාකාරයන් හෝ අනුබල දී ඇතැයි චෝදනා නො කරති. එයට හේතුව ඔවුන් එතුමා කෙරෙහි ඉතාම භක්තිමත්ව සිටීම යි. එහෙත් අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් ව්‍යාඝ්‍ර සම් ආදිය පරිහරණය කිරීම පවා තහනම් කරන ලද දෙයකි. මක් නිසාද යත්; සම් ලබා ගැනීම පිණිස ද ව්‍යාඝ්‍රාදී සත්තු මරණයට පත් කරනු ලබති.

බොහෝ විට මස් මාංශ අනුභවය ත් ප්‍රාණීන් ඝාතනය කිරීම ත් එක ම අර්ථයෙහි ලා සලකන්නට යෑම නිසා ය මෙම පටලැවිල්ල සිදු වී තිබෙන්නේ. බුදුරජාණන් වහන්සේට මෙන් ම භික්ෂු සංඝයාට ද කොයිතරම් නින්දා අපහාස පැමිණිය ද, 'පින්වත් මහණෙනි, නිර්මාංශී වන්න!' කියා විනය නීතියක් නො පණවා වදාළේ එනිසා ම ය. යම් හෙයකින් එවැනි විනය නීතියත් පනවා වදාළ සේක් නම් අද අපට මෙම චතුරාර්ය සත්‍යය ධර්මය ඒ ආකාරයට දැන ගන්නට නො ලැබෙනු නියත ය. එසේ වූයේ නම් මේ වන විට ඉතිරි වන්නේ එළවළු භාවිතයෙන් ව්‍යඤ්ජන හදා ගන්නා සූප ශාස්ත්‍ර වට්ටෝරු පමණි.

ජීවකගෙන් අසන්නට ලැබුන ඒ අසාධාරණ චෝදනාව ගැන භාග්‍යවතුන් වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක.

"පින්වත් ජීවක, යමෙක් මෙසේ කියත් නම්, 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වෙනුවෙන් මිනිස්සු සතුන් මරති. එකරුණ දැන දැන ම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තමන් උදෙසා පිළියෙල කරන ලද මස් වළඳත්' ය කියා. එම කරුණ පවසන ඔවුහු මවිසින් පවසන ලද්ද කියන අය නො වෙති. ඔවුහු මා හට අසත්‍යයෙන්, අභූතයෙන් චෝදනා කරත් ම ය.

පින්වත් ජීවක, මම වනාහී තුන් කෙලවරකින් යුක්ත මාංශය අනුභව නො කළ යුතු යැයි පවසමි. එනම්; (යම් මාංශයක් තමා උදෙසා මරණ ලද බවට) දක්නා ලද්දේ වේ ද, අසනා ලද්දේ වේ ද, සැක කරන ලද්දේ වේ ද මේ තුන් කෙළවරින් යුතු මාංශය අනුභව නො කළ යුතු යැයි පවසමි.

පින්වත් ජීවක, මම වනාහී තුන් කෙලවරකින් යුක්ත මාංශය අනුභව කළ යුතු යැයි පවසමි. එනම්, (යම් මාංශයක් තමා උදෙසා මරණ ලද බවට) නො දක්නා ලද්දේ වේ ද, නො අසනා ලද්දේ වේ ද, සැක නො කරන ලද්දේ වේ ද මේ තුන් කෙළවරින් යුතු මාංශය අනුභව කළ යුතු යැයි පවසමි."

*(මජ්ඣිම නිකාය - ජීවක සූත්‍රය)*

23. ප්‍රශ්නය :

(අදිට්ඨ) නො දක්නා ලද්දේ වේ ද, (අසුත) නො අසනා ලද්දේ වේ ද, (අපරිසංකිත) සැක නො කරන

ලද්දේ වේ ද යන මෙය ත්‍රිකෝටික පාරිශුද්ධ මාංශය යැයි කියනු ලබන බව අපි දනිමු. එහෙත් ඉතින් ඔවැනි මසක් ලැබෙන්නට නම්, සතෙකු හදිසි අනතුරකින් වත් මරණයට පත් විය යුතුයි නේද? එසේ නැතිව ත්‍රිකෝටික පාරිශුද්ධ මාංශයක් කෙසේ නම් ලබන්නට ද? ඒ තුළින් බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළේ එවැනි මාංශයක් නො ලැබිය හැකි බව නො වේ ද?

23. පිළිතුර :

පින්වත, වහෙන් ඔරෝ භාෂාවෙන් කතා කිරීමක් බුදුවරයන් වහන්සේලා තුළ නැති බව අප පළමුවෙන් ම තේරුම් ගෙන තිබීම වැදගත් ය. ත්‍රිකෝටික පාරිශුද්ධ මාංශය අනුමත කොට වදාළේ කුමන කරුණක් මත දැයි ඔබ දන්නවා ද?

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර මහා වනයේ කූටාගාර ශාලාවෙහි වැඩ වසන සේක. එකල නිගණ්ඨ නාතපුත්‍ර ගේ ශ්‍රාවකයෙකු වූ සීහ නම් සේනාපතියෙකුට භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ අසන්නට ලැබුනේ ය. හේ නිගණ්ඨ නාතපුත්‍ර වෙත ගොස් භාග්‍යවතුන් වහන්සේව බැහැදකින්නට යෑම පිණිස අවසර ඉල්ලා සිටියේ ය. එවිට නිගණ්ඨ නාතපුත්‍ර තෙමේ සීහ සේනපති හට මෙම කතාව පවසා සිටියේ ය.

"එම්බා සීහ, ක්‍රියාවාදී තොප කවර කරුණක් නිසා අක්‍රියවාදී වූ ශ්‍රමණ ගෞතමයන් දක්නට යන්නෙහි ද? සීහය, ශ්‍රමණ ගෞතමයන් වනාහී අක්‍රියවාදී කෙනෙකි. හේ ක්‍රියාවන් නො කිරීම පිණිස බණ කියන කෙනෙකි. ශ්‍රාවකයින් ව හික්මවන්නේ ද, එම ක්‍රමයෙනි."

මෙසේ කී කල්හි සීහ සේනාපති හට භාග්‍යවතුන් වහන්සේ දක්නට යෑමේ කැමැත්ත සංසිඳ ගියේ ය. තුන් වතාවක් ම අවසර ඉල්ලූ විට නිගණ්ඨ නාතපුත්‍රයා දුන්නේ එම පිළිතුර යි.

දිනක් සීහ සේනාපති නිගණ්ඨ නාතපුත්‍රට නො දන්වා භාග්‍යවතුන් වහන්සේ බැහැදකින්නට ගියේ ය. නිගණ්ඨ නාතපුත්‍ර භාග්‍යවතුන් වහන්සේ පිළිබඳව කරන ලද ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව විමසා සිටියේ ය. එකරුණ මුල් කොට භාග්‍යවතුන් වහන්සේ ඉතා මධුර වූ දෙසුමක් වදාළ සේක. මහාවග්ග පාළියෙහි භේසජ්ජක්ඛන්ධකයෙන් එය විස්තර වශයෙන් දැනගත හැකි ය. එම දේශනය අවසානයේ සීහ තිසරණයෙහි පිහිටියේ ය. බුදුරජාණන් වහන්සේ ගේ ගිහි ශ්‍රාවකයෙක් බවට පත් වූයේ ය. ඔහු සිය කැමැත්තෙන් ම තෙරුවණ් සරණ ගිය කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"පින්වත් සීහ, සිතා මතා ක්‍රියා කරන්න. ඔබ වැනි ප්‍රසිද්ධ උදවිය සිතා මතා ක්‍රියාකිරීම සුදුසු ය."

මෙයින් සීහ සේනාපති තවදුරටත් පැහැදුනේ ය. හේ නැවතත් තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයෙක් ම බවට ප්‍රතිඥා දුන්නේ ය. එවිට බුදුරජාණන් වහන්සේ වදාළේ නිගණ්ඨයින් හට පෙර පරිද්දෙන් ම ඇප උපස්ථාන කිරීම කළ යුතු බව යි. එවිට සීහ තෙමේ විස්මයට පත් වූයේ ය. අදහාගත නොහැකි වූ හේ මෙසේ පැවසීය.

"අනේ! ස්වාමීනි, මා මෙතෙක් ම ඔබ වහන්සේ ගැන අසා තිබුනේ මෙයට හාත්පසින් ම වෙනස් වූ දෙයකි. එනම්, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙසේ පවසති. එනම්

'මට ම දන් පැන් දිය යුතුය. අන් කිසිවෙකුට හෝ දන් නො දිය යුතුය. මගේ ශ්‍රාවකයින්ට පමණක් ම දන් දිය යුතුය. අන්‍ය වූ ශ්‍රාවකයන් හට දන් පැන් නො දිය යුතුය' කියා ය. එමෙන් ම 'මට දෙන දානය ම මහත් ඵල වේ. අනුන්ට දෙන දානය මහත්ඵල නොවේ. මාගේ ශ්‍රාවකයන්ට දෙන දානය මහත්ඵල වේ. අන්‍ය වූ ශ්‍රාවකයන් හට දෙන දානය මහත්ඵල නො වේ' කියා ය.

එහෙත් භාග්‍යවතුන් වහන්සේ වනාහී නිගණ්ඨයින් හට පවා දන් පැන් දීම පිණිස මා සමාදන් කරවන සේක" යි පවසමින් යළිත් වතාවක් තෙරුවන් සරණ ගියේ ය.

මේ තුළින් එක දෙයක් පැහැදිලිව පෙනේ. එනම් අන්‍යාගම්කාර පිරිස් බුදුරජාණන් වහන්සේට දන්පැන් ලැබීම ගැන පවා ඊර්ෂ්‍යාවෙන් පසුවුන බව යි. එනිසා ය ඔවුන් විසින් මෙවැනි නොයෙක් ආකාරයෙන් අසත්‍යය වූ කටකතාවන් පතුරුවා හැර තිබෙන්නේ.

එදින බුදුරජාණන් වහන්සේ සීහ සේනාපතිට චතුරාර්ය සත්‍යය පිළිබඳ දේශනාවක් වදාළ සේක. එම දේශනාව අවසානයේ සීහ තෙමේ සෝවාන් ඵලයට පත් වූ ශ්‍රාවකයෙකු බවට පත් වීය. දැන් සීහ පෘතග්ජන කෙනෙක් නොවේ. මාර්ගඵල ලාභී ශ්‍රාවකයෙකි. ආර්ය සම්මා දිට්ඨියෙන් යුක්ත වූ කෙනෙකි.

නිගණ්ඨ නාතපුත්‍ර යනු කවරෙක් ද කියා ඔබ දන්නවා ද? ඔහු සමථ භාවනාවෙන් ලබන ධ්‍යාන ගැනවත් අවබෝධයක් නො තිබුණු කෙනෙකි. වරක් ඔහු චිත්ත ගෘහපති නම් වූ අනාගාමී ශ්‍රාවකයා හට පවසා සිටියේ විතක්ක විචාර රහිත වූ ධ්‍යාන නොමැති බව යි. ඔහු තම

ආගම වශයෙන් ඉදිරිපත් කරන ලද්දේ නිර්මාංශ ආහාරයෙන් යැපීම යි. එමෙන් ම ඔහු තාපස නායකයෙකි. නිරුවත් තවුසෙකි. එම ධර්මය අදහාගෙන ඔහු ගේ ශ්‍රාවකයෙක් බවට පත් වී සිටි සීහ සේනාපතියා තෙරුවන් සරණට පැමිණියේ අවබෝධයෙන් ම ය. සෝවාන් ඵලයට පත්වීමෙන් ආර්ය වූ සම්මා දිට්ඨියෙන් යුක්ත වීම නිසා ඔහු තුළින් සංයෝජන තුනක් ප්‍රහාණය වී ගියේ ය. එනම්; සක්කාය දිට්ඨිය ත්, විචිකිච්ඡාව ත්, සීලබ්බත පරාමාසය ත් ය. 'ආහාරයෙන් සත්වයා ගේ පිරිසිදු බව සිදු වේ' යන අදහස සීලබ්බත පරාමාසයට අයත් දෙයකි. එවැනි අදහසකට බැඳී ගිය පුද්ගලයා එය ම ග්‍රහණය කර ගන්නවා මිස එයින් නිදහස් වීමක් සිදු නොවේ. නමුත් දැන් සීහ තුළ එවැනි අදහස් නැත. ඔහු සත්‍යාසත්‍යය මැනවින් තෝරා බේරා ගත හැකි, නුවණින් මෙනෙහි කිරීමේ කුසලතා ඇති ප්‍රඥාවන්ත බෞද්ධ ශ්‍රාවකයෙකි.

සීහ සේනාපති බුදු දහම වැළඳගත් පුවත විශාලා මහනුවර සිටි නිගණ්ඨ ශ්‍රාවකයින් අතර ලැව්ගින්නක් සේ පැතිරී ගියේ ය. එදා සීහ සේනාපති විසින් අපූරු දෙයක් කරන ලදී. එනම් තමන් නිගණ්ඨ නාතපුත්‍රගෙන් ඉගෙන ගත් නිර්මාංශ දෘෂ්ටිය අත්හැරීම යි. සැබැවින් ම ඔහු හට එයින් සෙතක් සැලසුනේ නම් හේ එම දෘෂ්ටිය කිසිසේත් අත් නො හරින්නේ ම ය.

සීහ තෙමේ භාග්‍යවතුන් වහන්සේට භික්ෂු සංඝයා සමඟ පසු දින තමන් ගේ නිවසේ දානයට වඩින්න යැයි ආරාධනා කළේ ය. හේ නිවසට ගොස් 'සගය, යන්න. කඩපිලට ගොස් විකිණීමට තිබෙන මසක් ගෙනෙන්න.' කියා සේවකයෙකු කඩ පිලට පිටත් කොට යැවීය. දානය

පිළියෙල වූ පසු භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග සීහ සේනාපති ගේ නිවසට වැඩම කළ සේක.

දානය පිළිගන්වන වේලෙහි තැති ගත් පුරුෂයෙක් මහත් කලබලයකින් යුතුව සීහ සේනාපති වෙත පැමිණියේ ය. "ස්වාමීනි, දන්නෙහි ද? බොහෝ නිගණ්ඨයෝ විශාලා මහනුවර හංදියක් ගානේ රැස් වී දෙ අත් අහසට ඔසවා ගෙන 'අහෝ! අද සීහ සෙන්පතියා විසින් තරබාරු සිව්පාවෙකු මරා ශ්‍රමණ ගෞතමයන් හට බතක් පිසින ලද්දේ ය. ශ්‍රමණ ගෞතම තෙමේ ද තමන් උදෙසා මරණ ලදැයි යන මෙකරුණ දැන දැන ම තමන් උදෙසා මරා පිළියෙල කරන ලද මස් අනුභව කරන්නේ ය' කියා හඬමින් වැළපෙමින් සිටිති."

"සගය, කම් නැත. ඔය නිගණ්ඨයන් බොහෝ කලක් මුළුල්ලෙහි සිට ම භාග්‍යවතුන් වහන්සේ හට අගුණ කියනු කැමතිව සිටිති. ධර්මයෙහි ද අගුණ කියනු කැමතිව සිටිති. සංඝයා ගේ අගුණ කියනු කැමතිව සිටිති. අප ගේ භාග්‍යවතුන් වහන්සේ හට අසත්‍යයෙන්, හිස් කරුණෙන්, බොරුවෙන්, අභූතයෙන් කරන්නා වූ ඔය චෝදනා ඒ උදවියටවත් දිරවා ගත නොහැකි ය. අපි වනාහී ජීවිත හේතුවෙන් වත් දැන දැන ප්‍රාණියෙකු ගේ ජීවිතය නො නසන්නෙමු."

*(මහාවග්ග පාළි - භේසජ්ජක්ඛන්ධකය)*

දැන් ඔබ මොහොතක් සිතා බලන්න. එදා බුදුජාණන් වහන්සේ දන් පැන් වළඳා එම නිවසින් එළියට වඩිනා විට සතුන් වෙනුවෙන් හඬා වැළපෙමින් පෙළපාලි යන අර නිගණ්ඨ පිරිස කුමන අයුරින් කටයුතු කරන්නට ඇත් ද? යම් හෙයකින් ඔබ එදා එතැන සිටියේ නම්, ඒ නිගණ්ඨයන් ගේ පෙළපාලියට සම්බන්ධ නො වන්නහු ද? ඔබ ගන්නේ

කවරෙකුගේ පැත්ත ද? නිගණ්ඨ ශ්‍රාවකයින් ගේ නින්දා අපහාස අවලාද ඉදිරියේ බියට පත් වී අසත්‍යය වැළඳ ගන්නහු ද? එහෙත් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවලට මුලා වී හෝ අලාභ නින්දා අපහාස වලට බිය වී හෝ අසත්‍යය වැළඳ ගැනීම සම්මා දිට්ඨියෙන් යුතු ශ්‍රාවකයන් ගේ ස්වභාවය නොවේ. මෙපමණ දරුණු සමාජ විවේචන මධ්‍යයෙහි වුව ද, බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයාට නිර්මාංශී වීම වෙනුවෙන් නො පෙළඹවූ සේක.

එහෙත් එකරුණ මුල් කරගෙන උන්වහන්සේ භික්ෂු සංඝයා රැස් කරවූ සේක. "පින්වත් මහණෙනි, තමන් උදෙසා මරණ ලදැයි දැන දැන, තමන් උදෙසා පිළියෙල කරන ලද යම් මසක් වේ නම්, එය නො වැළඳිය යුතුය. යමෙක් එය වළඳන්නේ නම් ඔහුට 'දුක්කට ආපත්තතියකි'.

පින්වත් මහණෙනි, තමන් උදෙසා මරණ ලද යි නො දක්නා ලද්දේ ද, නො අසන ලද්දේ ද, සැක නො කරන ලද්දේ ද මෙම තුන් කෙලවර පිරිසිදු මත්ස්‍යය මාංශ (**ත්‍රිකෝටි පාරිසුද්ධං මච්ඡ මංසං**) අනුභව කිරීම අනුමත කරමි."

බුදුරජාණන් වහන්සේ විසින් ත්‍රිකෝටි පාරිශුද්ධි මාංශය අනුමත කරන ලද්දේ මෙතැන දී ය.

අපට හිතෙන හිතෙන පිළිවෙලට අප ගේ රුචි අරුචිකම් වලට අනුව අප දරන්නා වූ විවිධ මතිමතාන්තර වලට අනුව අප ගේ පුද්ගලික ආකල්ප වලට අනුව ගලපන්නට වුවමනා පරිද්දෙන් බුදුරජාණන් වහන්සේ නමක ගේ ධර්ම විනය භාවිත කිරීමට පෙළඹීම තමන්ට ම අහිත පිණිස හේතුවන කරුණක් බව කරුණාවෙන් සැලකුව

මැනැව.

24. ප්‍රශ්නය :

**ඔය ත්‍රිකෝටි පාරිශුද්ධ මාංශය යනු මස් රසයට ගිජු වූ භික්ෂූන් විසින් පසු කලක දී ගොතා ගන්නා ලද සඟ ගැටයක් නො විය හැක්කේ ද?**

24. පිළිතුර :

පින්වත, දැන් කාලයේ බොහෝ දෙනෙක් කරන්නේ තමන් බැඳී සිටින, තමන් ග්‍රහණය වී සිටින, තමන් රුචි කරන්නා වූ අදහසට නො ගැලපෙන තමන්ට ඕනෑ පිළිවෙලට අර්ථ දක්වා ගන්නට නො හැකිවෙන කරුණු ධර්ම විනයෙහි තිබෙනු දක්නා විට 'ඔය සඟ ගැටයක් නෙව' කියමින් තථාගත ධර්ම විනය ම බැහැර කිරීම යි.

වර්තමානයෙහි ඔය චෝදනා කරන සියලු දෙනා ම පෘථග්ජන උදවිය වෙති. ධර්මය කෙරෙහි විචිකිච්ඡා ඇති ඔවුහු ඕනෑම වෙලාවක තම මතය උදෙසා තෙරුවනට ගර්හා කිරීමට සූදානම්ව සිටිති. ධර්ම විනය මැනවින් නො හදාරා තම තමන් ගේ පෞද්ගලික මත හුවා දක්වන්නට ගොස් ධර්ම විනය බැහැර කිරීම අනතුරුදායක දෙයක් නො වේද?

25. ප්‍රශ්නය :

**ඔබ වහන්සේ කෙසේ කීවත් බුදුරජාණන් වහන්සේ ගේ මහාකරුණාවට ඔය ත්‍රිකෝටි පාරිශුද්ධ මාංශ කතාව නම් ගලපාලිය නො හැක්කේ ය.**

25. පිළිතුර :

පින්වත, ඔබ බුදුරජාණන් වහන්සේ ගේ මහාකරුණාව හඳුනාගත් මිම්ම කුමක් ද? සාමාන්‍යයෙන් පුද්ගලයෙකු අනුභව කරන ආහාර වට්ටෝරුව දෙස බලා එම පුද්ගලයා ගේ ගතිගුණ අවබෝධ කරගැනීමට යමෙක් සිතන්නේ නම් එයින් ඔහු ගේ බුද්ධියේ ප්‍රමාණය සිතා ගත හැකි ය.

අප ගේ භාග්‍යවතුන් වහන්සේ පෙන්වා වදාළ ත්‍රිකෝටි පාරිශුද්ධ මාංශය යනු කුමක්ද කියා වත් හරිහැටි තේරුම් ගත නො හැකි ඔබ ඒ තුළින් ද බුදුරජාණන් වහන්සේ ගේ මහා කරුණාව සොයන්නේ?

පින්වත, බුදුරජාණන් වහන්සේ ගේ මහාකරුණාව යන්තමින් හෝ තේරුම් ගන්නට නම් මෙවැනි දෙසුමක් වත් වටහා ගත මැනව.

"පින්වත් ආනන්ද, මේ ක්‍රමයෙන් ද මෙකරුණ අවබෝධ කරගත යුතුය. එනම් මෙම නිවන් මග සම්පූර්ණයෙන් ම රඳා පවතින්නේ කළ්‍යාණ මිත්‍රත්වය මත ය. කළ්‍යාණ සහායකයන් මත ය. කළ්‍යාණ මිත්‍රයන් ගේ ඇසුරට නැඹුරු වීම මත ය.

පින්වත් ආනන්ද, ඉපදීම ස්වභාව කොට සිටින සත්වයෝ කළ්‍යාණ මිත්‍ර වූ මා කරා පැමිණ ඉපදීමෙන් නිදහස් වෙති. ජරාවට පත්වීම ස්වභාවය කොට සිටින සත්වයෝ කළ්‍යාණ මිත්‍ර වූ මා කරා පැමිණ ජරාවෙන් නිදහස් වෙති. මරණය ස්වභාව කොට සිටින සත්වයෝ කළ්‍යාණ මිත්‍ර වූ මා කරා පැමිණ මරණයෙන් නිදහස් වෙති. සෝක, වැළපීම්, දුක්-දොම්නස්, සුසුම් හෙළීම් ස්වභාවය කොට සිටින සත්වයෝ කළ්‍යාණමිත්‍ර වූ මා කරා පැමිණ ඒ ශෝක, වැළපීම්, දුක්-දොම්නස්, සුසුම්

හෙළීම් වලින් නිදහස් වෙති."

*(සංයුත්ත නිකාය - උපඩ්ඪ සූත්‍රය)*

බුදුරජාණන් වහන්සේ ගේ මහාකරුණාවේ ස්වභාවය ගැන කෙනෙකුට මෙවැනි දෙසුම් තුළින් යාන්තමින් හෝ තේරුම් ගත හැකි නම් එය මහත් ලාභයකි.

මෙම සාංසාරික ජීවිතය තුළ කෙනෙක් දිගින් දිගට ම පෘතග්ජනයෙක් වශයෙන් රැඳී සිටියහොත් ඔහු ගේ ඊළඟ ජීවිතයේ උපත නිරයේ සිදුවන්නට පුළුවනි. තිරිසන් යෝනියේ හෝ ප්‍රේත යෝනියේ හෝ උපත ලබන්නට පුළුවනි. සසරෙහි වැටුණු පෘථග්ජන සත්වයෙකු ගේ බරපතල අනතුර නම් සතර අපායෙහි ඉපදීම පිණිස ඔහු ඉදිරියේ ඇති ඉඩකඩ යි.

එම අනතුරින් ඔහුව මුදවා ගැනීම පිණිස ඔහු කෙරෙහි අනුකම්පා ඇති කෙනා කළ යුත්තේ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කිරීම පිණිස ඔහුව යොමු කිරීම යි. එසේ නැතිව එම අනතුර සම්පූර්ණයෙන් ම සඟවා දමා ධර්මයේ හැසිරීම යනු 'නිර්මාංශ ආහාර අනුභවය ම' ය යනා දී වශයෙන් නිර්මාංශ ආහාර වෙනුවෙන් ම ධර්මයේ හැසිරීම කැප කිරීම තුළින් ඔහු නො මඟ යයි. එය දෘෂ්ටි වශයෙන් ගනී. එය ගලපා ලීමට මහන්සි ගනී.

එහෙත් ඔහු චතුරාර්ය සත්‍යය අවබෝධ නො කරන්නේ නම් යම්හෙයකින් ඊළඟ ජීවිතයේ දී මාංශ භක්ෂක තිරිසන් සතෙකුව උපත ලැබුවහොත් ඔහු ගේ නිර්මාංශ ප්‍රතිපදාව එතැනින් ම අවසන් වී යනු ඇත.

සැබැවින් ම ඔබ කළ යුත්තේ එය නොවේ. නිර්මාංශව හෝ වේවා, එසේ නො වී හෝ වේවා, ඔබ කළ යුත්තේ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගැනීමට මහන්සි

ගැනීම යි. සද්ධානුසාරී, ධම්මානුසාරී ආදී සෝවාන් මාර්ගයට පැමිණීමට මහන්සි ගැනීම යි. ඒ තුළින් ඔබ ලබන ධාර්මික රැකවරණය එළවළු ආහාරයෙන් කිසිදා ලැබිය නො හැකිය. මාංශ ආහාරයෙන් ද ලැබිය නො හැකි ය.

යම් හෙයකින් ඔබ අවසන් හුස්ම හෙළීමට පෙර සෝවාන් ඵලයට පත් ශ්‍රාවකයෙකු බවට පත්වුව හොත් සදහට ම සතර අපායෙන් නිදහස් වනු ඇත. එවිට ඔබ සදාකාලික රැකවරණයට පත් වූ කෙනෙක් වනු ඇත. දෙව් මිනිස් දෙ ගතියෙහි පමණක් සත් වතාවක් සීමා කොට උපදිනු ඇත. මේ ගෞතම ශාසනයේ දී ම සසර දුකින් එතෙර වනු ඇත. බුදුරජාණන් වහන්සේ ගේ මහා කරුණාව කුමක් දැයි ඔබ තේරුම් ගත යුත්තේ එළවළු ආහාර අනුභවයෙන් නොව, චතුරාර්ය සත්‍යාවබෝධයේ වටිනාකම සලකා බැලීමෙන් ය.

එසේ නැතිව ඔබ සිතා සිටින්නේ සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පුරාවට පාරමී ධර්මයන් සපුරා උන්වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත් වී වදාළේ නිර්මාංශ ආහාර අනුභවය ගැන පාඩම් මාලාවක් කියා දීම පිණිස කියා ද?

**26. ප්‍රශ්නය :**

**එහෙත් ඔය කියන ත්‍රිකෝටි පාරිශුද්ධ මාංශය ගැන නො දන්නා අය දානයක් පිණිස මස් මාංශ පිළියෙල කිරීමට ගොස් කිසි භයක් නැතුව සතුන් මැරුව හොත් ඒ පව ඔවුන්ට අයිති නො වන්නේ ද?**

26. පිළිතුර :

පින්වත, ඔය කරුණ අප ගේ බුදුරජාණන් වහන්සේ ජීවක වෛද්‍යවරයා හට ඉතා පැහැදිලි ලෙස මෙසේ පැවසූ සේක.

"පින්වත් ජීවක, යමෙක් තථාගතයන් වහන්සේ උදෙසා හෝ තථාගත ශ්‍රාවකයන් උදෙසා හෝ යයි පවසමින් ප්‍රාණඝාතය කරත් නම් ඒ තැනැත්තා කරුනු පසකින් බොහෝ පව් රැස්කර ගන්නේ ය.

1. 'යන්න. අසවල් නම් ඇති ප්‍රාණියාව මරණු පිණිස රැගෙන එන්න' කියා යමෙක් කියයි නම් මෙම පළමු කරුණින් ම බොහෝ පව් රැස් වන්නේ ය.

2. ඒ ප්‍රාණියා මරණ බියෙන් තැති ගෙන වෙව්ලද්දී ගෙලෙන් බැඳගෙන එනු ලබන විට ඒ ප්‍රාණියා යම් දුක් දොම්නසක් විඳින්නේ වේ ද, මෙම දෙවන කරුණින් ද බොහෝ පව් රැස්වන්නේ ය.

3. යමෙක් 'මේ ප්‍රාණියාව මරා දමන්න' යි විධාන කරන්නේ වේ ද, මෙම තුන්වෙනි කරුණින් ද බොහෝ පව් රැස්වන්නේ ය.

4. එම ප්‍රාණියා මරණු ලබන කල්හි යම් දුක් දොම්නස් විඳින්නේ වේ ද, මෙම සිව්වන කරුණින් ද බොහෝ පව් රැස් වන්නේ ය.

5. යමෙක් තථාගතයන් වහන්සේට හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේලාට හෝ අකැප මස් වළඳන්නේ ය යන චෝදනාව කරන්නේ නම්, මෙම පස්වන කරුණින් ද බොහෝ පව් රැස්වන්නේ ය.

*(මජ්ඣිම නිකාය - ජීවක සූත්‍රය)*

මෙයින් ඉතා ම පැහැදිලිව පෙනෙන්නේ කවර

හේතුවක් නිසා වත් ප්‍රාණඝාතය නො කළ යුතු බව යි. ඉතින් ත්‍රිකෝටික පාරිශුද්ධ මාංශයෙන් පව් සිදුවෙන්නේ නැත. එනිසා අප සතුන් මරන්නේ අප පිණිස නො වේය, දානයක් පිණිස යැයි කියා යමෙක් සතුන් මරත් නම්, ඔහුට ප්‍රාණඝාත අකුසලයෙන් නිදහස් වීමක් නැත.

එමෙන් ම මස් මාංශ අනුභවයෙන් ප්‍රාණඝාතයට වක්‍රාකාරයෙන් හෝ රුකුලක් වන්නේ නම්, භාග්‍යවතුන් වහන්සේ කිසිසේත් ම මස් මාංශ නො වළඳන සේක. එහෙත් උන්වහන්සේ මස් මාංශ වැළඳූ බව සාමාන්‍ය දෙයකි. එය ප්‍රශ්නයක් වී තිබෙන්නේ එළවළු අනුභව කිරීම නිවන් මඟ වශයෙන් පිළිගත් උදවියට ය. සිල්වත් කම ත්, ගුණවත් කම ත් මනින මිම්ම වශයෙන් එළවළු අනුභවය තෝරා ගෙන සිටීම තුළ බොහෝ දෙනෙක් නො මඟ යන්නේ සීලය හඳුනාගැනීමට නො හැකි වීමෙන් ය.

27. ප්‍රශ්නය :

**බුදුරජාණන් වහන්සේ වැළඳීම පිණිස මස් පිළිගත් බව සඳහන් වන තැන් ධර්මයෙහි තිබේ ද?**

27. පිළිතුර :

එසේය පින්වත. එක්තරා අවස්ථාවක දී භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩවිසූ සේක. එකල්හි සෝතාපන්න ගිහි ශ්‍රාවකයෙකු වන උග්ග ගෘහපතියා භාග්‍යවතුන් වහන්සේ උදෙසා අපූරු ආකාරයට දානයක් පිළියෙල කළේ ය. ඔහු එම දානය පිළිගැන්වූයේ බුදුරජාණන් වහන්සේ වදාළ එක්තරා බණ පදයක් ගැන පවසමින් ය.

"ස්වාමීනි, මවිසින් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි ම අසන ලද, භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි දී ම පිළිගන්නා ලද කරුණක් තිබේ. එනම්; 'මනාප දේ දන් දෙන තැනැත්තා මනාප දෙය ම ලබන්නේ ය' යන බණ පදය යි.

ඉතින් භාග්‍යවතුන් වහන්ස, මා හට සල්පුප් කැවුම් ඉතා මනාප ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා උපදවා මාගේ සල්පුප් කැවුම් පිළිගන්නා සේක්වා!"

ඊළඟට උග්ග තෙමේ මෙසේ පැවසුවේ ය. "ස්වාමීනි, මවිසින් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි ම අසන ලද කරුණක් තිබේ. එනම් 'මනාප දේ දන් දෙන තැනැත්තා මනාප දෙය ම ලබන්නේ ය' යන බණ පදය යි.

ඉතින් භාග්‍යවතුන් වහන්ස, මා හට ඩෙබරපල මුසු කළ උෟරු මස ඉතා මනාප ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා උපදවාගෙන මාගේ ඩෙබරපල මුසු කළ මේ උෟරු මස පිළිගන්නා සේක්වා!"

භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා උපදවා පිළිගත් සේක.

*(අංගුත්තර නිකාය - මනාපදායී සූත්‍රය)*

මෙයින් තවදුරටත් පැහැදිලිව පෙනෙන්නේ බුදුරජාණන් වහන්සේ මස් මාංශ වළඳා තිබෙන බව නො වේද? නිර්මාංශ ආහාරය පිළිබඳව ඇති මතයෙහි වරද තිබෙන්නේ බුදුරජාණන් වහන්සේ තුළ හෝ කැප ලෙස මස් මාංශ අනුභව කරන පිරිස තුළ නොවේ. ප්‍රාණ රහිත වූ මස් මාංශය ප්‍රාණඝාතය හා සමාන අර්ථයෙන් සලකා ගෙන අරුත් පටලවාගෙන තිබීම යි. එය කෙනෙකු ගේ ධර්මඥානයේ හා විනය පිළිබඳ අවබෝධයේ අඩුකම විනා

අන් කවර හේතුවක් ද?

28. ප්‍රශ්නය :

**ඔබ වහන්සේ ඔය ආකාරයෙන් පවසන නමුත් මේ රටෙහි ආරණ්‍ය සේනාසන ආදියෙහි වැඩසිටින බොහෝ ස්වාමීන් වහන්සේලා ත් බොහෝ ම ප්‍රසිද්ධ වූ දූන උගත් ස්වාමීන් වහන්සේලා ත් නිර්මාංශ ආහාර ම වළඳති. එසේ ම ජනතාවගෙන් ද නිර්මාංශ වන්නැයි ඉල්ලා සිටින ස්වාමීන් වහන්සේලා ගැන ද අසන්නට දකින්නට ලැබේ. එසේ වන්නේ මක් නිසා ද?**

28. පිළිතුර :

පින්වත, මේ රටෙහි වැඩසිටින සියලු ස්වාමීන් වහන්සේලා ගේ රුචි අරුචිකම් ගැන හෝ බණ කීම් ගැන හෝ මම වග නො කියමි.

එහෙත් එක දෙයක් කිව යුතුය. එනම්, යම් ස්වාමීන් වහන්සේ නමක් පෞද්ගලික රුචිකත්වය මත නිර්මාංශ ආහාර වළඳත් නම් එහි කිසිදු ගැටළුවක් නැත. නමුත් එය ධර්ම විනය වශයෙන් පටලවාගෙන එය ශීලය බවට හුවා දක්වමින් අන්‍යයන්ට ගරහමින් එය ම ආර්ය මාර්ගයෙහි අනිවාර්ය අංගයක් වශයෙන් හුවා දක්වත් නම් උන්වහන්සේලා ගේ ධර්මාවබෝධය පිළිබඳව ඒකාන්තයෙන් ම සැක කළ යුතු ය.

යම් ස්වාමීන් වහන්සේ නමක් තථාගත ධර්ම විනය නුවණින් යුක්තව හදාරා තිබේ නම්, යෝනිසෝමනසිකාරයෙහි යෙදී තිබේ නම්, චේතනාවක් ක්‍රියාත්මක වන්නේ කෙසේ දැයි ධර්මය තුළින් නිරාකුල

ලෙස අවබෝධ කර ගෙන තිබේ නම්, ඒ ස්වාමීන් වහන්සේලා පවසන්නේ චතුරාර්ය සත්‍යයට අදාල ධර්මයක් මිස නිර්මාංශ ආහාර ගැන නොවේ.

විශේෂයෙන් ම ධර්ම විනය ගැන අවබෝධයක් නොමැතිව සිටින ජනතාව ඉතාමත් ම පහසුවෙන් පහදවා ගත හැකි ලෙහෙසි මාර්ගය මෙය යි.

උම්බලකඩවත් නො වළඳිත් යැයි පැවසූ සැණින් එතැනට පහදින බොහෝ නුවණ මඳ පිරිස් මේ රටෙහි සිටිති. නිර්මාංශව සිටින ඕනෑම කෙනෙක් නිවන් මග වශයෙන් කවර හෝ මිත්‍යා දෘෂ්ටියක් කතා කළ ද එසැණින් ම පිළිගැනීමට බොහෝ දෙනෙක් පෙළඹෙන්නේ වළඳන ආහාරයේ ස්වභාවය දෙස බලමිනි. එම පිළිගැනීම පිණිස උම්බලකඩවත් නො වැළඳීම ප්‍රමාණවත් ය. කවර ආකාරයෙන් දිවි ගෙවුවද කම් නැත. කවර චාටු බස් දෙඩුව ද කම් නැත. ධර්මයේ නාමයෙන් කවර දෙයක් පැවසුව ද කම් නැත. උම්බලකඩ කැබැල්ලක් වත් ආහාරයකට මුසු නො කර ගැනීම ම ප්‍රමාණවත් ය. පරම පවිත්‍ර වූ ආහාර වළඳන්නා වූ උන්වහන්සේලා මොන තරම් ශ්‍රේෂ්ඨ ද යන මතය පැතිර යන විට ජය ගන්නේ අධර්මය මිස ධර්මය නොවේ. එවිට ප්‍රාතිමෝක්ෂ සංවර සීලය යටගොස් ශීලයකට අයිති නැති, ශීලයෙහි අංගයක් නො වන, නිර්මාංශ ආහාර වේල මහා ශ්‍රේෂ්ඨ දෙයක් ලෙස ඉස්මතු වෙයි. එය වනාහී විනය විකෘති වීම යි. එමෙන් ම එය ධර්මයේ අනිවාර්ය අංගයක් ලෙස පවසයි නම් එය වනාහී ධර්මය විකෘති වීම යි.

**29. ප්‍රශ්නය :**

**නිර්මාංශීවීම ශීලයක් වශයෙන් හෝ ගුණයක් වශයෙන් හෝ ඔබ වහන්සේ නො පිළිගන්නේ මක් නිසා ද?**

29. පිළිතුර :

පින්වත, මා කවරෙක් ද? අප ගේ ශාස්තෘන් වහන්සේ පවා නිර්මාංශ ආහාර අනුභවය ශීලයක් වශයෙන් හෝ ගුණයක් වශයෙන් හෝ නො පිළිගත් සේක. එය හුදෙක් පෞද්ගලික රුචිකත්වයක් පමණි. ඉන් ඔබ්බට ගිය වටිනාකමක් එහි නැත. මෙකරුණ අවධාරණයෙන් ම සිහියේ තබා ගැනීම වැදගත් ය.

30. ප්‍රශ්නය :

**එසේ නමුත් මස් මාංශ වළඳන ස්වාමීන් වහන්සේලා තුළ ශීලය වත් නැතැයි නින්දා අපහාස කරන අවලාද කරන ඇතැම් ගිහි පැවිදි පිරිස් මේ රටේ සිටිනවා නේද?**

30. පිළිතුර :

එසේය පින්වත. එවැනි ගිහි පැවිදි පිරිස් මේ රටේ සිටින බව සැබෑ ය. එහෙත් ඔබ පවා ධර්මය විනය යනු කුමක්දැයි නො දැන සිටිය හොත් එවැනි පිරිස ගේ ප්‍රකාශ වලට ලෙහෙසියෙන් රැවටෙන්නට පුළුවනි. එම නිසා භික්ෂුවක ගේ ශීලය නැතිවන, පැවිදි බව සම්පූර්ණයෙන් ම අහෝසිවන කරුණු හතරක් ඇති බව ඔබ දැන සිටීම ඉතා ම ප්‍රයෝජනවත් ය.

1. උපසම්පදාව ලැබූ යම් භික්ෂුවක් අඩු ගණනේ තිරිසන් ගත වූ ස්ත්‍රියක් සමඟ හෝ වේවා, ඔවුනොවුන් කාම සංසර්ගයෙහි යෙදෙත් නම් එසැණින් ම ඔහු ගේ භික්ෂුභාවය සම්පූර්ණයෙන් ම අහෝසි වේ.

එපමණකින් ම ඔහු සංඝයා ගෙන් බැහැර වූයේ වෙයි. සංඝ ලාභය අහිමි වූයේ වෙයි. ඔහු විසින් කරනු ලබන කිසිදු විනය කර්මයක් වලංගු නැත. ඔහුට නැවැත ශාසන ධර්මයෙහි යෙදෙන්නට නම් ආයති සංවරයේ පිහිටා සාමණේරයෙක් වශයෙන් ධර්මයේ හැසිරිය හැකිය.

2. උපසම්පදාව ලැබූ යම් භික්ෂුවක් සොරා යන නාමයෙන් නින්දා ලැබීමට හේතුවන ඉතා සුළු සොරකමක් හෝ කළ සැණින් ම ඔහු ගේ භික්ෂුභාවය සම්පූර්ණයෙන් ම අහෝසි වේ.

3. උපසම්පදාව ලද භික්ෂුවක් චේතනාත්මකව මනුෂ්‍ය ඝාතනයකට යන්තමින් හෝ හවුල් වී ඒ හේතුවෙන් එම මනුෂ්‍ය ඝාතනය සිදු වන්නේ නම්, එසැණින් ම ඔහු ගේ භික්ෂුභාවය අහෝසි වේ.

4. උපසම්පදාව ලද භික්ෂුවක් ධ්‍යාන මාර්ගඵල කිසිවක් නැතිව තමන් ධ්‍යාන මාර්ගඵල ආදී විශේෂ ධර්මයන් උපදවා ගෙන සිටින්නේ යැයි අධිමානයකින් තොරව ප්‍රකාශ කරන්නේ නම්, ඔහු ගේ භික්ෂුභාවය සම්පූර්ණයෙන් ම අහෝසි වේ.

මේවා හඳුන්වන්නේ සතර පාරාජිකා නමින් ය. පැවිදි භාවය අහෝසි වී දුස්සීල භාවයට පත්වන්නේ සතර පාරාජිකාවෙන් එක් පාරාජිකාවකට හෝ හසුවීම හේතුවෙනි. එහෙත් කැප ලෙස ලැබෙන මස් මාංශ වළඳින භික්ෂුවක් දුටු විට යම් කෙනෙක් අකැප මසින් චෝදනා කොට දුස්සීලත්වයෙන් ගටා කතා කොට එම භික්ෂුව පහතට හෙළා දමයි නම්, ඒ තැනැත්තා භාග්‍යවතුන්

වහන්සේ වදාළ මෙම දේශනාව දැනගෙන සිටීම ප්‍රයෝජනවත් ය.

"පින්වත් මහණෙනි, යම් භික්ෂුවක් පිරිසකට ආක්‍රෝශ කරන්නේ නම්, සබ්‍රහ්මචාරී ආර්යයන් වහන්සේලා හට නින්දා අපහාස කරන්නේ නම්, ඔහු මෙම ආදීනව පහ කැමති විය යුත්තේ ය.

1. තමන් ගේ නිවන් මග වැසී යන අයුරින් පාරාජිකා ආපත්තියකට හෝ පැමිණෙන්නේ වෙයි.

2. වෙනත් කිලිටි සහගත වූ ආපත්තියකට හසුවන්නේ හෝ වෙයි.

3. බොහෝ දුක් විඳින්නට සිදුවන දැඩි රෝග උපද්‍රවයක් හෝ වැළඳෙන්නේ වෙයි.

4. මරණයට පත්වන විට සිහි මුළාවන්නේ වෙයි.

5. කය බිඳී මරණයට පත් වූ පසු අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයෙහි උපදින්නේ වෙයි.

*(අංගුත්තර නිකාය - අක්කෝසක සූත්‍රය)*

එනිසා යම්කිසි භික්ෂුවක් නිර්මාංශ ආහාර පමණක් අනුභව නො කළ පමණින් එම භික්ෂුවට දුස්සීල භාවයෙන් චෝදනා කිරීම ඉතාමත් ම අන්තරාදායක ය. එනිසා කෙනෙකු තව කෙනෙකුට චෝදනා කරන්නට පළමු කරුණු පහක් තමා තුළ පිහිටුවා ගෙන චෝදනා කළ යුතු බව සාරිපුත්ත තෙරුන් වහන්සේ මෙසේ වදාළ සේක.

1. සුදුසු කල්හි ම කියමි. නො කල්හි නො කියමි.

2. සත්‍ය වූ දෙයින් ම කියමි. අසත්‍යයෙන් නො කියමි.

3. මොලොක් බසින් ම කියමි. පරුෂ බසින් නො කියමි.

4. අර්ථ සහිතව ම කියමි. අර්ථ රහිතව නො කියමි.

5. මෙත් සිතින් ම කියමි. ද්වේශ සිතින් නො කියමි.

*(අංගුත්තර නිකාය - චෝදනා සූත්‍රය)*

මෙකරුණ තුළින් අප පැහැදිලි ව මෙය තේරුම් ගත යුතුය. එනම් භික්ෂූන් වහන්සේලාට නින්දා කිරීම පිණිස ද්වේෂ සහගතව, වෛරයෙන් යුතුව ඇතැම් ගිහි පැවිද්දන් විසින් චෝදනා කරන අවස්ථා තිබේ. එවිට කටකතා වලින් අසා දැනගත් දෙයකින් හෝ තමන් මනසින් මවාගත් දෙයකින් හෝ උඩින් පල්ලෙන් විමසා මතවාද වලට බැසගත් දෙයකින් හෝ අනුන්ගේ උසිගැන්වීම් මත ආවේගශීලී වීමෙන් හෝ සිතට එන එන දෙය චෝදනා මුඛයෙන් පැවසීමෙන් හෝ අනුන් හට චෝදනා කරන්නට යෑමේ දී අනුන්ට කෙසේ වෙතත් එය තමන් ගේ හිත සුව පිණිස නම් කිසිසේත් උපකාරී නො වන බව තේරුම් ගෙන සිටීම වැදගත් ය. මෙහි බරපතලකම දැනෙන්නේ කල් ගිය පසු ය.

**කුද්ධෝ අත්ථං න ජානාති - කුද්ධෝ ධම්මං න පස්සති,**
**අන්ධන්තමං තදා හෝති - යං කෝධෝ සහතේ නරං**

කෝපයට පත් වූ තැනැත්තා යහපත නො දනී. කෝපයට පත් වූ තැනැත්තා ධර්මය නො දකී. ක්‍රෝධය විසින් යම් මිනිසෙකු යටපත් කරන ලද්දේ ය. එවිට ඔහු සිටින්නේ මෝහය නම් වූ ඝනාන්ධකාරය තුළ යි.

*(කෝධන සූත්‍රය - අංගුත්තර නිකාය)*

එම නිසා ක්‍රෝධ රහිතව මෙය විමසා බැලීම

නුවණැත්තන් ගේ යුතුකම යි.

31. ප්‍රශ්නය :

**මස් මාංශ වැළඳීම ශීලයක් හෝ ගුණයක් නොවේ නම් සමාජය විසින් එය මෙතරම් අගය කරනු ලබන්නේ මක් නිසා ද?**

31. පිළිතුර :

පින්වත, මෙයින් පෙනෙන්නේ සමාජය විසින් ගුණවත් කම හෝ සිල්වත් කම මනිනු ලබන්නේ හුදෙක් බාහිර පෙනුමෙන් මිස අභ්‍යන්තරික වටිනාකමකින් නො වන බව යි. අභ්‍යන්තරික ගුණවත්කම් වර්ධනය නොවූ සමාජයක නිර්මාංශී වීම උසස් සමාජ තත්වයකි. තමන් ගේ පිරිසිදුකම පෙන්වීමට ආභරණයකි. තමාව හුවා දැක්වීමේ ගුණයකි. අනුන් ව පහත් කොට හෙළා දැක්වීමට ආයුධයකි. ඔවුහු දයානුකම්පා විරහිත අන්‍යයන්ට පහර දෙන්නේ නිර්මාංශීවීම නම් වූ තියුණු ආයුධයෙනි.

සම්මා දිට්ඨිය ඇති කර ගැනීමේ වැදගත්කම ඔවුන්ට නො පෙනේ. ඊර්ෂ්‍යාව, කුහකකම, පළිගැනීම, වෛර කිරීම පුහුමාන්නය ආදියේ ඇති අනතුර ඔවුනට නො පෙනේ. මනුෂ්‍යයාට අනුකම්පාවෙන් උදව් කිරීම ගැන ඔවුන් තුළ එතරම් සැලකිල්ලක් නැත. ඒ වෙනුවට තිබෙන්නේ මස් මාංශ අනුභවයට එරෙහි වූ ද්වේෂ සහගත ඝෝෂාවක් පමණි. සම්මා දිට්ඨිය ඇති කර ගැනීමට මහන්සි ගන්නේ නම් කොතරම් අගනේ ද?

32. ප්‍රශ්නය :

**සම්මා දිට්ඨිය ඇති වීමට හේතු වන්නේ කුමන කරුණු**

ද?

32. පිළිතුර :

පින්වත, ප්‍රධාන වශයෙන් ම සම්මා දිට්ඨිය ඇති වීම පිණිස කරුණු දෙකක් හේතු වේ.

1. **සද්ධර්මශ්‍රවණය :**

එනම් කළ්‍යාණ මිත්‍රයන් ගේ ආශ්‍රය හේතුවෙන් කෙනෙකුට භාග්‍යවතුන් වහනසේ පෙන්වා වදාළ චතුරාර්ය සත්‍යය ධර්මය ඉතා සවිස්තර ලෙස ත්, පිරිසිදු ලෙස ත් අසන්නට හෝ කියවන්නට හෝ ලැබෙයි. එය කෙනෙකුට බාහිරින් ලබාගත හැකි අති ශ්‍රේෂ්ඨ වූ සම්පත්තිය යි.

2. **යෝනිසෝමනසිකාරය :**

කළණ මිතුරු ඇසුරෙන් ශ්‍රවණය කළ හෝ දනගත් හෝ ඒ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ වන පරිද්දෙන් තම චින්තනය ඒ ධර්මයට අනුකූල ලෙස හැසිරවීමෙහි කුසලතාව යෝනිසෝමනසිකාරය නම් වේ. ඒ තුළින් තමන්ට චතුරාර්ය සත්‍යය වනාහී ඒකාන්ත සත්‍යයක් බව අවබෝධ වෙන්නට පටන් ගනී. සම්මා දිට්ඨිය ඇති වන්නේ ඒ අයුරින් මිස නිර්මාංශ ආහාර අනුභවයෙන් නම් නොවේ.

33. ප්‍රශ්නය :

**අපේ රටේ ඉතා ප්‍රසිද්ධ ස්වාමීන් වහන්සේලා පවා පවසන ප්‍රධාන කරුණක් තිබේ. එනම් භාවනා කරද්දී එළවළු ආහාර පමණක් ගත යුතුය. එවිට භාවනාව ඉක්මනින් ම දියුණු වේ. යම් හෙයකින් මස් මාංශ අනුභව කළහොත් එය භාවනාවට බාධාවක් විය හැකිය කියා ය.**

මෙය සත්‍යයක් ද?

33. පිළිතුර :

පින්වත, බුදුරජාණන් වහන්සේ යනු කවුරුන් දැ යි ඔබ දන්නවා ද? උන්වහන්සේ විසින් ම ශ්‍රාවක වූ අප හට තමන්වහන්සේ පිළිබඳව හඳුන්වාදෙන ලද්දේ මේ අයුරිනි.

"පින්වත් මහණෙනි, අරහත් වූ, සම්මා සම්බුද්ධ වූ, තථාගතයන් වහන්සේ වනාහී නූපන් නිවන් මග උපදවාලන සේක. හට නො ගත් නිවන් මග හට ගන්වන සේක. (ලෝකයෙහි කිසිදු දෙවියෙකු විසින් හෝ බඹෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෙකු විසින් හෝ වෙන කිසිවෙකු විසින් හෝ) ප්‍රකාශ නො කරන ලද නිවන් මග මැනවින් ප්‍රකාශ කරන සේක. නිවන් මග මැනවින් දන්නා සේක. නිවන් මග මැනවින් ප්‍රකට කළ සේක. නිවන් මග මැනවින් පෙන්වා දෙන්නට අතිශයින් ම දක්ෂ වන සේක.

පින්වත් මහණෙනි, දැන් ශ්‍රාවක පිරිස වනාහී ඒ පෙන්වා දෙන මාර්ගය අනුව ගමන් කරමින් පසුපසින් යන්නවුන් ලෙස වාසය කරත්."

*(සංයුත්ත නිකාය - සම්බුද්ධ සූත්‍රය)*

අඩු ගණනේ අප විසින් මෙම සූත්‍ර දේශනාව වත් ඉගෙන ගෙන එහි අර්ථ අවබෝධ කරගත යුතු නො වේද? ඒ කෙරෙහි ශ්‍රද්ධාව පිහිටුවා ගත යුතු නො වේද? යම් කෙනෙකුන් තුළ භාග්‍යවතුන් වහන්සේ විසින් පෙන්වා දෙන ලද ඒ අමා නිවන් මග පිළිබඳ ශ්‍රද්ධා මාත්‍රයක් හෝ ඇති වී තිබේ නම් එවන් කෙනෙක් කිසිසේත් ම අලුත් දේවල් එයට එක් නො කරනු නිසැක ය. නිවන් මග වශයෙන් භාග්‍යවතුන් වහන්සේ පෙන්වා වදාළේ ආර්ය

අෂ්ටාංගික මාර්ගය යි. එය කාලයකට හෝ දේශයකට හෝ අනුව වෙනස් වන දෙයක් නොවේ. ආකාලික වූ ආර්ය සත්‍යයකි. එහෙත් ඔය කියන ආකාරයට එළවළු අනුභවය පමණක් පුරුදු නො කොට නිවන් මගෙහි දියුණුවක් නො ලැබිය හැකි නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයට අමතරව තවත් අංගයක් 'සම්මා ආහාර' වශයෙන් එක් කළ යුතු ම ය. බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවකත්වය ප්‍රතිඥා දෙන අප කවුරුත් උන්වහන්සේ විසින් නො දෙසන ලද, ප්‍රකාශ නො කරන ලද දේවල් නො පැවසිය යුතුය. උන්වහන්සේ විසින් නො පණවන ලද දෙය නො පැණවිය යුතුය.

නිර්මාංශ ආහාර අනුභවය චිත්ත දියුණුවට හේතුවන බව යම් කෙනෙක් පවසයි නම් එය ඔහුගේ අවබෝධය පිළිබඳ අර්බුදයක් මිස යථාර්ථයක් නොවේ. එය එසේ වන්නේ නම් චිත්ත දියුණුවෙහි පරම කෝටියට පත් බුදුරජාණන් වහන්සේට ආහාර අනුභවයෙන් සිත දියුණු වන ක්‍රමය සොයා ගත නො හැකි වූයේ මක් නිසා ද? එම නිසා ආහාර අනුභවය චිත්ත දියුණුවට උපකාර වේ ය යන මිත්‍යා අදහස් පැතිරවීමෙන් කෙනෙකුට තාවකාලික ගෞරවයක් ලබා ගත හැකි බව සැබෑ ය. එහෙත් එය අසත්‍යයකි. එමෙන් ම යමෙක් මාංශ ආහාර අනුභව කළ පමණින් නිවන් මගින් බැහැරව දුස්සීල වන්නේ යැයි පවසයි ද එය ද අසත්‍යයකි.

34. ප්‍රශ්නය :

**ඔබ වහන්සේ පවසන්නේ මාංශ ආහාර අනුභවය මානසික දියුණුවට බාධාවක් නො වන බව ද?**

34. පිළිතුර :

පින්වත, එසේ නම් මෙම සිදුවීම ගැන ත් ඔබ දැන සිටීම මැනවි.

එක් කලක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ විසූ සේක. එකල්හි උප්පලවණ්ණා රහත් තෙරණිය සැවැත් නුවර වැඩ වසන්නී පිඬු පිණිස සැවැත් නුවරට පිවිසියා ය. පිණ්ඩපාතයෙන් පසු ඕ තොමෝ අන්ධ වනය බලා පිටත් වූවා ය. අන්ධ වනයෙහි ඇතුළට ම පිවිසි උත්පලවණ්ණා භික්ෂුණිය එක්තරා රුක් සෙවණක වාඩි වී භාවනා කරන්නට පටන් ගත්තා ය.

එවේලෙහි සොරු කණ්ඩායමක් සතෙකු දඩයම් කොට මස් ගෙන අන්ධ වනයට ඇතුළු වූහ. එහි සිටි සොර නායකයාට රුක් සෙවණෙහි බවුන් වඩමින් සිටි උත්පලවණ්ණා භික්ෂුණිය දැකගන්නට ලැබුනේ ය. ඇය දුටු සොර නායකයා ගමන් මග වෙනස් කොට පිරිස ත් සමග වෙන මගකින් ගියේ ය.

ඉක්බිති සොර නායකයා ඒ මස තම්බා එයින් යහපත් කොටසක් කොළ වලින් ඔතා උප්පලවණ්ණා භික්ෂුණියට නුදුරින් ගසක එල්ලුවේ ය. 'යම් කිසි ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා මෙය දකින්නේ නම් මෙය ඔහු වෙත දෙන ලද්දේ ය. ඒ තැනැත්තා මෙය රැගෙන යනු මැනව' යි පවසා පිටත්ව ගියේ ය.

උත්පලවණ්ණා භික්ෂුණිස සමාධියෙන් නැගිටින ඒ මොහොතෙහි අර සොරා ගේ වචනය ඇසුවා ය. ඕ තොමෝ ඒ මස වෙහෙරට ගෙන ගියා ය. පසු දින දුරු මිරිස් දමා ඒ මස පිළියෙල කොට බඳුනක දමා සඟල සිවුරෙහි දවටා පොදියක් බැඳගත්තා ය. අහසට පැන නැගී

වේළුවනයට ගියා ය. ඒ බුදුරජාණන් වහන්සේට පිළිගැන්වීම පිණිස ය.

*(පාරාජිකා පාළි - චීවර පටිග්ගාහක සික්ඛාපදං)*

මෙයින් එක දෙයක් පැහැදිලිව පෙනේ. එනම් එම මාංශය පිළියෙල කරගෙන සිවුරෙහි පොදි බැඳ ගත් උත්පලවණ්ණා භික්ෂුණිය ගේ අහස් ගමනට උපකාරී වූ ධ්‍යාන අභිඥා ආදියට කිසිදු බාධාවක් සිදු වී නැති බව යි.

යම් හෙයකින් නිර්මාංශ ආහාර පමණක් අනුභව කරන කාලයේ දී කරන්නා වූ භාවනාව තුළින් ධ්‍යාන අභිඥා ආදිය ඉක්මනින් ම උපදවා ගත හැකි නම් නො වැරදීම එම විශේෂ ක්‍රමය සියල්ල දත් භාග්‍යවතුන් වහන්සේ අපට හෙළිදරව් කරන සේක් ම ය.

35. ප්‍රශ්නය :

**අප රටෙහි බොහෝ දෙනෙක් මෛත්‍රී භාවනාව කරනවා යැයි පවසත්. එහෙත් ඔවුන් වෙනත් සතුන් ගේ මළකුණු තමන් ගේ කුසෙහි පුරවාගෙන ඔය කරන්නා වූ මෛත්‍රී භාවනාවෙහි තේරුම කුමක් ද?**

35. පිළිතුර :

අහෝ! පින්වත, ඔබ මෛත්‍රිය තේරුම් ගෙන තිබෙන්නේ අපූරු ක්‍රමයකට ය. මෛත්‍රිය යනු කුමක්ද කියාවත් ඔබ තව ම නො දන්නා හැඩ යි පෙනෙන්නේ.

මෛත්‍රිය වැඩිය යුත්තේ ප්‍රාණයෙන් තොර වූ කරවල, මාළු ආදියට නොවේ. කුස තුළ තිබෙන ආහාරය තමන් ගේ සිතෙහි හටගන්නා මෛත්‍රියට බාධා පමුණුවන්නේ ය කියා යමෙක් පවසන්නේ නම් ඒ තැනැත්තා නුවණ මඳ කෙනෙකි. ඔය කියන ආකාරයට නිර්මාංශ වූ කෙනෙක්

තුළ ඉක්මනින් මෛත්‍රිය වැඩෙන්නේ නම් රජයට කෙසේ හෝ බලකොට නීති මාර්ගයෙන් හෝ මාංශ ආහාර අනුභවය තහනම් කළ යුතු ම ය. එවිට ඉතා පහසුවෙන් සියලු දෙනා තුළ මෙත් සිත වැඩෙනු ඇත. එවිට මේ රටෙහි ඉහ වහා ගොස් තිබෙන නො මිනිස්කම් සැණෙකින් පහව යනු ඇත.

එහෙත් ඔබ දන්නවා ද? දෙවන ලෝක සංග්‍රාමයෙහි නිර්මාතෘ වූ ජර්මනියේ හිට්ලර් නැමැත්තා නිර්මාංශ ආහාර අනුභව කළ කෙනෙකි. සංඝභේද කළ, බුදුරජුන් ගේ ලේ සෙල වූ, බුදු රජුන්ව ඝාතනය කිරීමට මහත් සේ වෑයම් කළ, අජාසත් රජු ලවා තම පියා වන බිම්බිසාර රජු ඝාතනය කරවන්නට සම්පූර්ණයෙන් ම උපදෙස් දුන් දේවදත්ත නිර්මාංශ ආහාර අනුභව කළ කෙනෙකි. දුෂ්ටකම් වලින්, ඊර්ෂ්‍යාකාරකමින්, පළිගැනීම් වලින් යුත් දුර්වල මනුෂ්‍යයන් මාංශ ආහාර මෙන් ම නිර්මාංශ ආහාර ද අනුභව කරන සමාජ තල දෙකෙහි ම එක සේ සිටින බව පැහැදිලිව පෙනෙන්නට ඇති කරුණකි. එනිසා මාංශ ආහාර අනුභව කොට කුසෙහි පිරී තිබෙන මළකුණු හේතුවෙන් මෛත්‍රිය නො වැඩෙන්නේ යැයි පැවසීම පවා බුද්ධිමතුන් හට සිනහ උපදවන කරුණකි. සැබැවින් ම මෛත්‍රිය සඳහා අවශ්‍ය වන්නේ මානව දයාව ය. මානව දයාවකින් තොර වූ තැන තණ කොළ පමණක් ආහාරයට ගත්ත ද මෛත්‍රිය නම් දියුණු වන්නේ නැත.

එමෙන් ම තව දෙයක් තේරුම් ගත යුතුය. එළවළු බත් ආහාරයට ගත් පමණින් ශරීරය නම් පිරිසිදු බවට පත් නොවේ. කුමන ආහාරයක් ගත්ත ද, කෙළ සමඟ මිශ්‍ර වන එම ආහාරය ශරීරය තුළට යන්නේ බලු වමනයක්

පරිද්දෙනි. ශරීරය තුළ එය පිළිකුල් සහගත දෙයක් ම ය. මාංශ ආහාර පමණක් පිළිකුල් බවට පත් වී එළවළු ආහාර පිළිකුල් නො වන්නේ නම් එම ආහාර රනින් හෝ රිදියෙන් හෝ කළ දෙයක් විය යුතුය. මේ ශරීරයෙහි යථා ස්වභාවය ගැන බුදුරජාණන් වහන්සේ ගේ දේශනා මොන තරම් තිබේ ද? ඒවා කියවීමෙන් ශරීරය පිළිබඳ සැබෑ දැක්මක් ඇති කර ගැනීමට බුද්ධිමත් කෙනෙකුට අවස්ථාව ලැබේ.

36. ප්‍රශ්නය :

**නිර්මාංශ ආහාර අනුභවයෙන් රස තෘෂ්ණාව පාලනය නො වන්නේ ද?**

36. පිළිතුර :

පින්වත, රස තෘෂ්ණාව මුළුමනින් ම ප්‍රහාණය කරන ලද අප ගේ බුදුරජාණන් වහන්සේ රස තෘෂ්ණාව පාලනය කරන ආකාරය විවිධ අයුරින් පෙන්වා දී තිබේ. ඉන් පළමුවැන්න ආහාර ප්‍රත්‍යවෙක්ෂාව යි. එනම් ආහාරය වළඳන්නා වූ භික්ෂුව තමා වළඳන ආහාරය ගැන මේ අයුරින් නුවණින් සැලකුව මනා ය.

"මා මේ පිණ්ඩපාතය වළඳන්නේ නුවණින් කරුණු විමසාගෙන ය. එනම් මා මේ ආහාරය වළඳන්නේ ජවය පිණිස නොවේ; මදය පිණිස නොවේ; ඇඟ-පත සරසා ගැනීම පිණිස නොවේ; සිරුරෙහි අඩු තැන් පුරවා ගැනීම පිණිස නොවේ; යම්තාක් මේ කයෙහි පැවැත්ම පිණිස ම ය. යැපීම පිණිස ය. වෙහෙස සන්සිඳුවා ගැනීම පිණිස ය. බඹසර ජීවිතය යහපත් ව පවත්වා ගැනීම පිණිස ය.

මෙසේ පැරණි කුසගිනි වේදනා නැති කර දමමි. අලුත් කුසගිනි වේදනා නූපදවමි. මාගේ ජීවිත යාත්‍රාව ද

සිදු වන්නේ ය. නිරවද්‍ය වූ ජීවිතයත් පහසු විහරණය ත් සැලසෙන්නේ ය" කියා ය.

*(මජ්ඣිම නිකාය - ගණක මොග්ගල්ලාන සූත්‍රය)*

භාග්‍යවතුන් වහන්සේ රස තෘෂ්ණාව ප්‍රහාණය කිරීමට හේතුවන, රසය කෙරෙහි නො ඇලීමට හේතු වන ආකාරයෙන් විදර්ශනා ප්‍රඥාව දියුණු කිරීම ගැන වදාරන්නේ මෙසේ ය.

"සිහියෙන් යුක්ත වූ හෙතෙමේ රසය අනුභව කොට එම රසය කෙරෙහි නො ඇලෙයි. හේ ඒ රසය විඳින්නේ නො ඇලෙන සිතින් යුතුව ය. ඔහු ගේ සිත ඒ රසයෙහි නො බැසගන්නේ ය. ඔහු රස විඳින්නේ ත්, එම විඳීම සේවනය කරන්නේ ත් යම් අයුරකින් ද ඒ හේතුවෙන් ඔහු ගේ කෙලෙස් ගෙවී යන්නේ වෙයි. රැස් නො වන්නේ වෙයි. මේ අයුරින් දුක බැහැර කරන කල්හි හේ නිවන ළඟ සිටින්නේ යැයි කියනු ලැබේ"

*(සංයුත්ත නිකාය - මාලුංක්‍යපුත්ත සූත්‍රය)*

නිර්මාංශ ආහාර අනුභවයෙන් කෙනෙකු ගේ තෘෂ්ණාව ප්‍රහාණය වන්නේ නම්, ඉන්ද්‍රිය සංවරයෙන්, සතිපට්ඨානයෙන්, සමථ විදර්ශනා භාවනාවෙන් ඇති ඵලය කිම? ඒ සඳහා මහන්සි විය යුතු ද නැත. නිර්මාංශ ආහාර අනුභවයෙන් සියල්ල සම්පූර්ණ වන බැවිනි.

37. ප්‍රශ්නය :

**ඔබ වහන්සේ කෙසේ පැවසුවත් නිර්මාංශ ආහාර අනුභවය තුළින් ලේ ධාතුව පිරිසිදු වෙයි. නීරෝග වෙයි. එසේ ලේ ධාතුව පිරිසිදු වීම හේතුවෙන් සිත ද පිරිසිදු වෙයි.**

37. පිළිතුර :

හොඳයි පින්වත, එසේ නම් මොහොතකට සිතා බලන්න. දිවි තිබෙන තුරා ම ශාඛ පමණක් ආහාරයට ගන්නා සතුන් ගැන සිතා බලන්න. එනම් ගවයින්, එළුවන්, අශ්වයින්, අලි ඇතුන්, ගෝනුන්, මුවන්, හාවුන් ආදී සතුන් මුළු ජීවිතය පුරා ම අනුභව කරන්නේ ශාඛාහාර පමණි. ඔබ පවසන ආකාරයට ඔවුන් ගේ ලේ ධාතුව අත්‍යන්තයෙන් ම පිරිසිදු විය යුතු ය. එනිසා ම ඒ සත්තු නීරෝග වෙති. එසේ ම ඔවුන් ගේ ලේ ධාතුව පිරිසිදු වීම නිසා නිරන්තරයෙන් ම ඒ සතුන්ට පවතින්නේ පිරිසිදු සිතකි. එසේ නම් ඒ සතුන් සියලු දෙනා ම ශාඛාහාර අනුභව කිරීමේ හේතුවෙන් ලත් චිත්ත දියුණුව මත ඒකාන්තයෙන් ම මරණින් මතු සුගතියෙහි උපත ලැබිය යුත්තාහු ය. මක් නිසා ද යත්; ඔවුන් ගේ මුළු ජීවිත කාලය තුළ දී ම ශාඛ ආහාර වලින් පමණක් යැපුන නිසා මනස ද පිරිසිදු ය. රස තෘෂ්ණාව ද ගෙවී ඇත.

එසේ නම් තිරිසන් ලෝකය අපායක් වශයෙන් නො හැඳින්විය යුතුය. මක් නිසාද යත්; ඔවුන් ගේ මරණින් මතු ස්ථිරව ම සුගතියෙහි උපත ලබා දිය හැකි පිරිසිදු මනසක් ඔවුන් හට ශාඛ ආහාර වලින් උරුම කර දෙන බැවිනි.

38. ප්‍රශ්නය :

**එහෙත්, දෙවියන් ගේ ඇල්ම බැල්ම බලාපොරොත්තු වන බොහෝ බැතිමතුන් ශාඛා ආහාර පමණක් අනුභව කරන්නේ මක් නිසා ද? මෙයින් පෙනෙන්නේ මස් මාංශ ආහාර කුස තුළට දැමීමෙන් මෙම ශරීරය අපිරිසිදු වන බව නොවේ ද?**

38. පිළිතුර :

පින්වත, ඔය ප්‍රකාශයෙන් පෙනෙන්නේ ඔබ මෙම ශරීරය පිළිබඳව කිසිවක් නො දන්නා බව යි. මේ ශරීරය පිළිබඳව නම් කිසිදිනෙක පිරිසිදු බවක් ලබා ගත නො හැකිය. ඔබ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය යාන්තමින් වත් අසා තිබේ නම් එය සිහි කිරීමට මේ හොඳ ම මොහොත යි.

මහ පිරිත් පොතෙහි තිබෙන ගිරිමානන්ද සූත්‍රය කියවා බලන්න. එහි ඇති අසුභ සඤ්ඤා, ආදීනව සඤ්ඤා ගැන අර්ථ සහිතව මොහොතකට හෝ කියවා බලන්න. එවිට මේ සිරුරෙහි ඇති අපවිත්‍ර දෑ ගැන ඔබට යම් දැනුමක් ලැබෙනු ඇත.

සුත්ත නිපාතයෙහි ඇති විජය සූත්‍රයෙහි මෙම ශරීරය පිළිබඳව බුදු රජුන් විසින් වදාරණ ලද රමණීය දෙසුමක් තිබේ.

"දෙපා ඇති මේ ශරීරය ඉතා අපවිත්‍ර ය. නිතර දුගඳ හමයි. නොයෙකුත් කුණුප කොටස් වලින් පිරී ඇති මේ ශරීරයෙහි ඒ ඒ තැනින් වැගිරෙන්නේ අපිරිසිදු දේ ම ය. ලෝකයා පරිහරණය කරන්නේ එබඳු කයකි.

මෙලෙස පිළිකුල් කයක් දරාගෙන සිටිමින් යම් කෙනෙක් තමා උසස් කොට සලකයි නම්, අනිකාව පහත් කොට හෙලා දකී නම් එය සැබෑ තත්වය නො දැනීම මිස අන් කවර දෙයක් ද?"

*(සුත්ත නිපාතය - විජය සූත්‍රය)*

යථාර්ථය මෙය නමුත් ඔබ සිතාගෙන සිටින්නේ මේ

ශරීරය පිරිසිදු දෙයක් බව යි. ඔය අයුරින් මුලා වී කල්පනා කරන කෙනෙකුට ඇත්ත නැත්ත කෙසේ නම් තේරුම් ගත හැකි වේවි ද?

ඊළඟ කරුණ ගැන දැන් කතා කරමු. ශාඛාහාර ගන්නා උදවිය ගේ ශරීර ඉතා ම පවිත්‍ර ය. කිළිකුණු නැත. එනිසා ම එම ශාඛාහාර ගන්නා පුද්ගලයන් වෙත දෙවියන් ගේ ඇල්ම බැල්ම ආකර්ශනය නිතැතින් ම ලැබේ. අහෝ! එසේ නම් ඒ දෙවිවරු වනාහී මුලවෙන් මුලාවට පත් වූ සත්ව කොට්ඨාශයකි. නිර්මාංශ ආහාර අනුභව කළ ද, මාංශ ආහාර අනුභව කළ ද, ශරීරයක පවතින්නේ කුණුප කොටස් තිස් දෙකකි. එහෙත් මෙම දෙතිස් කුණුපයෙන් යුතු ශරීරය දෙවියන් හට පිරිසිදු ලෙසට පෙනේ නම් එතැන තිබෙන්නේ මුලාවක් මිස වෙන කුමක් ද?

එකරුණ සත්‍ය නම් කිසිදා දෙවියෙක් බුදුරජාණන් වහන්සේ ළඟට නො පැමිණෙත් ම ය. මක් නිසා ද යත්, උන්වහන්සේ කැප ලෙස ලැබෙන මාංශ ආහාර වළඳින හෙයිනි. එම නිසා සත්‍යය වනාහී ඔය කියන කරුණට හාත්පසින් ම වෙනස් දෙයකි. බුදුරජාණන් වහන්සේ දෙවියන් ගේ ත්, මිනිසුන් ගේ ත් ශාස්තෘන් වහන්සේ වන සේක. සත්ථා දේවමනුස්සානං වන සේක.

දෙවියෝ කිලි කුණු වලට බිය වෙත් නම්, අකමැති වෙත් නම්, ඔවුන් එකල වැඩසිටි රහතන් වහන්සේලාට කිසිසේත් කැමති නො වනු ඇත. බොහෝ රහතන් වහන්සේලා මළමිනී ඔතන ලද වස්ත්‍ර රැගෙන සිවුරු කොට පොරවා සිටි සේක. සොහොන් වලට ගොස් බණ භාවනා කළ සේක. ඔබ කියන පරිදි දෙවියන් දරන්නේ එබඳු මතයක් නම් රහතන් වහන්සේලා සමීපයටවත් පැමිණෙන්නට දෙවිවරු අකමැති ය. උන්වහන්සේලා

පොරවා ගෙන සිටින්නේ කිළි කුණු නිසා ය.

**39. ප්‍රශ්නය :**

**ඔබ වහන්සේ පවසන්නේ කිළි කුණු කියා දෙයක් නැති බව ද?**

39. පිළිතුර :

පින්වත, කිළි කුණු කියා දෙයක් ඇත. ඒ කිළි කුණු වනාහී අන් කිසිවක් නොව කෙනෙකු ගේ සිතක හට ගන්නා ලාමක අකුසල ධර්මයන් ය.

කායිකව නම් සියලු දෙනා ගේ ම පාහේ තිබෙන්නේ කිළි කුණු මිස වෙන මොනවා ද? කායිකව කිළි කුණු ඇති නො වීමට නම් මෙම සිරුර රන්, රිදී, මුතු, මැණික් වලින් සකස් විය යුතු ය. අඩු ගණනේ වීදුරු වලින් හෝ සකස් විය යුතුය.

එහෙත් යමෙක් තුළ මානසිකව කිළි කුණු නැතිනම් ඔහු නිර්මාංශ ආහාර පමණක් අනුභව නො කරන නමුදු දෙවියන් සිටින්නේ ඔහු ළඟ ය. ඔහු පිරිසිදු සිතක් ඇති කෙනෙක් නිසා ය.

මෙකරුණට ගැලපෙන කදිම සිදුවීමක් ගැන සංයුත්ත නිකායෙහි **අරඤ්ඤායතන ඉසි සූත්‍රයෙහි** සඳහන් වෙයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරන්නේ ලොවෙහි කිසිවෙකුත් නො දන්නා අතීත ජීවිත ගැන කරුණු හෙළිදරව් කරන තැනක දී ය.

"පින්වත් මහණෙනි, මෙය අතීතයෙහි සිදු වූ දෙයකි. සිල්වත් වූ ඉතා යහපත් ගුණ ධර්ම ඇති සෘෂිවරු මහා වනයෙහි එක්තරා අසපුවක වාසය කළාහු ය. එකල්හි

පින්වත් මහණෙනි, ශක්‍ර දෙවියා ත්, වේපචිත්ති අසුර නායකයා ත් ඒ සිල්වත් වූ ඉතා යහපත් ගුණ ධර්ම ඇති ඍෂිවරු වෙත පැමිණියාහු ය..... එවිට පින්වත් මහණෙනි, ශක්‍රදේවේන්ද්‍ර තෙමේ පාවහන් ගලවා අසිපත ද වෙනත් කෙනෙකුට දී කුඩය ද පසෙක තබා සාමාන්‍ය දොරින් ම අසපුවට පිවිසියේ ය. සිල්වත් වූ ඉතා යහපත් ගුණධර්ම ඇති ඒ ඍෂිවරුන් ගේ යටි සුළඟෙහි සිටි ශක්‍රයා ඒ ඍෂිවරුන් වෙත ඇඳිලි බැඳ නමස්කාර කරමින් සිටියේ ය. එවිට ඒ සිල්වත් වූ ඉතා යහපත් ගුණධර්ම ඇති ඍෂිවරු සක්දෙවිඳු හට ගාථාවෙන් මෙසේ පැවසූහ.

"බොහෝ කලක් මුළුල්ලෙහි සමාදන් වූ ගුණ ධර්ම ඇති ඍෂිවරුන් ගේ සිරුරෙන් නිකුත් වෙන දහඩිය ගඳ සුළඟින් හමා එයි. දහසක් නෙත් ඇති දෙවිඳුනි, මෙතැනින් ඉවත්වනු මැනව. දෙව් රජුනි, ඍෂිවරුන් ගේ සිවුරු ගඳ අපිරිසිදු යි." එවිට සක්දෙවිඳු මෙසේ පිළිතුරු දුන්නේ ය.

"බොහෝ කලක් මුළුල්ලෙහි සමාදන් වූ ගුණ ධර්ම ඇති ඍෂිවරුන් ගේ සිරුරෙන් නිකුත් වන දහඩිය ගඳ සුළඟින් හමා ඒවා! ස්වාමීනි, මෙම ගන්ධය හිසෙහි පළඳනා ඉතා විචිත්‍ර වූ මල් මාලාවක් පරිද්දෙන් අපි කැමති වෙමු. දෙවියෝ මෙහි පිළිකුල් ය යන හැඟීම් ඇත්තෝ නො වෙත්."

*(සංයුත්ත නිකාය - අරඤ්ඤායතනඉසි සූත්‍රය)*

මෙයින් එක් දෙයක් පැහැදිලිව ම පෙනේ. කිලි කුණු පිළිබඳව මිනිසුන් දරන මතය වැරදි බව යි.

40. ප්‍රශ්නය :

**ඔය පවසන්නේ බුදුරජාණන් වහන්සේ ගේ අදහස් නොවේ නේද? ඔය අදහස් පසුකාලීන ඒවා විය නො**

හැකි ද?

40. පිළිතුර :

නැත පින්වත, කිසිසේත් එසේ නොවේ. සමහර විට ඔබ මේ තාක් නො ඇසූ දේවල් මෙහි කියවෙන නිසා ඒවා අලුත් දේවල් වශයෙන් ඔබට සිතෙන්නට පුළුවනි. එය සාධාරණ ය. නමුත් මා හට පෞද්ගලික අදහසක් තහවුරු කර ගැනීම පිණිස වාද විවාද වල පැටලීමට කිසිදු වුවමනාවක් නැත. එමෙන් ම දේශනාවල නැති දේවල් පවසන්නට ද කිසිදු වුවමනාවක් නැත. ඔබට ඔවැනි අදහස් ඇති වූයේ මන්ද? ඔබ සිතන්නේ මා පක්ෂග්‍රාහී ලෙස පිළිතුරු දෙන බවට ද? නැත පින්වත. සියලු ම බුදුරජාණන් වහන්සේලා මාංශාහාර සම්බන්ධයෙන් දරන්නේ එක ම ආකල්පයකි.

සුත්ත නිපාතය නම් ඉතාමත් ම පැරණි වූ ත්, බුද්ධ කාලීනව භාවිතා වූ ත්, දහම් කොටසෙහි ඉතාමත් කදිම සූත්‍රයක් සඳහන්ව තිබේ. එය ඉතාමත් ම විශ්වාසනීය වූ බුද්ධ වචනයකි. එනම් ආමගන්ධ සූත්‍රය යි.

එහි සඳහන් වන ආකාරයට කාශ්‍යප බුදු රජුන් ගේ කාලයේ පවා අනුන්ව පහදවා ගැනීම පිණිස ශාබාහාර පමණක් අනුභව කළ, එය ම ධර්මය කොට සැලකූ අන්‍යාගමික තාපසවරු සිටියහ.

බ්‍රාහ්මණ ජාතික තිස්ස නම් ශාබාහාරී තාපසයෙක් තාපස පිරිස් පිරිවරා ගෙන මාංශාහාර වලට ත්, ඒවා අනුභව කරන උදවියට ත් නින්දා කරමින් සිටියේ ය. ඔහු විසින් මාංශාහාර අනුභව කරන උදවිය පිළිකුල් කරන ලද්දේ "පිළීගඳ" අනුභව කරන්නන් වශයෙන් සැලකීමෙනි.

එනිසා ම ඔවුන් ප්‍රසිද්ධියට පත් වූයේ "ආමගන්ධ" තවුසන් නමින් ය.

දිනක් ඔහු බලා සිටිය දී ම කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලිහිණි මස් සහිත ඇල්හාලේ බතක් දානය වෙනුවෙන් ලැබ, එය වැළඳූ සේක.

එය දුටු ආමගන්ධ තවුසා ඇසූ ප්‍රශ්නය ත්, කාශ්‍යප බුදු රජුන් වදාළ පිළිතුරුත් ය එම දෙසුමේ සඳහන් වන්නේ.

අනාගතයේ පහළ වන මෛත්‍රී බුදුරජාණන් වහන්සේ තුළින් ශාඛාහාරී බුදු කෙනෙකු යමෙක් බලාපොරොත්තු වන්නේ නම් එය සිහිනයකි. සියලුම බුදුරජාණන් වහන්සේලා ගේ ස්වභාවය එක ම ආකාරය වේ. බුදු කෙනෙක් තවත් බුදුවරයෙකු ගේ ස්වභාවයෙන් කිසිසේත් ම වෙනස් නොවේ. එනිසා ම උන්වහන්සේලා "අසමසම" වන සේක.

## ආමගන්ධ සූත්‍රය

241. **තිස්ස බමුණු :**

මෙනේරි, අමු ඇට, තල ගුලි, කොළ, දළු, අල, මුල්, පළතුරු ආදී දැහැමින් ලැබෙන දේ වළඳන, දැහැමින් සැනසෙන උදවිය, කාමය නො පතන බැවින් බොරු නො කියති.

242. එහෙත් රසවත් ව පිසින ලද, ඇල් හාලේ බතින් යුතු දනක් කෙනෙක් පූජා කළ විට, කාශ්‍යප බුදු සමිඳුනි, ඔහු වළඳන්නේ පිළීගඳ නො වේද?

243. ඔබ වහන්සේ කලින් පැවසුවේ "පිළීගඳ තමාට කැප

නැති බව" ය. එහෙත් බ්‍රහ්මබන්ධූනි, දැන් වනාහී ඔබ වහන්සේ මනාව පිසින ලද ලිහිණි මස් සමග ඇල් හාලේ බත් වළඳති. කාශ්‍යප සම්බුදුනි, "පිළීගඳ" වශයෙන් ඔබ වහන්සේ අදහස් කළේ කුමක් ද?

244. **(කාශ්‍යප බුදුරජාණෝ)**

ප්‍රාණීන් ඝාතනය කිරීම, වධ දීම, අතපය සිඳලීම, සතුන් සිරකොට තැබීම, අන් සතු දේ සොරකම් කිරීම, බොරුවෙන් රැවටීම, වංචා කිරීම, ක්‍රෝධයෙන් කල් ගෙවීම, අනුන් ගේ භාර්‍යාවන් ඇසුරු කිරීම යන මේවාට ය 'පිළීගඳ' කියන්නේ. මාංශාහාරය නොවේ.

245. කාම සැපයෙහි මුළා වූ, කම්රසයෙහි ගිජු වූ, අකුසල් සමඟ එක් වූ, මෙ ලොව පරලොව නො පිළිගන්නා, පින් පව් නො පිළිගන්නා කෙනෙක් වේ ද, මෙය යි පිළීගඳ. මාංශාහාරය නොවේ.

246. යමෙක් නපුරු සිත් ඇතිව, කුරිරු ගති ඇතිව, කපටිව සිටිත් ද, මිතුරන්ට සතුරු වෙත් ද, කරුණා රහිත වෙත් ද, අතිමානයෙන් වසත් ද, මෙය යි පිළීගඳ. මාංශාහාරය නොවේ.

247. ක්‍රෝධය, මදය, දැඩි බව, එකටෙක කිරීම, මායාව, අනුන්ට ඊර්ෂ්‍යා කිරීම, පුරසාරම් දෙඩීම, අතිමානයෙන් සිටීම, දුදනන් සමඟ ඇසුර වේ ද, මේවා ය පිළීගඳ. මාංශාහාරය නොවේ.

248. නරක ගතිගුණ ඇති, ණය ගත් පසු ආපසු නො ගෙවන, ධාර්මික වේශයෙන් කූට ගණුදෙනු කරන,

අධම මිනිස්සු බොහෝ පව් රැස් කරත්. මේවා ය පිළීගඳ. මාංශාහාරය නොවේ.

249. සතුන් කෙරෙහි කරුණාවක් නොමැති, අනුන් සතු දේ බලෙන් පැහැර ගන්නා වූ, අනුන්ට වධහිංසා කරන, දුස්සීල, කුරිරු නපුරු බස් ඇති, දයාරහිත වූ යමෙක් වේද මෙය යි 'පිළීගඳ'. මාංශාහාරය නොවේ.

250. පංච කාමයන් කෙරෙහි ගිජු වී, විරුද්ධවාදීන් ඝාතනය කරන, නිති පව් කරන මේ උදවිය අඳුරට ම වැටෙත්. ඔලුව යටිකුරු කොට නිරයට ම ඇද වැටෙත්. මෙය යි 'පිළීගඳ'. මාංශාහාරය නොවේ.

251. මාළු - මස් කිසිදෙයක් නො වළඳින, නිර්වස්ත්‍රව තපස් රකින, හිස ද මුඩු කරන, ජටා මඩුළු ද දරන, ගෝන සම් දරන, අළු තවරාගෙන සිටින, ගිනි දෙවියන් පුදන, යාගහෝම කරන, මන්තර මතුරන, ඍතු ගුණ සොයන කවරෙකු නමුත්, සැකයෙන් එතෙර නො වුන කෙනා මේ තුළින් නම් කිසිදා පිරිසිදු නො වෙත්.

252. ඉඳුරන් රැකගෙන, සංවර වූ, ඒ ඉඳුරන් ගේ යථා ස්වභාවය අවබෝධ කොට ගෙන, සද්ධර්මය තුළ ම සිටිනා, අවංක වූ, මෘදු වූ, කෙලෙස් දුරු කළ හැම දුක් නසා දැමූ මුනිවරු අසන, දකින, ආඝ්‍රාණය කරන, රස විඳින, පහස ලබන කිසිවකට නො ඇලෙති.

*(සුත්ත නිපාතය - ආමගන්ධ සූත්‍රය)*

41. ප්‍රශ්නය :

**එසේ නම් දේව භක්තිකයන් ගේ ශාඛාහාර අනුභවය**

වැඩකට නැති දෙයක් ද?

41. පිළිතුර :

මම එසේ නො කියමි. දෙවියන් ගේ ඇල්ම බැල්ම උපකාරය බලාපොරොත්තු වන දේව භක්තිකයා ශාඛාහාර අනුභව කිරීමෙහි එක්තරා සාධාරණ බවක් පෙනේ.

එනම් එම අද්භූත බලවේග වලින් පවා ඔවුන්ට උපදෙස් ලැබෙන්නේ ශාඛාහාර අනුභව කරන ලෙස ය. නොයෙකුත් දෙවිවරුන් ගේ නාමයෙන් එම බලවේගයන් හඳුන්වා ගන්නා නමුත් ඉතා ම පැහැදිලිව පෙනෙන්නේ ඔවුන් එක්තරා භූත කොටසකට අයත් වන බව යි. ඇතැම් විට එම බලවේගයන් වනාහී තමන් ගේ ම මියගිය ඥාතිවරුන් ය.

ඔවුහු මිනිසුන් ගේ සිරුරු වලට බැල්ම හෙලති. ආවේශ වෙති. මිනිසුන්ට උදව් කරති. එය මහත් ආශ්චර්යයක් වශයෙන් පිළිගන්නා මිනිස්සු එම භූතයින් ගේ උපකාරවලට රැවටෙති. ඉන්පසු මානසිකව එම භූතයින්ට යටත් වෙති. ඔවුන් ගේ ඇල්ම බැල්ම අපේක්ෂාවෙන් තවදුරටත් පේවී සිටිති.

ශාඛාහාර අනුභවය ව්‍රතයක් බවට පත් වන්නේ තමනුත් නො දැනීම ඇතිවන එක්තරා භය පක්ෂපාත කමක් නිසා ය. යම්හෙයකින් තමන් අනුභව කරන ආහාර වලට යාන්තමින් හෝ පිළිහුඬු මිශ්‍ර වූවොත් දෙවියන් ගේ උදහසට ලක් වේ යයි බියක් ඔහු තුළ ඇති වේ. ඇතැම් විට කිළිකුණු වලට හසුවෙතැ'යි යන බියෙන් මළ ගෙවල් වල ද නො යති. මළ ගෙදරකින් ආහාර ද අනුභව නො කරති.

එවිට අර භූත බලවේගය මොහු ගේ ඒ මානසිකත්වය හඳුනාගෙන එයින් අයුතු ප්‍රයෝජන ගනී. එම භය පක්ෂපාතකම දිගට ම පවත්වා ගැනීම පිණිස එළවලු ආහාර පමණක් ගැනීමට නියම කරයි. එම නියමයට යටත් වන පුද්ගලයා ඉන්පසුව සිටින්නේ භය පක්ෂපාත වූ මානසික තත්වයකිනි.

මේ මානසිකත්වය යම් කෙනෙකුට ඇති වූ විට ඔහු ස්වාධීන පුද්ගලයෙක් නොවේ. බාහිර බලවේගයක අවශ්‍යතාවන්ට හසු වූ කෙනෙකි. මේ තත්වයට ගම්බද පළාත්වල ඉතාමත් අරුත්බර වචනයක් භාවිත කරනු ලැබේ. එය හඳුන්වන්නේ 'කැඹුරුම' කියා ය. කැඹුරුමක් යනු කෙනෙක් තවත් කෙනෙකු ගේ ග්‍රහණයට හසු වී ඔහුට දාසයෙකු සේ ආවතේව කිරීම යි.

මෙතැන දී සිදුවෙන්නේ ද එය ම ය. එනම් භූත බලවේගයේ ග්‍රහණයට ඔහු හසුවීම යි. එබඳු කෙනෙකු යම් හෙයකින් කරවල ස්වල්පයක්වත් අනුභව කළහොත් නොයෙකුත් කරදර හටගනී. රාත්‍රී නින්ද නො යයි. දේව කෝපයට භාජනය වූයේ යැයි කියනු ලැබේ.

මේ තුළින් අපට එක දෙයක් පැහැදිලිව තේරුම් ගත හැකිය. එනම් මෙලෙස දෙවිවරු වශයෙන් පෙනී සිටින භූත පිරිස් සියල්ලෝ ම සම්මා දිට්ඨියවත් නැති පෘතග්ජන උදවිය බව යි. එබඳු අයට මොනතරම් යටහත් පහත් වී, ජේ වී, ගැති වී සිටිය ද සුළු අතපසු වීමකින් පවා කෝප වී දඬුවම් පමුණුවති. මෙවැනි මානසිකත්වයකට බැඳී ගිය පසු ඒ තැනැත්තාට නිදහසක් නම් නැත.

ඒ බලවේගයන් ගෙන් තමා හට උදව් ලැබෙන්නේ තමා එම බලවේගයන්ට කඹුරන තාක් ය. නොයෙක්

පළතුරු පුද පූජාවන් ගෙන් ද සිදුවන්නේ එවැනි දෙයකි.

ධර්මය තුළින් පැහැදිලිව පෙනෙන මතය නම් නියමාකාර ලෙස අවබෝධයකින් යුක්තව තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයා හට එවැනි තත්වයන්ට පත්වීමට අවශ්‍ය නැති බව යි. එමෙන් ම තමා රැස් කරන පින් දෙවියන්ට අනුමෝදන් කොට මෙත් සිත් වඩා ඉතා යහපතක් උදාකරගත හැකිය.

බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ට මෙසේ වදාළ සේක. "පින්වත් මහණෙනි, මුල, මැද, අග පිරිසිදු වූ, අර්ථ සහිත වූ, පැහැදිලි වචන වලින් යුතු වූ, ඒ නිවන් මග නම් වූ උතුම් ධර්මය දේශනා කරන්න. දෙවි මිනිසුන්ට හිතසුව පිණිස, ලෝකානුකම්පාවෙන් චාරිකාවෙහි වඩින්න" කියා ය. එසේ නම් දෙවියන්ට ත් මිනිසුන්ට ත් හිත සුව පිණිස තිබෙන්නේ එළවළු ආහාර නොව තථාගත ශ්‍රී සද්ධර්මය යි.

42. ප්‍රශ්නය :

**ඔබ වහන්සේ පවසන්නේ දේව උපකාරය ලැබීම පිණිස මාංශාහාර අනුභවය බාධාවක් නැති බව ද?**

42. පිළිතුර :

පින්වත, මාංශාහාර අනුභව කළ ද නො කළ ද, ඒ ගැන දෙවියන්ට නම් කිසිදු ගැටළුවක් නැත.

දේව උපකාරය පිණිස අවශ්‍ය වන්නේ කුමක් දැ'යි තේරුම් ගත හැකි රමණීය කථා ප්‍රවෘත්තියක් සංයුත්ත නිකායේ සක්ක සංයුත්තයේ සඳහන් වේ.

එනම් දිනක් සක් දෙවිඳු පෘථිවිය දිසාවට ඇඳිලි බැඳ නමස්කාර කළේ ය. එවිට මාතලී දිව්‍ය පුත්‍රයා සක්දෙවිඳු ගෙන් මෙසේ විමසීය.

"වේද හදාරණ සියලු දෙනා ත්, පෘථිවි වාසීනුත්, රජ දරුවෝ ත්, සිව්වරම් දෙව් මහරජුහු ත්, යශස්වී දෙවිවරු ත් ඔබට වන්දනා කරත්. එසේ තිබිය දී ශක්‍ර දේවේන්ද්‍රය, එබඳු ඔබ ඔය වඳිනු ලබන්නේ කවර කෙනෙකුට ද?"

එවිට සක් දෙවිඳු මෙසේ පැවසීය.

"පින්වත් මාතලී, වේද හදාරන සියලු දෙනා ත්, පෘථිවි වාසීනුත්, රජදරුවෝ ත්, සිව්වරම් දෙව්මහ රජුහු ත්, යශස්වී දෙවිවරු ත් මා හට වන්දනා කරන නමුත්, මම් ද සීලවන්ත වූ, බොහෝ සමාධිමත් සිත් ඇති, පිරිසිදු බ්‍රහ්මචාරී ජීවිත ගත කරන, යහපත් ජීවිත ඇති පැවිදි උතුමන්ට නමස්කාර කරමි.

එමෙන් ම ගිහි ගෙදර ගත කරමින්, පින් දහම් කරන, සිල්වත් වූ ධාර්මිකව අඹු දරුවන් ව පෝෂණය කරන තිසරණයෙහි පිහිටි යම් උපාසකවරු සිටිත් ද, ඔවුන්ට ද මම නමස්කාර කරමි.

*(සංයුත්ත නිකාය - සක්ක නමස්සන සූත්‍රය)*

දැන් තිබෙන දේව ඇදහිලි, කැඹුරුම් ක්‍රමයක් බව පෙනෙන්නේ දෙවියන් පිළිබඳ මෙවැනි තොරතුරු දැනගන්නා විට ය.

43. ප්‍රශ්නය :

**ඔබ වහන්සේ කියන්නේ එසේ නො කළ යුතු බව ද?**

43. පිළිතුර :

පින්වත, එසේ කිරීම හෝ නො කිරීම හෝ කළ යුත්තේ නුවණින් සලකා බලා ය. ඔබ දේව භක්තිකයෙක් නම් මා කියූ පමණින් එළවළු ආහාර ප්‍රතිපත්තිය අත්හළ යුතු නැත. එයට හේතුව එම බලවේග විසින් ඔබව යටත් කොට සිටින නිසා ය. මා පැවසුවේ අපට තේරුම් ගත හැකි සත්‍ය තත්වය යි.

යමෙක් එවැනි කැඹුරුමකට හසු වී අද්භූත බලවේගයකට යටත් වී සිටිත් නම්, ඒ තැනැත්තා ශාඛාහාර අනුභව කිරීමෙන් අර බලවේග සතුටට පත් කරවයි නම්, එබඳු අය තවදුරටත් ශාඛාහාර ම අනුභව කිරීම සුදුසු යැයි සිතමි. යම් හෙයකින් මාංශාහාර අනුභව කළහොත් එම බලවේග උදහස් වී ඔවුන්ව පීඩාවට පත් කරනු ඇත.

මෙයින් තවත් දෙයක් තේරුම් ගත හැකිය. එළවළුයි බතුයි අනුභව කිරීමට නියම කරන්නේ සතුන් කෙරෙහි කරුණාවෙන් නම්, දේව බලවේග යැයි කියා ගන්නා එම භූත බලවේග මුලින් ම කරුණාව දැක්විය යුත්තේ තමන් ආකර්ශනය හෙළන බැතිමතා කෙරෙහි ය.

එහෙත් සුලු අතපසුවීමකින් උදහස් වන එම භූත බලවේග තම බැතිමතාව දුකට පීඩාවට පත් කරවන්නේ එනම්, එතැන තිබෙන සත්ව කරුණාව නොව තනිකර ම අර අහිංසක පුද්ගලයාව යටත් කොට පවත්වා ගැනීම යි. මෙය ඉතාම සානුකම්පිත තත්වයකි.

44. ප්‍රශ්නය :

ඔබ වහන්සේ ගේ ඔය පිළිතුර වලින් පසු ශාකාහාර

**ගන්නා උදවිය යළිත් මාංශාහාර ගන්නට පටන් ගතහොත් එයින් පව් සිදුවන්නේ කාට ද?**

44. පිළිතුර :

අහෝ! පින්වත, ඔබ යළි යළිත් කැරකි කැරකී එන්නේ කලින් සිටි මිත්‍යා දෘෂ්ඨියට ම ය. එනම් මාංශාහාරය ත් සත්ව ඝාතනය ත් සමාන කොට සැලකීමට ය.

ඉදින් යම් කෙනෙක් නිර්මාංශීව සිට පසුව මාංශාහාරය අනුභවයට පෙළඹේ නම් ඔහු නිර්මාංශී වී තිබෙන්නේ හුදෙක් රුචිකත්වයෙන් වත් නොවේ.

මෙම පිළිතුරු වලින් මා අදහස් කරන්නේ ඔබව මාංශහාර භක්ෂකයෙක් කරවීම නොවේ. කිසිසේත් ම මා තුළ එවැනි අදහසක් නැත.

කැමැති නම් සියළු සත්වයෝ නිර්මාංශී වෙත්වා! ප්‍රණීත වූ එළවළු ආහාරයෙන් සතුටු වෙත්වා! එළවළු ආහාර සැබැවින් ම සුවඳ යි. ප්‍රියජනක යි. නමුත් ඔබ ශාඛාහාර අනුභවය බුදු දහම හැටියට ත්, ගුණයක් හැටියට ත්, සීලයක් හැටියට ත් ගත් මතය වරදක් බව පමණ යි මා පෙන්නා දෙන්නේ. එසේ නැතුව එළවළු ආහාර අනුභවය කෙරෙහි මගේ කිසිදු විරෝධත්වයක් නැත.

45. ප්‍රශ්නය :

**මාංශාහාර පිණිස සතුන් විකිණීම හෝ මැරීම හෝ මැරවීම කැප දෙයක් ද?**

45. පිළිතුර :

කිසිසේත් ම කැප නැත. එය සම්පූර්ණයෙන් ම වැරදි

ය. එය පාපයකි.

සමහර නිවෙස් වල එළුවන්, ගවයන් ආදී සතුන් ඇති කොට මසට විකුණති. එයින් ප්‍රාණඝාතයට කෙලින් ම හවුල් වේ. එය පාපයකි.

සමහරු කුකුල් ගොවිපලක් දමා ගෙන එම සතුන් මසට විකුණති. එයින් ද කෙළින් ම ප්‍රාණඝාතයට හවුල් වේ. එය ද පාපයකි.

ඌරන් ඇති කොට මසට විකිණීමෙන් ද කෙළින් ම ප්‍රාණඝාත අකුසලයට හවුල් වේ. එය ද පාපයකි.

පින් පව් නො පිළිගන්නා දේව මැවුම්කාර ආගම් වල බලපෑමෙන් බෞද්ධ නිවෙස් වල මස් පිණිස සතුන් බෝ කිරීමට පෙළඹවීමක් වර්තමානයේ දක්නට ලැබේ. මෙය භයානක තත්වයකි. එවැනි දෙයකට කිසිසේත් ම හවුල් නො විය යුතුය.

තම නිවෙස් වල ම ටැංකි තනවා මාළුන්, ඉස්සන්, ආදී සතුන් වගා කොට, තමන් ම ඒ සතුන් දඩයම් කොට අනුභව කරවීමට අන්‍යාගමික කුමන්ත්‍රණ වලින් බෞද්ධ ජනතාව පොළඹවනු දක්නට ලැබේ. එවැනි අකුසල කර්මයන්ට කිසිසේත් හවුල් නො විය යුතු ය.

බෞද්ධ ජනතාව ගේ සිල්වත් ජීවිත ගැන අන්‍යාගමිකයන් පසුවන්නේ බලවත් වූ ඊර්ෂ්‍යාවකිනි. එම නිසා ඔවුන් ගේ කුමන්ත්‍රණ වලට හසු නො වීමට සියළු බෞද්ධයන් කල්පනාකාරී විය යුතුය.

මෙතැන දී තව දෙයක් කිව යුතුය. අප රටේ ඇතැම් භික්ෂූන් වහන්සේලා ත් ගිහි පින්වතුනුත් මස් මාංශ අනුභව

කරන උදවියට ඉතා ලාමක පහත් වචන වලින් නින්දා කරනු දකින්නට ලැබේ. එය ද පාපයකි. එමෙන් ම අප දන්නා තරමින් බොහෝ බෞද්ධ පවුල් වල උදවිය ද ධීවර ජනතාව අතර සිටිති. නිර්මාංශ භක්තිකයන් පවසන ආකාරයට ගෙදර ගෘහමූලිකයා දියඹට ගිය විට ඔහු ගේ බිරිඳ ඇතුළු දරුවන්ට ද ප්‍රාණඝාත අකුසලය සිදු වේ. එවැනි ආකාරයෙන් කරුණු දිගින් දිගට පවසන්නට යෑමෙන් සිදු වී තිබෙන්නේ ධීවර පවුල් කෙමෙන් කෙමෙන් බුදු දහමෙන් ඈත් වීම යි. ඔවුන් අන්‍යාගමිකයන් ගේ ග්‍රහණයට හසුවීම යි. මුහුදුබඩ පළාත් වල ජනතාව බුදු දහම අත්හැරීමට නිර්මාංශ භක්තිකයන් ගේ විලාපය ප්‍රධාන හේතුවක්ව තිබේ. දැන්වත් නුවණින් කල්පනා කොට යමක් විචාරයට ලක් කිරීම මැනවි.

46. ප්‍රශ්නය :

**සමහරුන් පවසන්නේ හරකුන් මරන්නේ මුස්ලිම් උදවිය බව ත්, ඒ මසින් වැඩි කොටසක් අනුභව කරන්නේ බෞද්ධයන් බව ත් ය. එය සත්‍යයක් ද?**

46. පිළිතුර :

එය සම්පූර්ණයෙන් ම අසත්‍යයකි. ඔවුන් එම චෝදනාව නගන්නේ බෞද්ධ ජනතාව ගේ අභිමානය නැති කොට ඔවුන්ට නින්දා අපහාස කිරීමට ය. මා දන්නා තරමින් බොහෝ බෞද්ධයෝ හරක් මස් අනුභවයෙන් වැළකී සිටිති. සියළුම බෞද්ධයෝ "තහනම් මසක්" වශයෙන් සලකා හරක් මස් අනුභවයෙන් වැළකී සිටිය යුතුම ය.

ගව ඝාතනය නතර කරලීමට සියලු දෙනා ම

එක්සත්ව, එක්සිත්ව කටයුතු කළ යුතුය.

ගවයන් මැරීම ගැන දෙවියන් පවා මහත් හිත් වේදනාවකින් පසුවන බවට සඳහන් බුද්ධ දේශනාවක් සුත්ත නිපාතයේ දක්නට ලැබේ.

බුදුරජාණන් වහන්සේ පහළ වූයේ භාරතීය සමාජය තුළ ලක්ෂ ගණන් අහිංසක සතුන් මරා යාග කරවන යුගයක දී ය. ඔවුන් එලෙසින් යාග කරන ලද්දේ ලෝක නිර්මාපක දෙවියන්ව සතුටු කළ හැක්කේ සතුන් මරා ගින්නේ ලා පිළිස්සීමෙන් නැගෙන පුළුටු ගඳ එම දෙවියන්ට පූජා කිරීමෙන් යැයි සිතා සිටි නිසා ය. යම් කෙනෙක් සතුන් ගේ මස් පුළුස්සා නැගෙන පුළුටු ගඳ ආඝ්‍රාණය කොට සතුටු වෙයි නම් හේ වනාහී කිසිසේත් ම දෙවියෙක් විය නො හැක. නිසැකව ම ඔහු මාරයා හෝ වෙනත් බලගතු යක්ෂයෙක් විය යුතුය.

බයිබලයේ පවා දක්වෙන්නේ ඒ ආකාරයෙන් සතුන් මරා යාග කරන පුළුටු දුම් දීමක් ගැන ය.

"දෙවියන් වහන්සේට ශාන්ති පූජාවක් පිණිස, ඒ තැනැත්තා ගව රැළෙන් පිරිමි ගවයෙකු හෝ ගැහැණු ගවයෙකු හෝ පූජා කරන්නේ නම්, දෙවියන් වහන්සේ ඉදිරියේ පූජා කළ යුත්තේ කැලැල් රහිත ගවයෙක් ම ය.

පළමු කොට තමන් ගේ අත තමන් පූජා කරන ගවයා ගේ හිස පිට තබා සම්මුඛ වීමේ කූඩාරමේ දොරකඩ දී ඌ මැරිය යුතුය. ආරොන් ගේ පුත්‍රයන් වූ පූජකයෝ පූජාසනය මත හාත්පසින් එම ලේ ඉසිත්වා! එම ගවයා ගේ අතුණු වැසී තිබෙන තෙල් ද, වකුගඩු දෙක ද, ඊට පිටින් තුනටිය ළඟ තිබෙන තෙල් ද, වකුගඩු සමඟ වූ අක්මාව පිට

තිබෙන දළ ද වෙන් කොට දෙවියන් වහන්සේට ශාන්ති පූජා යාගයෙන් කළ පූජාවක් වශයෙන් ඔප්පු කළ යුතුය. ආරොන් ගේ පුත්‍රයෝ පූජාසනය මත වූ ගින්නේ දර පිට තිබෙන දවන පූජාව මත එම හරක් මස දවත්වා! එය දෙවියන් වහන්සේට ගින්නෙන් කළ මිහිරි සුවඳ පූජාවක් ය."

*(බයිබලය - ලෙවී කතාව - ශාන්ති පූජා)*

එම ලෙවී කතාවට අයත් පූජා අණ පණත් සියල්ලේ ම තිබෙන්නේ අසරණ සතුන් මැරිය යුතු ආකාරය ත් ඒ සතුන් ගේ මස් පුළුස්සා එම පුළුටු දීමෙන් ඔවුන් ගේ දෙවියන් වහන්සේට ආඝ්‍රාණය කරවා සතුටු කරවිය යුතු ආකාරය ගැන ත් ය.

බුද්ධ කාලීන භාරතීය සමාජයේ තිබුනේ ත් මේ ක්‍රමය ම ය. බුදුරජාණන් වහන්සේ මේ නින්දිත වැඩ පිළිවෙලට විරුද්ධව නැගී සිටි සේක. වරක් කොසොල් රජතුමා දහස් ගණනක සතුන් මරා දමන යාගයක් කරවන්නට සූදානම් වූ මොහොතේ දී මාළිගාවට වැඩම කොට සත්‍යය පහදා දී ඒ සියලු සතුන් මරණයෙන් බේරා ගත් සේක.

හින්දු ආගමේ සිරිත ඔවුන් කුමක් හෝ අදහන්නට පටන් ගැනීම යි. වර්තමානයේ බොහෝ හින්දු කෝවිල් වල තනවා තියෙන්නේ ගවයන් ගේ, මීයන් ගේ සහ වඳුරන් ගේ රූපයන් ය. ඒවා දේවත්වයෙන් අදහනු ලැබේ. ගවයාව පූජනීය කරගන්නට ඇත්තේ බුදුරජාණන් වහන්සේ ගව ඝාතනය ගැන වදාළ මෙම දේශනයෙන් පසුව විය යුතු ය.

*310. ගාථාව :*

බමුණන් විසින් මුළා කරවන ලද රජවරු දවන යාගයට පූජා පිණිස නොයෙක් සිය දහස් ගණන් ගවයන් මරා දැමූහ.

*311. ගාථාව :*

එළුවන් මෙන් කීකරු වූ, කළ පුරවා කිරි දුන්, අප ගේ කිරි දෙන්නු අඟින් හෝ පයින් හෝ කිසිවෙකුට ත් හිංසා නො කරත්. එහෙත් රජතුමා ඒ ගවයින් ව අඟින් ම ඇදගෙන අවුදින් ආයුධයෙන් පහර දී මරණයට පත් කරවීය.

*312. ගාථාව :*

මෙය දුටු දෙවියෝ ද, මහ බඹුහු ද, ඉන්ද්‍ර ද, අසුර හා රාක්ෂසයෝ ද 'අහෝ! මෙවැනි ගවයින් මත ආයුධ හෙළීමෙන් අධර්මය ඉපදුනා!' යයි හඬා වැටුනාහ.

*313. ගාථාව :*

එකල මෙහි තිබුනේ රෝග තුනක් පමණි. එනම් ආශාව ත්, කුසගින්න ත්, ජරාජීර්ණ වීම ත් පමණි. එහෙත් මේ ගව ඝාතනය නිසා රෝග අනූ අටක් ඇති විය.

*314. ගාථාව :*

පෙර කාලයෙහි ගව ඝාතනය දඬුවම් ලබන අධර්මයකි. එහෙත් යාග කරන මේ උදවිය අහිංසක ගව දෙනුන්ට පහර දී මරා දමමින් ධර්මය ම යටට හෙළා දමත්.

***(සුත්ත නිපාතය - බ්‍රාහ්මණ ධම්මික සූත්‍රය)***

47. ප්‍රශ්නය :

**දැන් හින්දු මිනිසුන් අතර මස් මාංශ පරිභෝජනයක් නැති ද?**

47. පිළිතුර :

මොකද නැත්තෙ? හින්දූන් ගේ ශුද්ධ නගරය හැටියට සලකන ඍෂිකේශ්, උත්තර්කාශී ආදී නගරවල මස් කඩ තිබෙනු දැක මම පුදුමයට පත් වූයෙමි. නමුත් ඔවුන් තුළ හරක් මස් අනුභවයක් නැතැ'යි කිය හැකි ය.

සාමාන්‍යයෙන් හින්දු සාධුවරු සියලු දෙනා ම පාහේ ශුද්ධ ශාඛාහාරීව කල් ගෙවත්. ඇතැම් දුර්ගා පූජා වල දී ද, කාලී පූජාවන් වල දී ද එළුවන් බිල්ලට දීම දකින්නට ලැබෙන සාමාන්‍ය දෙයකි. විශේෂයෙන් ම විෂ්ණු භක්තිකයන් බොහෝ දෙනෙක් ශාඛාහාරීව සිටිති. බොහෝ ක්‍රිෂ්ණු භක්තිකයන් ද ශාඛ ආහාරයෙන් කල් යවත්.

කෙසේ වෙතත් ඔවුන් තමන් ගේ ධර්මය තුළ අනුභව කරන ආහාර වර්ග කොටස් තුනකට බෙදා දක්වා තිබේ.

එනම් රාජසික්, තාමසික්, සාත්වික් වශයෙනි. රාජසික් ආහාර වශයෙන් ගැනෙන්නේ එම ආහාර අනුභවයෙන් රාගාදී කෙලෙස් හට ගැනෙන හෙයින් ය. එනිසා එම ආහාර අනුභවයෙන් වැළකිය යුතු ය. ඒ ආහාර නම් මාළු, කරවල, මස් මාංශ ආදිය යි.

ඊළඟට ඔවුන් පවසන්නේ තාමසික් ආහාර අනුභවයෙන් අවිද්‍යාව, මෝඩකම් ආදී කෙලෙස් හට ගැනෙන බව යි. එමනිසා තාමසික් ආහාර අනුභවයෙන් වැළකිය යුතුය. එනම් සුදුළූණු සහ රතුළූණු ය.

අනුභව කළ යුත්තේ සාත්වික් ආහාරයන් ය. එම ආහාර අනුභවයෙන් මෛත්‍රී, කරුණා, ප්‍රඥා ආදී ගුණධර්ම

වර්ධනය වේ. එම ආහාර නම් එළවළු, පළතුරු, කිරි, ඉරිඟු, බාර්ලි, බත් වැනි ආහාරයන් ය.

මේ ආකාරයෙන් ආහාර පාන ආදියෙන් සත්වයන් පිරිසිදු වන්නේ නම් ඉන්දියාවේ සිටින සියලු සාධුවරුන්ට කෙලෙස් නැත. එහෙත් සත්‍ය තත්වය නම් මීට හාත්පසින් ම වෙනස් ය. ඔවුන් තුළ තිබෙන්නේ අන්ධ භක්තියක් පමණි. එසේ නො වන්නේ නම් 'සති පූජාව' වැනි අමානුෂික පූජාවන්, කුල ගෝත්‍ර භේද ආදිය තිබෙන්නේ කෙසේද?

ආගම් නාමයෙන් සිදු වූ මනුෂ්‍ය ඝාතන වලට හසු නො වූයේ බුදු දහම පමණි. බොහෝ ශිව භක්තිකයන් අතින් බෞද්ධ භික්ෂූන් වහන්සේලා මරණයට පත් වී ඇත. බෞද්ධ සිද්ධස්ථානයන් කඩා බිඳ දමා විනාශ කරන ලද්දේ ද ශිව භක්තියකයන් විසිනි. ඉන්දියාවේ බෞද්ධයන්ව සමූලඝාතනය කිරීමට මුස්ලිම් ජනතාව පොළොඹවන ලද්දේ ද එළවළු ආහාර ගන්නා හින්දූන් විසිනි.

මා දන්න පරිදි සාමාන්‍යයෙන් නගරාසන්නයේ තිබෙන ප්‍රසිද්ධ ආරාම වල සිටින සාධුවරුන් හැර අනිත් බොහෝ සාධුවරු අධික ලෙස ගංජා වලට ඇබ්බැහි වී සිටිති. ඔවුන් ගෙන් ඒ ගැන විමසූ විට ඔවුන් පවසා සිටියේ 'ගංජා' ගස අයිති 'ශිව' දෙවියන්ට ලු! 'කන්නට ඕනෑ වූ විට කබරගොයාව ත් තලගොයා කරගන්නවා' කියන්නේ මෙවැනි කතාවලට ය.

48. ප්‍රශ්නය :

**දැන් සිංහලෙන් ම ලියූ 'හලාල් මස්' දැන්වීම් මගින් මස් විකුණනු දක්නට ලැබේ. මෙහි තේරුම කුමක් ද?**

48. පිළිතුර :

සිංහලෙන් 'හලාල් මස්' බෝඩ් ගැසීම ඉතා මෑතක දී මේ රටේ දි ඇති වූ යම්කිසි විශේෂ දෙයකි. මෙහි යටි අදහස තවම අපට නො තේරේ. පසුගිය කාලයක පාර්ලිමේන්තුව තුළ 'හලාල් මස්' පණතක් සම්මත කරවා ගැනීම පිණිස බුද්ධ ශාසන අමාත්‍යවරයෙකුව යොදවා ගන්නට ගත් උත්සාහයක් ගැන පුවත්පත් වල පළවිය. මේ 'හලාල් මස්' පිටුපස තිබෙන කුමන්ත්‍රණයේ ස්වරූපය තවම අපට සිතා ගත නො හැකිය.

49. ප්‍රශ්නය :

'හලාල් මස්' යනු මොනවා ද?

49. පිළිතුර :

ඉස්ලාම් ආගමේ අනුමත කොට තිබෙන්නේ මරණ සත්වයාව පළමුව දෙවියන්ට කැප කළ යුතු ය. ඉන්පසු එම සතා ගේ ගෙල පිහියකින් බාගෙට කපා උගේ ලේ වහනය වීමෙන් මරණයට පත්වෙන්නට ඉඩ හැරිය යුතුය. ඔවුන්ට එම මස් අනුභව කරන්නට කැප වන්නේ එවිට ය. ඔවුන් විශ්වාස කරන්නේ එම මස් අනුභවයෙන් ඔවුන්ට කිසිදු පාපයක් නො වන බව යි. එම මස අත්‍යන්තයෙන් ම පිරිසිදු බව යි. 'හලාල් මස්' යනු එය යි. බයිබලයේ ද මාංශ අනුභවය සම්බන්ධයෙන් දක්වා තිබෙන්නේ ද මෙයට සමාන වූ ආකල්පයන් ය.

50. ප්‍රශ්නය :

'හලාල් මස්' අනුභවය හොඳ ය යන ආකල්පයක් බෞද්ධ ජනතාව අතර පැතිර යමින් තිබෙන්නේ ද?

50. පිළිතුර :

මුස්ලිම් භෝජන ශාලාවල ත්, මුස්ලිම් වෙළඳ සැල් වල ත් 'හලාල් මස්' දැන්වීම් සිංහලෙන් ප්‍රදර්ශනය කරවන්නේ ඒ අරමුණින් ය. කලක් යන විට 'හලාල් මස්' වනාහී ඉතා පිරිසිදු වූ ත්, ආහාරයට සුදුසු වූ ත් මසක් වශයෙන් බෞද්ධ ජනතාව අතර පිළිගැනීමක් ඇති කරවීම ඔවුන් ගේ බලාපොරොත්තුව යි. එවිට කෙමෙන් කෙමෙන් බෞද්ධ ජනතාව 'හලාල් මස්' අනුභවයට පෙළඹෙනු ඇත. කලක් යන විට සිංහලයන්ට තමන් මුස්ලිම් බවට පත් වී අවසන් වන තුරු ත් එය සොයා ගත නො හැකි වනු ඇත.

එහෙත් බෞද්ධ ජනතාව 'හලාල් මස' දෙස බැලිය යුත්තේ මුස්ලිම් භක්තිකයන් ගේ කෝණයෙන් නොවේ. බෞද්ධ දැක්මට අනුව බලන විට 'හලාල් මස්' සොයමින් අනුභව කරන සියලු දෙනා ප්‍රාණඝාතයට හසු වීම වැළැක්විය නො හැකි ය. එයට හේතුව ඉස්ලාම් භක්තිකයන් 'සබ්භ්' පිළිවෙලට සතුන් මරන්නේ 'හලාල් මස' අනුභව කරන්නවුන් උදෙසා ය. එනිසා එම මස සොයමින් යන සියලු දෙනා ම ප්‍රාණඝාතයට හසුවෙති.

එනිසා බෞද්ධ ජනතාව සම්පූර්ණයෙන් ම 'හලාල් මස්' අනුභවයෙන් වැළකිය යුතු ය. එම මස බෞද්ධයන් හට අකැප ය.

51. ප්‍රශ්නය :

**මේ ප්‍රශ්න වලට ලැබෙන පිළිතුරු වලින් ඔබ වහන්සේ අපට පවසන්නේ නිර්මාංශභාර අනුභවය අත් හළ යුතු බව ද?**

51. පිළිතුර :

නැත. පින්වත, කිසිසේත් ම නැත. යමෙක් නිර්මාංශාහාර අනුභව කරයි නම් තවදුරටත් එය එසේ ම

වේවා! මා හැම දෙයක් ම පවසා සිටියේ නිර්මාංශහාර අනුභවය කෙනෙකු ගේ ශීලයක් වශයෙන් හෝ ගුණයක් වශයෙන් හෝ ධර්මයක් වශයෙන් හෝ අගය කළ යුතු කිසිවක් එහි නොමැති බව පැවසීමට පමණි. එය තමා හුවා දැක්වීම පිණිස හෝ අනුන් හෙලා දැක්වීම පිණිස හෝ භාවිතා නො කළ යුතු බව පමණි. රුචිකත්වය යනු ඔබට අදාළ දෙයකි. ප්‍රාණඝාතයෙන් වැළකී යහපත් මනුෂ්‍යයෙක් වශයෙන් සිටීම ඔබ ගේ ගුණධර්මයට අදාළ දෙයකි. මේ දෙක එකට පටලවා නො ගත යුතුය.

52. ප්‍රශ්නය :

**එසේ නම් කුමක් ද අප කළ යුත්තේ ?**

52. පිළිතුර :

පින්වත, දෙව්දත් පැමිණ අප ගේ බුදුරජාණන් වහන්සේ ගෙන් ඉල්ලා සිටියේ අනිවාර්ය නීති පසින් එකක් නම් ශාඛාහාර අනුභවය යි.

දේවදත්ත :

**සාධු භන්තේ, භික්ඛූ යාවජීවං මච්ඡ මංසං න ඛාදෙය්‍යුං. යො මච්ඡ මංසං ඛාදෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍යා'ති.**

"ස්වාමීනි, භික්ෂූහු දිවි තිබෙන තුරා මාළු මස් නො වළඳන්නාහු නම් ඉතා මැනවි. යමෙක් මාළු මස් වළඳයි නම් වරද ඔහු ස්පර්ශ කරන්නේ ය."

එවිට අනන්තව පැතිරුණු ප්‍රඥා ඇති, හසල බුද්ධි ප්‍රභා ඇති, මහා කාරුණික අප ගේ භාග්‍යවතුන් වහන්සේ

එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් මෙසේ වදාළ සේක.

**අලං දේවදත්ත, මයා දේවදත්ත අනුඤ්ඤාතං තිකෝටිකං පාරිසුද්ධං මච්ඡ මංසං. අදිට්ඨං, අසුතං, අපරිසංකිතන්ති.**

"දේවදත්ත, එයින් වැඩක් නැත. මවිසින් තුන් කෙළවර පිරිසිදු වූ මාළු මස් අනුමත කරන ලදී. එනම්, (තමා උදෙසා මරණ ලද බව) නො දුටු, (තමා උදෙසා මරණ ලද බව) නො ඇසූ, (තමා උදෙසා මරණ ලද බව) සැක නො කළ මාළු මස් ය."

*(චුල්ලවග්ග පාළි - සංඝභේදක්ඛන්ධකය)*

එම නිසා අප එක් කරුණක් තේරුම් ගත යුතුය. එනම් ඔබ හෝ මා හෝ ගොඩනගන ලද ධර්ම විනයක් නැත. ශාසනයක් නැත. බුද්ධ ශාසනයක් ගොඩනගන්නේ බුදුරජාණන් වහන්සේ නමක් විසිනි. ධර්මය දේශනා කරනු ලබන්නේ ත්, විනය පණවනු ලබන්නේ ත්, උන්වහන්සේ විසිනි. එහි හිමිකරුවා උන්වහන්සේ මිස ඔබ හෝ මා හෝ නොවේ. අපි වනාහී උන්වහන්සේ සරණ ගිය ශ්‍රාවකයෝ වෙමු. උන්වහන්සේ වදාරණ ලද ධර්ම විනය උපුටා දක්වමින් බුදු සසුන ලොවට හඳුන්වා දෙන ශ්‍රාවකයෝ වෙමු.

එනිසා අපට රුචි අරුචි දේවල් වාද වශයෙන් ගොඩ නගා ගෙන උන්වහන්සේ වදාළ ධර්ම විනය අවලංගු කරන්නට අපට අයිතියක් ද නැත. හැකියාවක් ද නැත. ඒ බව තේරුම් ගෙන තමන් ගන්නා ආහාර ආගම වශයෙන් පත් නො කර ගත මැනව.

බොහෝ කලක් මුළුල්ලේ බෞද්ධ සමාජයේ ඇතැම්

# නිර්මාංශ ප්‍රශ්නය

## බුද්ධිමතුන්ට විසඳා ගැනීම පිණිසයි.

පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි



වර්තමානයේ බෞද්ධ යැයි කියා ගන්නා මේ සමාජයෙහි බොහෝ ගිහි පැවිදි පින්වතුන්ගේ සාමාන්‍ය ස්වභාවය නම් ඕනෑම දෙයක් පිළිබඳව නො විමසා අවිචාරවත් ව නිගමනයන්ට බැසගැනීමයි. එනිසා ම බොහෝ දෙනෙකුට නිදහස් චින්තනයක් නැත. මධ්‍යස්ථව කරුණු විමසා බැලීමක් ද නැත. සුළු කරුණකිනුත් විවිධ අදහස් වැළඳ ගෙන එහි ම තරව බැඳී සිටීම දක්නට ලැබෙන සාමාන්‍ය ලක්ෂණය යි....

එහෙත් බෞද්ධ අප එසේ නො විය යුතුය. ඕනෑම විවාදාත්මක කරුණක් පිළිබඳව එකඑල්ලේ නිගමන වලට බැස ගෙන දෘෂ්ටිගත වීම වෙනුවට මධ්‍යස්ථව විචාරාත්මකව අධ්‍යයනය කොට නිගමනයන්ට පැමිණීමේ හැකියාව බෞද්ධ අපට තිබිය යුතු නො වේද?